කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு

**MINISTRY OF LABOUR AND FOREIGN EMPLOYMENT**



# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT 2023

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு

**Ministry of Labour and Foreign Employment**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# ஆண்டு முன்னேற்ற அறிக்கை

# Annual Performance Report

# 2023

# වැය ශීර්ෂ අංක - 193
# செலவினத் தலைப்பு - 193
# Expenditure Head - 193

*සියලු හිමිකම් ඇවිරිණි / அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை / All rights reserved*

2023 මැයි / 2024 நவம்பர் / May 2024

**ප්‍රකාශනය / வெளியீடு / Publication**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு
Ministry of Labour and Foreign Employment

7 මහළ, "මෙහෙවර පියෙස" නාරාහේන්පිට, කොළඹ 05
7 ஆவது தளம், "மெஹெவர பியெச" நாரஹேன்பிட்டிகொழும்பு-05
7th Floor, "Mehewara Piyasa", Narahenpita, Colombo 05

දුරකථනය | தொலைபேசி | Telephone : 011 2581991

**මුද්‍රණය**
ප්‍රින්ටෙක් එෂ්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම - 0112 815 816

# අන්තර්ගතය பொருளடக்கம் ஊழவெநவெ

## I කොටස


| | | | |
|---|---|---|---|
| 1. පළමු පරිච්ඡේදය | - | ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 1-12 |
| 2. දෙවන පරිච්ඡේදය | - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 13-65 |
| 3. තුන්වන පරිච්ඡේදය | - | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය | 67-82 |
| 4. හතර වන පරිච්ඡේදය | - | කාර්යසාධන දර්ශක | 83-85 |
| 5. පස් වන පරිච්ඡේදය | - | තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | 87-93 |
| 6. හය වන පරිච්ඡේදය | - | මානව සම්පත් පැතිකඩ | 95-118 |
| 7. හත් වන පරිච්ඡේදය | - | අනුකූලතා වාර්තාව | 119-125 |


## பகுதி II


| | | | |
|---|---|---|---|
| 1. அத்தியாயம் ஒன்று | - | நிறுவனம்சார் விபரம் / நடைமுறைப்படுத்தல் பற்றிய சுருக்கம் | 1-12 |
| 2. அத்தியாயம் இரண்டு | - | முன்னேற்றமும் எதிர்கால நோக்கும் | 13-65 |
| 3. அத்தியாயம் மூன்று | - | 2023 டிசெம்பர் 31 இல் முடிவடைந்த ஆண்டிற்கான ஒட்டுமொத்த நிதிச் செயலாற்றுகை | 67-82 |
| 4. அத்தியாயம் நான்கு | - | செயலாற்றுகை குறிகாட்டிகள் | 83-85 |
| 5. அத்தியாயம் ஐந்து | - | நிலையான அபிவிருத்தி இலக்குகளை அடைவதில் செயலாற்றுகை (SDGs) | 87-90 |
| 6. அத்தியாயம் ஆறு | - | மனித வள விபரங்கள் | 91-108 |
| 7. அத்தியாயம் ஏழு | - | இணக்க அறிக்கை | 109-115 |

## Section III


| | | | |
|---|---|---|---|
| 1. Chapter One | - | Institutional Profile/ Executive Summary | 1-11 |
| 2. Chapter Two | - | Progress and Future Outlook | 13-58 |
| 3. Chapter Three | - | Overall Financial Performance for the Year Ended 31 December 2023 | 59-72 |
| 4. Chapter Four | - | Performance Indicators | 73-74 |
| 5. Chapter Five | - | Performance of the Achieving Sustainable Development Goals (SDGs) | 75-78 |
| 6. Chapter Six | - | Human Resource Profile | 79-94 |
| 7. Chapter Seven | - | Compliance Report | 95-100 |

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு

Ministry of Labour and Foreign Employment

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# ஆண்டு முன்னேற்ற அறிக்கை

# Annual Performance Report

# 2023

I කොටස - සිංහල භාෂාව

பகுதி I - சிங்கள மொழி

Section I - Sinhala Language

# කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය



නව ආරක වැඩ සංස්කෘතියක් බිහි කිරීම තුලින් රටේ ආර්ථිකය ශක්තිමත් කොට, ස්ථාවරව පවත්වාගෙන යෑම සඳහා දියත් කර ඇති වැඩපිළිවෙල සාර්ථක කර ගැනීමට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන කර්යභාරයෙහි 2023 වසර තුළ දී අත්පත් කර ගත් ප්‍රගතිය හා ඉදිරි වැඩසටහන් ඇතුළත් වන මෙම ප්‍රකාශනයට මාගේ පණිවිඩය එක් කරනුයේ ඉමහත් සතුටිනි.

කම්කරු හා විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා නෛතික හා ප්‍රතිපත්තිමය රාමුව ශක්තිමත් කිරීම වෙනුවෙන්, වර්තමානයට ගැලපෙන ප්‍රතිපාදන ඇතුලත් කරමින් නව සේවා නියුක්ති පනත සකස් කිරීමේ කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතී. එමෙන්ම විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කරන අතර රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම 2023-2027, 2023.10.25 දින නිල වශයෙන් එළි දැක්වීමට හැකි වීම අමාත්‍යාංශය විසින් අත්කරගත් මහඟු ජයග්‍රහණයකි.

සමාජ ආරක්ෂණය වෙනුවෙන් නව සමාජ ආරක්ෂණ අරමුදලක් ස්ථාපනය කර සේවා යෝජකයාට අමතර වැය බරක් නොවන නව සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ඇති කිරීමට අපේක්ෂිතය. එමෙන්ම, පහළ මට්ටමේ සමාජ පිලිගැනීමක් පවතින රැකියා සඳහා ගරුත්වයක් හා යහපත් සමාජ පිළිගැනීමක් ඇති කිරීමට “ගරු සරු” වැඩසටහන හඳුන්වා දී ඇත. වර්තමාන තාරුණ්‍යය හෙට වැඩ ලොවට ගැලපෙන පුරවැසියන් බවට පත් කිරීම සඳහා "Smart Youth Club" සංකල්පය 2024 වර්ෂයේදී ආරම්භ කිරීමට අපේක්ෂිතය.

මහජනතාවට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම සඳහා ගෝලීය නව ප්‍රවණතාවයන්ට අනුගත වෙමින් කම්කරු දෙපාර්තමේන්තුවෙන් හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලබාදෙනු ලබන සේවාවන් ඩිජිටල්කරණය කිරීම හා කම්කරු ක්ෂේත්‍රයට අදාළ වන සියලුම තොරතුරු හා සේවාවන් ඒකාබද්ධ කරමින් ජාතික ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන් විසින් මෙම අමාත්‍යාංශය වෙත පවරන ලද, වාර්ෂිකව විදේශ ප්‍රේෂණ ඉහළ නංවා ගැනීමේ ඉලක්කය වෙත සාර්ථකව ළඟා වීමට හැකි විය. මෙහිදී විදෙස් ශ්‍රමික ප්‍රේෂණ ලැබීම් දිරිගැන්වීම සඳහා එතෙර රැකියාවන්හි නියුක්ත ශ්‍රී ලාංකිකයින්හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීම, විගමනික ශ්‍රමිකයින් සඳහා අතිරේක තීරුබදු සහන ලබා දීම, ඔවුන්ගේ ප්‍රේෂණ මත පදනම්ව සහනදායි ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම වැනි වැඩසටහන් රැසක් හඳුන්වා දී ඇත. ඒ අනුව, 2022 වර්ෂයේදී ඇ.ඩො. මිලියන 3790ක් වූ විදේශ විනිමය සංචිතය 2023 වර්ෂය තුළදී ඇ.ඩො. මිලියන 5970ක් දක්වා 58%කින් වර්ධනය කර ගැනීමට හැකියාව ලැබුණි.

එමෙන්ම, විදෙස් ශ්‍රමිකයින්ගේ හා පවුල්වල සුභ සාධනය හා රැකවරණය වෙනුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහභාගීත්වයෙන් නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ සහයෝගීත්වයෙන් විදේශ රැකියා නියුක්තිකයින්ගේ දරුවන්ට උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීමට යෝජිත වැඩසටහන, ඔවුන්ගේ දරුවන්ට දිවා සුරැකුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ නියමු

ව්‍යාපෘතිය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විගමනික සමාජ පිහිටුවීම වැනි වැඩසටහන් රැසක් 2024 වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂිතය.

සේවකයින්ගේ වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය තහවුරු කර සුරක්ෂිත වැඩ සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. එහිදී ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ප්‍රතිපත්තිය සංශෝධනය කරනු ලබන අතර ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ජාත්‍යන්තර මට්ටමට පුළුල් කිරීමට අපේක්ෂිතය.

අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන විසින් ලබා දෙන සේවාවන් මහජනතාවගේ ගම් පියසේදීම ලබා දීම අරමුණු කරගනිමින් "GLOCAL FAIR" ජංගම සේවා වැඩසටහන් මාලාවක් දිස්ත්‍රික් මට්ටමින් සිදු කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

මෙලෙස අප අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන සියලු කර්තව්‍යයන් ප්‍රධාන නිමැවුම් ක්ෂේත්‍ර 10 ක් ඔස්සේ හඳුනාගෙන ඇති අතර මහජනතාව විසින් අපේක්ෂා කරනු ලබන රජයේ ක්‍රියාපටිපාටිවල සාධනීය වෙනසක් ඇති කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්තිමය වෙනස්කම් කඩිනමින් සිදු කර සංවර්ධන මාවතට ප්‍රවේශවීමට අවශ්‍ය කටයුතු අප විසින් සිදු කරනු ලැබේ. ඒ සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය, ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානය වැනි ජාත්‍යන්තර ආයතනවල මඟ පෙන්වීම හා සහයෝගිත්වය ලැබී ඇති අතර දේශීය වශයෙන් සේව්‍ය - සේවක දෙපාර්ශවය නියෝජනය කරන සංවිධානවල අනුග්‍රහය හා සහයෝගීත්වය හිමි වේ.

මෙම සුවිශේෂ කාර්යභාරය ඉටු කිරීමෙහිලා උරදෙන විදේශ රැකියා ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමන්ට හා අමාත්‍යාංශ ලේකම් ආර් පී ඒ විමලවීර මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතනවල ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන්ටත් මාගේ කෘතඥතාවය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

**මනූෂ නානායක්කාර (පා.ම.)**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය

## විදේශ රැකියා ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා මහ බැංකු නවතම සංඛ්‍යාලේඛනවලට අනුව 2023 වසරේ අග වනවිට ඩොලර් මිලියන 5970 ප්‍රේෂණ ප්‍රමාණයක් ලැබී ඇති අතර එය 2022 වසර අවසානය වනවිට ලැබූ සමස්ත ප්‍රේෂණ ප්‍රමාණය වන ඩොලර් මිලියන 3790 හා සැසඳීමේදී 58% ක වැඩිවීමකි.

විදේශ රැකියා ප්‍රවර්ධනය සහ විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රගමණය උදෙසා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම එක්ව විශාල වැඩසටහන් ප්‍රමාණයක් ක්‍රියාත්මක කරනු ලබයි. තවද විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සහ විදේශ රැකියා නිම කර නැවත මෙරටට පැමිණි විගමනිකයින්ගේ ආරක්ෂාව හා සුබසාධනය උදෙසා දැනුවත් කිරීම, ස්වයං රැකියා හා නැවත සමාජගත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහන් අතර ශ්‍රමික පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම, පාසල් හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබා දීම, වෘත්තීය පුහුණු අවස්ථා සඳහා යොමු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන අතර මෙම වැඩසටහන් බිම් මට්ටම දක්වා රැගෙන ගොස් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන්නේ මෙම අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) විසිනි.

විගමනික ශ්‍රමිකයින් සඳහා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායි මට්ටමින් සිදු කිරීමත් විදේශ රැකියා ක්ෂේත්‍රයේ ඉදිරි ගමන් මඟ සාර්ථක කර ගැනීම සඳහා පළාත් මට්ටමින් අවශ්‍ය සහාය හා අදහස් ලබා ගැනීම සඳහාත් මාගේ ප්‍රධානත්වයෙන් පළාත් මට්ටමින් සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු කරනු ලබන අතර මේ වන විට සියලු පළාත් සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් නිම කර ඇත. ගරු කැබිනට් අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුලු නිල මඩුල්ල හා අමාත්‍යාංශය යටතේ වූ ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රධානීන් ඇතුලු සියලු නිලධාරීන්ගේ මේ සඳහා වන දායකත්වය අගය කරමි.

**ඒ පී ජගත් පුෂ්පකුමාර (පා.ම.)**
විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය

# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය



වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීම, ඔවුන්ගේ සේවා සුරක්ෂිතතාවය සලසා දීම හා රට තුළ කාර්මික සාමය ස්ථාපනය සහ විදේශීය රැකියා වෙළඳපළ වෙත නිපුණ ශ්‍රමිකයින් යොමු කිරීම යන ක්ෂේත්‍රයන් ඔස්සේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් 2023 වර්ෂය තුලදී සිදු කළ ඵලදායී කාර්යභාරය හා 2024 වර්ෂයට සැලසුම්ගත කාර්යයභාර්යන් පිළිබඳව සකස් කරනු ලබන ප්‍රගති වාර්තාව ඔබ වෙතට පත් කරනුයේ මහත් අභිමානයෙනි.

වර්තමාන හා අනාගත අභියෝගවලට මුහුණ දීම සඳහා මෙන්ම වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ඒ වෙනුවෙන් ක්‍රියාත්මක පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීම සඳහා අණපනත් සංශෝධනය කිරීම 2023 වසර තුළ මෙම අමාත්‍යාංශය ඉටු කරන ලද ප්‍රමුඛ කාර්යයකි. පවතින අණපනත්, නීති රීති වර්තමාන වැඩ ලෝකයට ගැලපෙන අයුරින් සංශෝධනය කරන අතරම වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ද මෙම අමාත්‍යාංශය බැඳී සිටියි. දැනට ක්‍රියාත්මක පනත් 13ක ප්‍රතිපාදන ඇතුලත් කරමින් නව සේවා නියුක්ති පනත් කෙටුම්පත සහ විදේශ රැකියා ක්ෂේත්‍රයේ වර්ධනය, ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ වෙනස්වීම්වලට අනුගත වන පරිදි විදේශ රැකියා ක්ෂේත්‍රය විධිමත් කිරීම, පවතින නෛතික රාමුව ශක්තිමත් කිරීම, ජාත්‍යන්තර බැඳීම්වලට අනුගත වීම සඳහා සහ දේශීය වශයෙන් නීති ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. අදාළ සියලු පාර්ශවයන්ගේ දායකත්වයෙන්, රැකියා සඳහා විගමනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කර එළි දක්වන ලද අතර එය දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

එමෙන්ම, සේවකයින්ගේ වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය ප්‍රතිලාභ, මාතෘ ප්‍රතිලාභ, සේවා වියුක්ති ප්‍රතිලාභ හා සේවක වන්දි ප්‍රතිලාභ සේවා යෝජකයාට අමතර වැය බරක් නොවන පරිදි සහ සේවා වියුක්ති රක්ෂණ ප්‍රතිලාභ ඇතුලත් වන පරිදි නව සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම සඳහා අවශ්‍ය අධ්‍යයනයක් සිදු කරමින් පවතී. මෙරට තුළ සුරක්ෂිත වැඩ පරිසරයක් හා සුරක්ෂිත වැඩ සංස්කෘතියක් බිහි කිරීම උදෙසා වන වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිය සංශෝධනය, අවසන් අදියරේ පවතින අතර 2024 වර්ෂයේදී නව ප්‍රතිපත්තිය එළි දැක්වීමට අපේක්ෂිතය.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය හැර සේවා නියුක්ත හා සේවා වියුක්ත සමස්ත ශ්‍රම බලකායේත් පාසල් අධ්‍යාපනය නිම කරනු ලබන තරුණ තරුණයින්ගේත් සියලු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, ශ්‍රම වෙළඳපොළ තුළ පවතින සියලු රැකියා අවස්ථාවන්, වෘත්තීය පුහුණු අවස්ථාවන් ඇතුලත් වන පරිදි හා සමස්ත වැටුප් ගෙවීම් හා ඊට අදාළ අනෙකුත් සියලු සේවාවන් සිදු කළ හැකි, ශ්‍රම බලකායේ සියලුම ප්‍රමාණාත්මක හා ගුණාත්මක වෙනත්කම් යාවත්කාලීන වන ලෙස මෙන්ම විධිමත් අවිධිමත් අංශයත් ආවරණය වන පරිදි සහ ශ්‍රම බලකාය සඳහා අදාළ වන සියලු ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කළ හැකි වන පරිදි ජාතික ශ්‍රම වෙළඳපළ තොරතුරු පද්ධතියක් සැකසීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

නවීන තාක්ෂණයට අනුගත වෙමින් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ජනතාව වෙත ලබා දීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කටයුතු ඩිජිටල්කරණය කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත.

එසේම, විදේශ රැකියා සඳහා යොමු වී ඇති ශ්‍රමිකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව හා සුභසාධනය වෙනුවෙන් පවතින පවුල් සංවර්ධන සැලසුම් හා රැකවරණ සැලසුම් යනාදී වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරන අතර නිවාස සංවර්ධන ව්‍යාපෘතිය හා ඔවුන්ගේ දරුවන්ට අවම පිරිවැයක් යටතේ කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථා ලබා දීම සඳහා ද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. විදෙස් ශ්‍රමිකයින් හට පූර්ණ විද්‍යුත් වාහන ආනයන බලපත්‍ර ලබා දීම, විදේශ ප්‍රේෂණ මත පදනම්ව සහනදායී ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම හා අතිරේක තීරබදු සහන ලබා දීම වැනි සුභසාධන වැඩසටහන් තුළින් විදේශ ප්‍රේෂණ නිත්‍යානුකූල මාර්ගයෙන් ගෙන්වා ගැනීම දිරිමත් කිරීමට කටයුතු කර ඇති අතර මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රමික ප්‍රේෂණ, 2023 වර්ෂය තුළ 2022 වර්ෂයට සාපේක්ෂව 58% ක වර්ධනයක් අත් කර ගෙන ඇත.

සමාජයේ නිල් කරපටි රැකියාවන් වශයෙන් හඳුන්වන රැකියා සඳහා සමාජ පිළිගැනීමක් ඇති කරලීම වෙනුවෙන් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විසින් "ගරු සරු" (Dignity of Labour) වැඩසටහන හඳුන්වා දී ඇති අතර පාසල් අධ්‍යාපනය අවසන් කරන තරුණ තරුණියින්ට අනාගත වර්තමාන වැඩ ලෝකයට ගැලපෙන අයුරින් සහ ව්‍යවසායකත්ව මඟපෙන්වීම සඳහා Smart Youth Club වැඩසටහන ආරම්භ කර ඇත. ශ්‍රී ලංකාව 2025 වන විට ළමා ශ්‍රමයෙන් තොර කලාපයක් කිරීමට අවශ්‍ය කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් මේ වන විට සිදු කරගෙන යනු ලබයි.

අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික එලදායිතා ලේකම් කාර්යාලය, ශ්‍රම වාසනා අරමුදල, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සහ විදේශ රැකියා ඒජන්සිය මඟින් සේවක සුභසාධනය, කම්කරු නීති රීති පිළිබඳව දැනුවත් කිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ එලදායිතා ප්‍රවර්ධනය, ශ්‍රී ලංකාවේ වෘත්තීය ආරක්ෂණ සංස්කෘතියක් ඇති කර සුරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න හා වෘත්තීය අනතුරු අවම වන වැඩ පරිසරයක් ඇති කිරීමට මෙන්ම විදේශ රැකියා සඳහා පුද්ගලයන් යොමු කිරීම සඳහා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි.

ඉහත සඳහන් කළ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය නායකත්වය, මඟපෙන්වීම හා අනුශාසකත්වය ලබා දුන් කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමන්ට හා විදේශ රැකියා ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමන්ට කෘතඥතාවය පළ කරමි. මෙම කාල පරිච්ඡේදය තුළ ඉහත කාර්යසාධනය අත්කර ගැනීමෙහිලා මහත් වූ කැපවීමෙන් ක්‍රියා කළ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන් ඇතුලු කාර්ය මණ්ඩලයටත්, කම්කරු කොමසාරිස් ජනරාල්, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, කම්කරු වන්දි කොමසාරිස්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සහ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය යන ආයතනයන්හි අධ්‍යක්ෂ ජනරාල්වරුන්, ජාතික එලදායිතා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රම වාසනා අරමුදල හා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම යන ආයතනවල සාමාන්‍යාධිකාරීවරුන්ට සහ එම ආයතනවල සියලුම මට්ටම්වල නිලධාරීන්ටත් මාගේ කෘතඥතාවය පිරිනමමි.

**ආර් පී ඒ විමලවීර**
ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

# අන්තර්ගතය

පිටුව

**පළමු පරිච්ඡේදය : ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය 01 - 12**

1.1 හැඳින්වීම ........ 01
1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු ........ 01
1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ........ 01
1.4 සංවිධාන සටහන ........ 03
1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ ........ 04
1.6 අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන ........ 07
1.6.1 කම්කරු දෙපාර්තමේන්තුව ........ 07
1.6.2 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ........ 08
1.6.3 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ........ 08
1.6.4 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය ........ 09
1.6.5 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය ........ 09
1.6.6 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ........ 10
1.6.7 ශ්‍රම වාසනා අරමුදල ........ 11
1.6.8 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ........ 11
1.6.9 ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම ........ 12

**දෙවන පරිච්ඡේදය : ප්‍රගතිය හා ඉදිරි දැක්ම 13 - 65**

2.1 අමාත්‍යාංශයේ ප්‍රගතිය ........ 13
2.1.1 කම්කරු ක්ෂේත්‍රය ........ 20
2.1.2 විදේශ රැකියා ක්ෂේත්‍රය ........ 42
2.2 අමාත්‍යාංශයේ ඉදිරි දැක්ම ........ 59
2.2.1 කම්කරු ක්ෂේත්‍රය ........ 59
2.2.2 විදේශ රැකියා ක්ෂේත්‍රය ........ 63

**තුන්වන පරිච්ඡේදය : 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය ........ 67 - 82**
**හතර වන පරිච්ඡේදය : කාර්යසාධන දර්ශක ........ 83 - 85**
**පස් වන පරිච්ඡේදය : තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 87 - 93**
**හය වන පරිච්ඡේදය : මානව සම්පත් පැතිකඩ ........ 95 - 118**
**හත් වන පරිච්ඡේදය : අනුකූලතා වාර්තාව ........ 119 - 125**

## වගු නාමාවලිය

පිටුව


වගුව 2.1 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් .......... 20
වගුව 2.2 පරීක්ෂණ සිදු කිරීම්- 2023.01.01 සිට 2023.12.31 දක්වා ප්‍රගතිය .......... 21
වගුව 2.3 වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2023.01.01 සිට 2023.12.31 දක්වා .......... 23
වගුව 2.4 2023 වර්ෂයේ ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම .......... 24
වගුව 2.5 2023.01.01 සිට 2023.12.31දක්වා කාලය තුළ දී ඉටු කරනු ලැබූ ක්‍රියාකාරකම් .... 24
වගුව 2.6 සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් .......... 25
වගුව 2.7 ස්ත්‍රී තරුණ සහ ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රගතිය .......... 25
වගුව 2.8 අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - 2023.01.01 සිට 2023.12.31 දක්වා ....... 27
වගුව 2.9 කම්කරු දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය .......... 30
වගුව 2.10 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය .......... 30
වගුව 2.11 2023.12.31 දිනට රැකියාගත කිරීම් - මි. හා රැ.දෙපා .......... 31
වගුව 2.12 සිදු කරන ලද විශේෂ වැඩසටහන් - ජා.වෘ.සු.සෞ.ආ .......... 36
වගුව 2.13 වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරුවල ස්වභාවය .......... 38
වගුව 2.14 වාර්තා වූ මාරක නොවන අනතුරුවල හානියේ ස්වභාවය .......... 38
වගුව 2.15 වන්දි ගෙවීමේ කටයුතුවල ප්‍රගතිය .......... 39
වගුව 2.16 විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම්, විදේශ රැකියා ඇණවුම් අනුමත කිරීම් සහ විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම .... 46
වගුව 2.17 විදේශ රැකියා සඳහා බඳවා ගැනීම් සම්බන්ධව බලපත්‍රලාභී නියෝජිත ආයතන/ බලපත්‍රලාභී නොවන වෙනත් පාර්ශවවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම .......... 47
වගුව 2.18 විගමනික ශ්‍රමිකයින් වෙතින් හෝ ඔවුන් වෙනුවෙන් ලැබෙන පැමිණිලි විසඳීම සහ මිනිස් වෙළඳාමට එරෙහි ක්‍රියාකාරකම් - ශ්‍රී.ලං.වි.සේ.නි.කා .......... 47
වගුව 2.19 විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක සුබසාධන වැඩසටහන් - ශ්‍රී.ලං.වි.සේ.නි.කා .......... 48
වගුව 2.20 පවත්වන ලද පුහුණු වැඩසටහන් - ශ්‍රී.ලං.වි.සේ.නි.කා .......... 50
වගුව 2.21 රැකියා බැංකුව හරහා රැකියා අපේක්ෂකයින් ලියාපදිංචි කිරීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කා .......... 50
වගුව 2.22 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශ රැකියා සඳහා බඳවා ගැනීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කා .......... 50
වගුව 2.23 විදේශ රැකියා අවස්ථා සහ සුරක්ෂිත ශ්‍රම සංක්‍රමණය පිළිබඳව විදේශ රැකියා අපේක්ෂකයින් සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් / ජංගම සේවා පැවැත්වීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කා .......... 51
වගුව 2.24 විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමෙන් හා දිස්ත්‍රික් මට්ටමෙන් රැකියා පොළ වැඩසටහන් පැවැත්වීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කා 51
වගුව 2.25 අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම් - ශ්‍රී.ලං.වි.සේ.නි.කා .......... 53
වගුව 2.26 සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය - 2023 .......... 55
වගුව 2.27 ආයතන කටයුතුවල ප්‍රගතිය .......... 57
වගුව 2.28 භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝජනය කිරීම .......... 57
වගුව 2.29 රැකියා ඇණවුම් ප්‍රමාණය (ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය) .......... 65
වගුව 3.1 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය .......... 73
වගුව 3.2 වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය .......... 73
වගුව 3.3 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන .......... 73

වගුව 3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය ........................................ 74
වගුව 4.1 අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක වගුව ...................................................... 83
වගුව 5.1 අමාත්‍යාංශයට අදාළ තිරසර සංවර්ධන අරමුණු ................................................ 87
වගුව 6.1 2023.12.31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය ............................................. 95
වගුව 6.2 කම්කරු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා පැවති පුහුණු වැඩසටහන් - 2023 ........................................................................ 95
වගුව 6.3 කම්කරු දෙපාර්තමේන්තු නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2023 ........................................................................ 99
වගුව 6.4 දේශීය පුහුණු පාඨමාලා සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ නිලධාරීන්ගේ සහභාගීත්වය - 2023 ........................................................ 103
වගුව 6.5 දේශීය පුහුණු පාඨමාලා සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහභාගීත්වය - 2023 ........................................................ 107
වගුව 6.6 ජාතික එලදායිතා ලේකම් කාර්යාලයේ පුහුණු වැඩසටහන් ................................ 110
වගුව 6.7 ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගමේ පුහුණු වැඩසටහන් ........... 110
වගුව 6.8 විදේශීය පුහුණු පාඨමාලා සඳහා අමාත්‍යාංශ නිලධරයන් සහභාගීත්වය .............110
වගුව 6.9 විදේශීය පුහුණු පාඨමාලා සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ නිලධරයන්ගේ සහභාගීත්වය ........................................................................116
වගුව 7.1 අනුකූලතා වාර්තාව ........................................................................................ 119

## ප්‍රස්තාර නාමාවලිය

ප්‍රස්තාරය 2.1 2019 වර්ෂයේ සිට 2023.09.30 දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් .......................................................... 22
ප්‍රස්තාරය 2.2 2019 වර්ෂයේ සිට 2023.09.30 දක්වා කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා නිරවුල් කිරීම් .................................................................... 22
ප්‍රස්තාරය 2.3 මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු - 2023.01.01 දින සිට 2023.09.30 දින දක්වා ...................................... 28
ප්‍රස්තාරය 2.4 වාර්තා වූ මාරක අනතුරු ප්‍රමාණය ...........................................................37
ප්‍රස්තාරය 2.5 වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරු ප්‍රමාණය ............................. 37
ප්‍රස්තාරය 2.6 සංචාරක අධිකරණ ප්‍රදේශ අනුව වාර්තා වූ අනතුරු ප්‍රමාණය .................... 39
ප්‍රස්තාරය 2.7 ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය ............................................................. 41
ප්‍රස්තාරය 2.8 ලොතරැයි ආදායම ................................................................................. 42
ප්‍රස්තාරය 2.9 ශ්‍රමික සුරැකුම යටතේ ලියාපදිංචිය ......................................................... 42
ප්‍රස්තාරය 2.10 සංවර්ධන නිලධාරීන් විසින් සකස් කරන ලද පවුල් සංවර්ධන සහ රැකවරණ සැලසුම් ................................................................... 43
ප්‍රස්තාරය 2.11 විගණන කළමනාකරණ කමිටු රැස්වීම් සහ සිදුකළ විගණන පරීක්ෂණ ........ 58

## ඡායාරූපය නාමාවලිය

ඡායාරූපය 2.1 ජාතික කම්කරු උපදේශන සභාව රැස්වීම ................................................. 17
ඡායාරූපය 2.2 ජපාන රජය සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් තැබීම ............................ 17
ඡායාරූපය 2.3 ළමා ශ්‍රම විරෝධී වැඩසටහන .................................................................. 26
ඡායාරූපය 2.4 ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් "වැඩලිය" ප්‍රකාශනය එළිදැක්වීම ...... 26
ඡායාරූපය 2.5 "ගරු සරු" වැඩසටහන පිළිබඳ සාකච්ඡාව ............................................... 33
ඡායාරූපය 2.6 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය ......................35
ඡායාරූපය 2.7 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය ............................36
ඡායාරූපය 2.8 කොරියානු රැකියා ඇණවුම් පිළිබඳ සාකච්ඡාව ........................................ 47
ඡායාරූපය 2.9 විගමනික ශ්‍රමිකයින් සඳහා සුහසාධන වැඩ ක්‍රියාත්මක කිරීම ...................... 49

ඡායාරූපය 2.10 කොරියානු තානාපතිනිය හමුව .................................................................... 54
ඡායාරූපය 2.11 සෞදි අරාබි මහකොමසාරිස් හමුව .............................................................. 54
ඡායාරූපය 2.12 යාපනය දිස්ත්‍රික්කයේ පැවැත්වූ ජංගම සේවා වැඩසටහන .......................... 55

## රූපසටහන

රූපසටහන 1.1 අමාත්‍යංශයේ සංවිධාන සටහන ................................................................. 03

# පළමු පරිච්ඡේදය

# ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

# ආයතනික පැතිකඩ - ක්‍රියාවට නැංවීමේ සාරාංශය

# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

## 1.1 හැඳින්වීම

පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සමාජ ආරක්ෂණය, කාර්මික සාමය තහවුරු කිරීම සහ විදේශීය රැකියා වෙළඳපොළ සඳහා පුහුණු ශ්‍රමිකයින් යොමු කිරීම, රැකියාගත කිරීම, රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ රට තුළ ඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීම තුළින් දේශීය හා විදේශීය ශ්‍රම බලකාය ආර්ථික සංවර්ධනයට වන දායකත්වය ඉහළ නැංවීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ප්‍රධාන මෙහෙවර වේ. මෙම මෙහෙවර ඉටු කිරීමේදී තිරසර සංවර්ධන අරමුණු සහ ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර සම්මුතීන් මත පිහිටා 2022.07.22 දිනැති අංක 2289/43 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව අමාත්‍යාංශයේ වැඩසටහන් පෙළ ගස්වා ඇත.

## 1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**

දෙස් විදෙස් රැකියා වෙළඳපොළ වෙත නිපුණ මානව සම්පත සැපයීම සහ කාර්මික සාමය හා සහයෝගීතාව, සමාජ සුරක්ෂිතතාවය, කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඵලදායිතාව ප්‍රවර්ධනය තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

**අරමුණු**

- සුනිසි, ආරක්ෂිත, සහ ඵලදායි රැකියා ප්‍රවර්ධනය කරන වඩා හොඳින් යහපාලනය සිදු වන ශ්‍රමික විගමන අංශයකින් ශ්‍රී ලංකාව ප්‍රතිලාභ ලැබීම
- විගමනික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම්, සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය, රැකවරණය, සමාජ ආරක්ෂණය සහ ඔවුන් සහ ඔවුන්ගේ පවුල්වල අයගේ ශුභසාධනය විගමනයේ සියලු අවධීන් තහවුරු කිරීම
- ශ්‍රී ලංකාව සිය ශ්‍රම බලකායට ඵලදායි ලෙස ගෝලීය ශ්‍රම වෙළඳපලට ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම සහ එමඟින් වඩා යහපත් සමාජ ආර්ථික ප්‍රතිලාභ භුක්ති විඳීම
- ශ්‍රී ලංකාව විසින් රටේ සංවර්ධනයේ වැදගත් අංගයක් ලෙස රැකියා සඳහා විගමනය සඵලදායිව ස්ථානගත කිරීම
- ත්‍රෛපාර්ශවීය සවිබල ගැන්වීම තුළින් සේව්‍ය-සේවක සබඳතා ශක්තිමත් කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සේවා තත්ත්වයන් හා සේවක අයිතීන් තහවුරු කිරීම
- ළමා ශ්‍රම යෙදවුම් තුරන් කිරීම
- රැකියාවල නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම, වෘත්තීමය ආරක්ෂාව ශක්තිමත් කිරීම හා වෘත්තීමය නීති, අයිතිවාසිකම් තහවුරු කිරීම
- කම්කරු නීති රීති හා පටිපාටිවල නම්‍යශීලීත්වය ඉහළ නැංවීම
- වැඩ කරන ජනතාවගේ සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රමෝපායන් සකස් කිරීම
- නිපුණ විදේශ රැකියා බලකායක් බිහි කිරීම සඳහා ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම

## 1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තීන් මත පිහිටා කම්කරු හා විදේශ රැකියා විෂයන්ට අදාළව ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

2. රැකියා නියුක්තිය සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

3. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කම්කරු සබඳතා, ප්‍රමිතීන්, සේවක පරිපාලනය, සුභසාධනය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

4. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධාන සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම

5. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය හා නියාමනය කිරීම

6. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම

7. කම්කරු සබඳතාවලට අදාළ නීති රීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු

8. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම

9. ජාතික ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස ප්‍රතිපත්ති, වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

10. විදේශ රැකියා අවස්ථා බහුල කිරීම, ප්‍රවර්ධනය කිරීම හා එම රැකියාවන් සඳහා අවශ්‍ය නිපුණතාවන් වැඩිදියුණු කිරීමට අදාළ ආයතන සමඟ කටයුතු කිරීම

11. විදේශගත ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය හා නියාමන ක්‍රියාවලීන් හඳුන්වාදීම

12. විදේශගත ශ්‍රමිකයින් සහ විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයින්ට විදේශ විනිමය ශ්‍රී ලංකාව තුළ ඉතිරි කිරීමට හා ආයෝජනය කිරීමට විශේෂ පහසුකම් සැපයීම

13. විදේශ රැකියා නිම කර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

14. සංක්‍රමණික සේවා නියුක්තිකයින්ගේ වෘත්තීමය ගැටළුවලට පිළියම් ලබාදීම, ආරක්ෂාව සහ සුභසාධනය පවත්වා ගැනීම


15. විදේශ රටවලදී විවිධ අනතුරුවලට ලක්වන්නන්ට හිමි වන්දි ලබා ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම

16. විදේශ රැකියා නියෝජිත ආයතන නියාමනය

17. අමාත්‍යාංශ විෂයය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම

18. කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම සහ ශ්‍රම වාසනා අරමුදල යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු හා ආයතනයන් අධීක්ෂණය

## 1.4 සංවිධාන සටහන




V - පුරප්පාඩු    L* - වැටුප් රහිත දේශීය නිවාඩු

**රූපසටහන 1.1** අමාත්‍යාංශයේ සංවිධාන සටහන

## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ

- **පාලන සහ ආයතන අංශය**

අමාත්‍යාංශයේ පරිපාලනය, කළමනාකරණය, සාමාන්‍ය නඩත්තුව, පුහුණු කිරීම සහ අමාත්‍යාංශයත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනත් සම්බන්ධීකරණය කිරීම සහ මානව සම්පත් කළමනාකරණය හා ඒ ආශ්‍රිත රාජකාරි මේ යටතේ සිදු වේ. ඒ අනුව,

- අමාත්‍යාංශයට අනුයුක්ත සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ මෙන්ම ගරු අමාත්‍යතුමන්ගේ සහාය කාර්ය මණ්ඩලයට අදාළ පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හා ඒ ආශ්‍රිත අනෙකුත් ආයතන කටයුතු හා කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීම

- අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් සිදුකළ යුතු ආයතන හා පරිපාලන කටයුතු

- අමාත්‍යාංශය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබද ක්‍රියා කිරීම

- පවතින නීති යාවත්කාලීන කිරීම හා නව නීති පැනවීම තුළින් කාර්මික සහයෝගිතාවය සහ විදේශ රැකියා ප්‍රවර්ධනය හා සුරක්ෂිතතාවය ඇති කිරීමට ප්‍රතිපත්තිමය දායකත්වය සැපයීම

- උපදේශක කාරක සභා, මහජන පෙත්සම් කාරක සභා වෙතින් සිදු කරන යොමු කිරීම් සඳහා පිළිතුරු සැපයීම මෙන්ම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම, ජනාධිපති කාර්යාලය හා අගමැති කාර්යාලය මඟින් යොමු කරන මහජන පැමිණිලි මෙන්ම සෘජුවම ලැබෙන මහජන ගැටළු අදාළ අංශ වෙත යොමු කිරීම

- අමාත්‍යාංශයේ වාහන පරිපාලනය, අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, පුහුණු කටයුතු, ප්‍රාග්ධන භාණ්ඩ හා උපකරණ කළමනාකරණය, අතිකාල, නිවාඩු දින වැටුප්, අග්‍රහාර රක්ෂණ සහ ආපදා ණය අනුමත කිරීම ආදී කටයුතු සිදු කරනු ලබයි

- **සංවර්ධන අංශය**

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම හා කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සහ විගමනික ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර සම්මුතීන් මෙන්ම අදාළ අණ පනත්, රෙගුලාසි, මාර්ගෝපදේශ සැකසීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු මෙම අංශය විසින් ඉටු කරනු ලබයි.

- ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කම්කරු ප්‍රඥප්තීන්, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගතිය නියමිත කාල වකවානුව තුළ ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කිරීම

- ශ්‍රී ලංකාව කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය මත පදනම්ව ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම

- කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව පවතින ගැටළු විසඳීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීම

- නව නීති ඇති කිරීම හා පවත්නා නීති කාලානුරූපව සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සහාය ලබාදීම

- විදේශ කටයුතු අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් සංවිධාන මඟින් වරින්වර ඉල්ලීම් කරනු ලබන විගමනික ක්ෂේත්‍රය හා සම්බන්ධ ගැටළු, යෝජනා සහ අනෙකුත් වාර්තා ලබා දීම

- විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ නව අවබෝධතා ගිවිසුම් / එකඟතාවලට එළඹීම, ගිවිසුම් යාවත්කාලීන කිරීම, ගිවිසුම්වල ක්‍රියාකාරීත්වය පිළිබඳව පසු විපරම් කිරීම

- ඒකාබද්ධ කමිටු රැස්වීම්වලට අදාළ කටයුතු සහ කලාපීය / ගෝලීය සංවාද හා සම්බන්ධ සියලු කටයුතු

- ක්ෂේත්‍රයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ (විදේශ රැකියා) විෂයානුබද්ධ පුහුණුව සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ සංචිතය පවත්වාගෙන යාම

- සංවර්ධන නිලධාරීන් හරහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- විගමනික ශ්‍රමික කාන්තාවන් හා සම්බන්ධ පවුල් පසුබිම් වාර්තා පිළිබඳව අභියාචනා කමිටු පැවැත්වීම, කමිටු තීරණ දන්වා යැවීම හා පසුවිපරම් කිරීම

- කම්කරු ක්ෂේත්‍රයට අදාළ ගැටළුවලට විසඳුම් ලබාදීම සඳහා වැඩකරන කරන ජනතාව පදිංචි ප්‍රදේශ තුළදීම ජංගම සේවා වැඩසටහන් සංවිධානය කිරීම

- අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතනවල නිලධාරීන් සඳහා විදේශ පුහුණුව ලබාදීමට ක්‍රියා කිරීම

- **සැලසුම් හා අධීක්ෂණ අංශය**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියලුම ආයතනවල සංවර්ධන වැඩසටහන් නිවැරදි ඉලක්ක ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය හා පසු විපරම් කිරීම ප්‍රධාන කාර්යභාරය වන අතර පහත සඳහන් කාර්යයන් ද ඉටුකරනු ලබයි.

- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ පාර්ශව වෙත යොමු කිරීම. ශුන්‍ය පාදක අයවැය සංවර්ධන වැඩසටහන යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සෑම මසකම ප්‍රගතිය ඇගයීම මඟින් ඉලක්ක වෙත ළඟාවීම අධීක්ෂණය හා දිරිගැන්වීම

- ජාතික අයවැය චක්‍රලේඛ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් මඟින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ද සහාය සහිත ව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ වැඩසටහන් සැලසුම්කරණය, අධීක්ෂණය සහ වාර්තාකරණය

- වාර්ෂිකව කම්කරු ක්ෂේත්‍රයේ විවිධ කාලෝචිත තේමාවන් පාදක කර ගනිමින් පර්යේෂණාත්මක ලිපි අඩංගු ජර්නලයක් ප්‍රකාශයට පත් කිරීම

- ශ්‍රී ලංකා සේවක සඟරාව ප්‍රකාශයට පත් කිරීම

- අමාත්‍යාංශය විසින් අත්කරගත් ප්‍රගතිය ඇතුලත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ අයවැය කාරක සභා විවාදය සඳහා ප්‍රගති වාර්තාව සකස් කිරීම

- **මූල්‍ය අංශය**

වාර්ෂික අයවැය මඟින් අමාත්‍යාංශයට වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම ගිණුම් අංශයේ ප්‍රධාන වගකීම වේ.

- 01/2020 රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය පැවැත්වීම
- මූල්‍ය අධිකාරියේ නියෝජිතායතනය සම්බන්ධ වාර්තා සකස් කිරීම සහ මූල්‍ය බලතල පැවරීමේ කටයුතු සිදු කිරීම
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම
- වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම
- රජයේ ගිණුම් පිළිබඳ කාරකසභා වාර්තාව සකස් කිරීම, මහා භාණ්ඩාගාරයට හා අදාළ අනෙකුත් ආයතනවලට මාසිකව හා කාර්තුමය වශයෙන් මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම
- විගණන විමසුම් ලේඛන යාවත්කාලීන කර පවත්වා ගෙන යාම හා අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු විගණකාධිපති වෙත යොමු කිරීම

- **අභ්‍යන්තර විගණන අංශය**

ජාතික විගණන පනතේ 38 (ආ) සහ (ඊ) හි දක්වා ඇති පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම ඉටු වන බවට සහතික කිරීම සඳහා එම පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව සිදුකර ඇති පත් කිරීම් හා මු.රෙ. 133 හා 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයට ලැබී ඇති බලතල හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019/01/12 දිනැති චක්‍රලේඛයේ නියමයන් පරිදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු වේ.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින කම්කරු දෙපාර්තමේන්තුව, වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ශ්‍රම අධ්‍යයනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, ශ්‍රම වාසනා අරමුදල, ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ලංකා විදේශ රැකියා පෞද්ගලික සමාගම යන ආයතනයන්හි අදාළ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමේ වගකීම හා අවශ්‍යතාවය අනුව විශේෂ පරීක්ෂණ ද අභ්‍යන්තර විගණන විෂයට අදාළ විශය පථය වේ.

**ප්‍රධාන කාර්යයන්**

- ආයතනයන් තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමයෙහි ක්‍රියාකාරීත්වයේ සාර්ථකත්වය සොයා බැලීම
- රජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශය විසින් සහ මහා භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කරනු ලැබ ඇති හා නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා වෙනත් පරිපූරක උපදෙස් පිළිපදිනු ලබන්නේ ද යන්න සොයා බැලීම
- කම්කරු අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතට අයත් වන දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල මෙහෙවර හා අරමුණු, විගණන මූලධර්ම පද්ධතියට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු ඵලදායි ලෙස කළමනාකරණය කිරීම
- අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ප්‍රතිපත්ති, සැලසුම්, ක්‍රියා පටිපාටි, නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සම්බන්ධව සහතික කිරීම සඳහා ස්ථාපිත කර ඇති පාලන පද්ධති ඇගයීමට ලක් කිරීම
- වත්කම් ආරක්ෂා කිරීම හා වත්කම්වල පැවැත්ම තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ඇගයීම හා සත්‍යාපනය කිරීම
- භෞතික හා මූල්‍ය ප්‍රගතිය අමාත්‍යාංශයේ ස්ථාපිත අරමුණුවලට අනුකූලව ලබාගෙන ඇද්ද යන්න සොයා බැලීම සඳහා ක්‍රියාකාරකම් හෝ වැඩසටහන් ඇගයීමට ලක් කිරීම සහ තොරතුරු පරීක්ෂාව

- ආයතනයේ එක් එක් අංශ සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් ඇති කිරීමට අවශ්‍ය මඟපෙන්වීම ලබා දීම
- විගණන ක්‍රියාවලියෙන් අනතුරුව සන්නිවේදනය කිරීම හා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාවලියෙන් අනතුරුව ඉදිරිපත් කිරීම
- වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට යැවිය යුතු වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම කැඳවීම සිදුකිරීම සහ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම
- පාලනාධිකාරිය විසින් අවස්ථානුකූලව පවරනු ලබන විශේෂිත රාජකාරී ඉටුකිරීම සහ වාර්තා කිරීම

## 1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

### 1.6.1 කම්කරු දෙපාර්තමේන්තුව

යටත් විජිත සමයේ බ්‍රිතාන්‍ය පාලකයන් විසින් ව්‍යාපාරික වතු වගාව යටතේ කෝපි හා තේ වගාව සඳහා ශ්‍රී ලංකාවට ගෙන්වන ලද ඉන්දීය කම්කරුවන්ට සුබසාධනය සැපයීමේ අරමුණින් 1923 අංක 01 දරණ ඉන්දියානු ආගාමික කම්කරු ආඥා පනත හඳුන්වා දෙන ලදී. එම ආඥා පනත යටතේ පිහිටුවන ලද ඉන්දියානු ආගාමික කම්කරු පාලකවරයාගේ දෙපාර්තමේන්තුව කම්කරු දෙපාර්තමේන්තුවේ මූලාරම්භය වේ. වර්තමානයේදී කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේව්‍ය, සේවක හා රජය යන ත්‍රෛපාර්ශවීය සම්බන්ධතාවය ශක්තිමත්ව පවත්වා ගැනීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ කාර්යභාරය ඉටු කරයි.

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවක ප්‍රජාවගේ කම්කරු නීති මගින් හිමිකර දී ඇති අයිතිවාසිකම් තහවුරු කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයක් වේ. 2023 වර්ෂයේ දී මෙම කාර්යභාරයෙන් වඩාත් ඉදිරියට ගොස්, සේව්‍ය සහ සේවක සබඳතාවය ප්‍රවර්ධනය කිරීම තුළින් ආයතන මට්ටමින් කාර්මික සාමය සුරක්ෂිත කිරීම සහ සේවායෝජක පාර්ශවයන්ගේ ද සහය ලබා ගනිමින් එමගින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමුඛතාවය ලබා දී ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

එසේම, ආයෝජන දිරි ගැන්වීම සඳහා වඩාත් හිතකර වූ පරිසරයක් නිර්මාණය කිරීමේ රජයේ ප්‍රතිපත්තිය අනුව, දශක ගණනාවක් පැරණි සහ සංකීර්ණ වූ කම්කරු නීති වෙනුවට සරල වූ ද සේව්‍ය සහ සේවක සම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වන්නා වූ ද නව කම්කරු නීතිය හඳුන්වා දීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව 2023 වර්ෂයේදී මූලික කාර්යයන් සිදු කරන ලදී.

**අරමුණු**

- පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා ආයතන තුල ස්ථිරසාර කාර්මික සාමය තහවුරු කිරීම
- සුනිසි වැඩ පරිසරයක් ඇති කිරීම හා ශ්‍රම ප්‍රමිතීන් සකස් කිරීම මගින් සේවකයන්ගේ සේවා තත්ත්වය වැඩි දියුණු කිරීම
- සේවකයන්ගේ සමාජ ආරක්ෂණය තහවුරු කිරීම
- ස්ත්‍රීන් හා තරුණ අයගේ වෘත්තීමය සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ළමා ශ්‍රමය තුරන් කිරීම
- සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වයන්ට හිතකර හා අනතුරු රහිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීම

**ප්‍රධාන කාර්යයන්**

- සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම මගින් ආයතන මට්ටමින් සේව්‍ය හා සේවක සබඳතාවය ශක්තිමත් කිරීම සඳහා කටයුතු කිරීම
- කම්කරු නීති ක්‍රියාත්මක කිරීම තුළින් සේවක අයිතීන් ආරක්ෂා කිරීම
- නිරවුල් කිරීම, සාමූහික ගිවිසුම් සහ බේරුම්කරණය මගින් කාර්මික ආරවුල් නිරවුල් කිරීම
- සේවක අර්ථසාධක අරමුදල මගින් සේවකයින්ගේ සමාජ ආරක්ෂණය සඳහා කටයුතු කිරීම
- සේවකයින්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය සම්බන්ධයෙන් කටයුතු කිරීම

- ළමා ශ්‍රමය තුරන් කිරීම සහ සේවයේ නියුක්ත කාන්තාවන්ගේ රැකවරණය සම්බන්ධයෙන් කටයුතු කිරීම
- වැටුප් හා සේවා කොන්දේසි ශක්තිමත් කිරීම මගින් ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම

### 1.6.2 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

රටක් සතු සීමිත සම්පත් ප්‍රශස්තව උපයෝජනය කිරීම රටේ ප්‍රගමනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වේ. පවත්නා සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය සඳහා සක්‍රීය හා ඉහළ ගුණාත්මකභාවයකින් යුත් මානව සම්පතක් නොමැති වීම රටක ප්‍රගමනය සඳහා බාධාකාරී වේ. රටක් සතු සම්පත් අතරින් වඩා වැදගත් වන මානව සම්පත සංවර්ධනය සහ කළමනාකරණය රටක සංවර්ධන ක්‍රියාවලියේ අනිවාර්යය සහ අත්‍යවශ්‍ය  අංගයක් වන්නේ එබැවිනි.

ශ්‍රී ලංකාව තුළ මානව සම්පත සංවර්ධනය කරමින් තරුණ ප්‍රජාව අතර විරැකියාව තුරන්කර සංවර්ධන ඉලක්ක සපුරා ගැනිමට සහාය වීම, ශ්‍රම බලකායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, වෘත්තීය මාර්ගෝපදේශය හා රැකියා උත්පාදනය තුළින් ජාතික ආර්ථිකයට තරුණ ප්‍රජාවේ දායකත්වය ලබා ගැනීම යන අරමුණු සපුරා ගැනීම සඳහා 2010.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ස්ථාපනය කොට ඇත.

**ප්‍රධාන කාර්යයන්**

1. වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම
2. ශ්‍රම වෙළඳපොළ තොරතුරු එක් රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදා හැරීම
3. මහජන රැකියා සේවා ලබාදීම
4. ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීම
5. මානව සම්පත් සංවර්ධනයට අදාල කටයුතු ඉටු කිරීම

**අරමුණු**

- 2025 වර්ෂය වන විට පිරිමි ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 70% සිට 73% දක්වාද,  කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 32% සිට 34.5% දක්වාද, 2030 දී පිරිමි ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 75% දක්වාද,  කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 45% දක්වා වැඩි වීම.
- පුහුණු/ වෘත්තීමය ශ්‍රමිකයන් විදෙස් ගත වීමේ ප්‍රතිශතය 2030 වන විට දෙගුණයක් බවට පත් කිරීම (36.5% සිට 73%) හා විදෙස් ගතවන නුපුහුණු ශ්‍රමිකයන්ගේ ප්‍රතිශතය අඩු වීම.
- 2025 වන විට EDBI දර්ශකයෙහි ශ්‍රී ලංකාව රැඳී සිටින ස්ථානය 99 සිට 89 දක්වා ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්තිමය සංවාදයක් ඇති වීම.
- 2030 වන විට දේශීය හා ගෝලීය ඉල්ලුම සපුරාලීම සඳහා කාර්‍යක්ෂම හා සදාචාරාත්මක ශ්‍රම බලකායක් ඇති කිරීම සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශයක් ලබා දීම.

### 1.6.3 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින ස්ථාපිත කරන ලද අතර 2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් බලාත්මක කරන ලදී. කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශව හවුල්කරුවන් වන සේව්‍ය, සේවක හා රජයේ සේවකයින්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මඟින් ආයතනය පාලනය වේ.

කම්කරු අණපනත්, නීති, රීති රෙගුලාසි පිළිබඳව දැනුවත් සහ ඵලදායී ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුහුණු හා පර්යේෂණ කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම ආයතනයේ මූලික කාර්යභාරයයි. වෘත්තීය සමිති ක්‍රියාකාරීන් හා සේව පාර්ශව සඳහා වඩාත් ඵලදායී සේවාවක් සැපයීමේ අරමුණින් යුතුව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මේ වන විට කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ දෙවන මහලේ ස්ථාපිත කොට පවත්වාගෙන යනු ලැබේ.

**ප්‍රධාන කාර්යයන්**

- දේශීය හෝ විදේශීය ආයතන සමඟ සහයෝගීත්වයෙන් ශ්‍රම අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සේවකයන් සංවර්ධන ක්‍රියාවලියෙහි ක්‍රියාකාරී කොටස්කරුවන් කර ගැනීම සඳහා ඔවුන්ගේ සුභසාධනය සහතික කරනු පිණිස පියවර ගැනීම

- ශ්‍රම අධ්‍යයන පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන සහ රැස්වීම් පැවැත්වීම සහ සඟරා, ජර්නල්, වාර ප්‍රකාශන සහ පොත් පළ කිරීම
- පර්යේෂණ පැවැත්වීම, සමීක්ෂණ පැවැත්වීම සහ ශ්‍රම අධ්‍යයනයට අදාළ පාඨමාලා සඳහා විධිවිධාන යෙදීම පුස්තකාල හා තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම
- මේ හා සමාන අරමුණු සහිත, ජාතික හා විදේශීය ආයතන, සංවිධාන, සංගම් සහ සමිති සමඟ සමීප සහයෝගීත්වයෙන් කටයුතු කිරීම
- විශ්ව විද්‍යාල සහ ඒ හා සමාන ආයතනවල සහය ඇතිව ශ්‍රම අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ඇතුළු පාඨමාලා පැවැත්වීම සහ අවශ්‍ය අවස්ථාවලදී සහතික සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම
- කාර්මික සමගිය පවත්වා ගැනීම අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල නිරත වීම

### 1.6.4 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය

ශ්‍රී ලංකාව තුල යහපත් වෘත්තීය ආරක්ෂණ ක්‍රියාමාර්ග හා යහපත් සෞඛ්‍යය පුරුදු අනුගමනය කරමින් සුරක්ෂිත හා සෞඛ්‍යය සම්පන්න ශ්‍රම බලකායක් බිහි කරලීමේ අරමුණින් 2009 අංක දරණ 38 දරණ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය ස්ථාපිත කරන ලදී.

දෛනිකව සිදු කරනු ලබන පාරිසරික මිණුම් සමීක්ෂණ , අවදානම් ඇගයීම හා වෛද්‍ය පරීක්ෂණ මගින් මෙන්ම විශේෂ වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කරනු ලබන පුහුණුවීම්, ව්‍යාපෘති මඟින් හා වෙනත් රටවල් සමඟ අන්තර් ජාතික සහයෝගීතාවය මත සිදු කරනු ලබන ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලංකාව තුළ වැඩදායී ශ්‍රම බලකායක් බිහි කරවාලීමට මෙම ආයතනය විසින් කටයුතු කරනු ලබයි.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම්

- වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව(ඉංග්‍රිසි මාධ්‍ය)
- වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව(සිංහල මාධ්‍ය)
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ විධායක ශ්‍රේණි නිලධාරීන් සඳහා පාඨමාලාව
- වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය
- බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම
- කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යයන වැඩසටහන
- කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම
- රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- කාර්යාලයීය කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය
- පරීක්ෂණාගාරවල වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය
- රසායනික ද්‍රව්‍ය ආරක්ෂා සහිතව පරිහරණය කිරීම
- ආහාර පරිහරණය කරන්නන් සඳහා සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- ආතති කළමණාකරන පුහුණු වැඩසටහන

### 1.6.5 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

සේවයේ යෙදී සිටින අවස්ථාවේ දී සිදුවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබාදීම සඳහා 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත පනවා ඇත. මෙම පනතට යම් යම් අවස්ථාවන්හිදී සංශෝධන කිහිපයක් ඇතුළත් වූ අතර, අවසාන සංශෝධනය 2022 අංක 10 පනතින් සිදුකර ඇත. කම්කරු වන්දි උසාවිය දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් බලතල සහිතව මුළු දිවයිනම ආවරණය වන පරිදි සංචාරක උසාවි 14කින් ද සමන්විත වේ. අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු 3කින් ද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ තනතුරක්ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් ද ඇතුළු තනතුරු 43කින් සමන්විත වේ.

රැකියාවේ යෙදී සිටියදී සිදුවන අනතුරුවලින් තුවාල ලබන සේවකයින්ට රැකියාවේ ස්වභාවය නිසා වැළඳුණු රෝගවලින් පීඩා විඳින සේවකයින්ට සේවයේ යෙදී සිටින විට සිදුවන අනතුරු වලින් මියයන සේවකයින්ගේ යැපෙන්නන්ට වන්දි අයකර දීම ප්‍රධාන අරමුණ වේ. කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත අදාළ කර ගන්නා අතර අභියාචන පටිපාටිය දිසා අධිකරණයකට සමාන වේ.

**ප්‍රධාන කාර්යභාරයන්**

- රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරු, වෘත්තීය රෝගාබාධ සහ මරණයකදී නම් යැපෙන්නන්ට වන්දි අයකර දීමේ කටයුතු (2022 අංක 10 දරණ අවසන් සංශෝධනයට අනුව ලබාදිය හැකි උපරිම වන්දි මුදල රු. 2,000,000/=කි)
- බාල වයස්කරුවන් වයස් පූර්ණත්වයට පත්වන තුරු කම්කරු වන්දි කොමසාරිස් භාරයේ ජාතික ඉතිරි කිරීම් බැංකුවේ ගිණුම් පවත්වාගෙනයාම හා ඒවායේ පරිපාලන කටයුතු
- සේවකයන්ට සිදුවන අනතුරකදී සේවායෝජකයන් වන්දි ගෙවීම පැහැර හැරි අවස්ථාවල ඔවුන්ගේ නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා වන්දි මුදල් අයකර දීම
- කම්කරු වන්දි රක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, බලපත්‍ර අවලංගු කිරීමේ කටයුතු
- සේවකයකුට අනතුරක් සිදුවූ විට එම ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීම
- ලංකාවේ ලියාපදිංචි කර ඇති නැව්වල සහ ගුවන් නැව්වල සේවකයන්ට ලංකාවෙන් පිටත දී සිදුවන අනතුරු සඳහා වන්දි අයකර දීම

### 1.6.6 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

ශ්‍රී ලංකාව 1966 වසරේදී ආසියානු ඵලදායිතා සංවිධානයේ සාමාජිකත්වය ලබාගැනීමෙන් අනතුරුව ජාතික ඵලදායිතා සංවිධානය (NPO) ස්ථාපිත වූ අතර, මෙම කාර්යය වඩාත් පුළුල් කිරීම සඳහා 1994 වසරේදී ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ස්ථාපිත කරන ලදී. මෙමඟින් විවිධ ආයතන වෙත ඵලදායිතා සංකල්ප, මෙවලම් හා තාක්ෂණය හඳුන්වා දෙන ලදී. රාජ්‍ය, අධ්‍යාපන, සේවා හා නිෂ්පාදන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හා ප්‍රජා යන අංශ, ඵලදායිතා සංකල්ප තුලින් පෝෂණය කිරීම සඳහා වාර්ෂිකව විවිධ වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක වන අතර, ආසියානු ඵලදායිතා සංවිධානයේ (APO) නිරන්තර සහයෝගිතාව තුලින් "දැනුම කේන්ද්‍රික සමාජයක්" බිහිකිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය වී ඇත.

**අරමුණු**

- පුහුණු, පද්ධති හා ක්‍රියාවලි සංවර්ධනය සහ විශිෂ්ඨ අත්දැකීම් හුවමාරුව තුලින් දැනුම පාදක වූ සමාජයක් ගොඩනැගීම සඳහා ආයතනික විශිෂ්ඨත්වය සහ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම
- ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍රයන්හි ඵලදායිතාවය මැනීම, ඇගයීම සහ වර්ධනය සිදුකිරීම
- විවිධ අංශවල විවිධ තත්වයන් සැලකිල්ලට ගනිමින් ජාතික ඵලදායිතා ප්‍රමිතීන් සහ ඉලක්ක ස්ථාපිත කිරීම සහ අදාල අංශවල ප්‍රමුඛ කාර්ය සාධන දර්ශක සැකසීම
- ඵලදායිතා සංචලන සමග උපරිම ගැලපීම සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති ගැලපීම් පිළිබඳ උපදෙස් ලබාදීමේ දැක්මෙන් යුතුව, රාජ්‍ය අංශය හා සම්බන්ධ අමාත්‍යාංශ හා නියෝජිතායතන වල නව ප්‍රතිපත්ති තක්සේරු කිරීම
- ඵලදායිතා හා ගුණාත්මක ප්‍රවර්ධන සහ හවුල්කාරී වැඩසටහන් තුලින් ඵලදායිතා විඥාණය හා නිර්මාණශීලි සංස්කෘතියක් ආරෝපණය කිරීම

**ප්‍රධාන කාර්යයන්**

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඵලදායිතා සංකල්ප තුලින් සවිබල ගැන්වීම
- රාජ්‍ය අංශයේ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම
- රාජ්‍ය, අධ්‍යාපන, සේවා හා නිෂ්පාදන, සහ ප්‍රජා යන අංශ ඉලක්ක කර ගනිමින් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ඵලදායිතා විෂයන්ට අදාල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - ඵලදායිතා සහතික පත්‍ර පාඨමාලා වැඩසටහන
  - ඵලදායිතා කෙටිකාලීන පුහුණු පාඨමාලා වැඩසටහන
  - පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

- ආයතනවල ඵලදායිතා ප්‍රවර්ධනය සම්බන්ධව උපදේශන සේවාවන් ලබාදීම
- ආසියානු ඵලදායිතා සංගමය හා එක්ව පහත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම
  - e learning වැඩසටහන් පැවැත්වීම
  - තාක්ෂණික විශේෂඥ  සේවාවන් ලබාගැනීම තුලින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - ආදර්ශන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- "5S" සහතිකකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය හා සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම

### 1.6.7 ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ (2019 අංක 15 දරණ සංශෝධිත) පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු හා විදේශ රැකියා අමාත්‍යංශය යටතේ පවතින කම්කරු සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 06ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභසාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලාංකීය සේවා නියුක්තයන්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත. ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය ජාතික ලොතරැයි  මණ්ඩලය විසින් දිනුම් අදිනු ලබන ජාතික සම්පත ලොතරැයියෙන් ලැබෙන ආදායමයි. ජාතික සම්පත ලොතරැයි අලෙවි වර්ධනයත් සමඟ කම්කරු සුභ සාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන් ද වර්ධනය කර ගත හැක.

**අරමුදලේ අරමුණු**

- සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.
- සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින්  තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.
- හදිසි අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.
- සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.
- ව්‍යසන අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම.
- සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.
- කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබා ගැනීමට මූල්‍යමය සහන සැලසීම.

### 1.6.8 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලංකාවේ විදේශ රැකියා ක්ෂේත්‍රය පාලනය කිරීම සහ නියාමනය කිරීම, ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවේ නියුක්ත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ආරක්ෂාව සහ සුබසාධනය මෙන්ම, ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම යන මුඛ්‍ය පරමාර්ථ පෙරදැරි කරගෙන 1994 අංක 4 සහ 2009 අංක 56 දරන පනත් මගින් සංශෝධිත 1985 අංක 21 දරන පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ස්ථාපනය කර ඇත. බත්තරමුල්ල ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත ප්‍රධාන මෙහෙයුම් අංශ 31ට අමතරව, පළාත් විගමනික සම්පත් මධ්‍යස්ථාන 09ක්, දිස්ත්‍රික් කාර්යාල 07ක්, පුහුණු මධ්‍යස්ථාන 02ක් සහ ගුවන් තොටුපොළ ඒකක 03ක් මගින් කාර්යාංශය මහජනතාවට සිය සේවා සැපයීම සිදු කෙරේ. 1,117 දෙනෙකුගෙන් සමන්විත ස්ථිර කාර්ය මණ්ඩලයක් සහිත මෙම ආයතනය ශ්‍රී ලංකාවේ විදේශ රැකියා ක්ෂේත්‍රය ශක්තිමත් කරමින් ජාතික ආර්ථිකයට මහඟු දායකත්වයක් ලබා දෙයි.

රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම මගින් පහත සඳහන් මූලික අරමුණු 04ක් අවධාරණය කර ඇති අතර, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මෙම ක්‍රියාකාරකම් අනුව පෙළගස්වා ඇත.

1. සුනිසි හා ඵලදායි රැකියා ප්‍රවර්ධනය කිරීමට ශ්‍රම විගමනය පාලනය කිරීම.
2. විගමනික ශ්‍රමික අයිතිවාසිකම් ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම සහ ඔවුන්ගේ පවුල්වල සුබසිද්ධිය තහවුරු කිරීම.
3. කුසලතා හා අර්ධ කුසලතා සහිත විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් රැකියා අවස්ථා දේශීය හා ගෝලීය ආර්ථිකයන්හි ප්‍රවර්ධනය කිරීම.
4. ශ්‍රම විගමනයේ ප්‍රතිලාභ හා ජාතික සංවර්ධනය සමඟ එහි ඇති සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සුවිශේෂී ප්‍රමුඛතා (ප්‍රධාන කාර්යයන්)**

- විදේශ රැකියා නියෝජිත ආයතන පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- විදේශ රැකියා අපේක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයින් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම/ විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයින් බඳවා ගැනීම.
- විගමනික ශ්‍රමිකයින් විසින් හෝ ඔවුන් වෙනුවෙන් යොමු කරනු ලබන පැමිණිලි විසඳීම.
- විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා සුභසාධන පහසුකම් සැලසීම.
- විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ නීති බලාත්මක කිරීම.
- ශ්‍රී ලාංකිකයින් සඳහා විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

## 1.6.9 ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම

රජයට අයත් එකම විදේශ රැකියා ඒජන්සිය වන ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පරිපාලිත ආයතනයක් වශයෙන් 1996 ඔක්තෝම්බර් මාසයේ සිට ස්ථාපිත කර ක්‍රියාත්මක වන ආයතනයකි.

**අරමුණු**

- ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය සිය ව්‍යාපාරික කටයුතු මෙහි මව් ආයතනය වන 1985 අංක 21 දරණ පනතින් බලාත්මක වූ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ සහ වෙනත් කිසියම් ව්‍යවස්ථාපිත නීතියක් හෝ නීති පසුබිමක් යටතේ කලින් කලට බලාත්මක වන නීති රීති වලට අනුකූලව පවත්වාගෙන යාම.
- ශ්‍රී ලංකාව තුළ හෝ විදේශීය වශයෙන් වෘත්තීමය, පරිපාලනමය තාක්ෂණීක හා කාර්මික සනීපාරක්ෂක, පුහුණු අර්ධ පුහුණු හෝ නුපුහුණු ගෘහස්ථ නොවන සහ සියලුම රැකියා වර්ගීකරණයන්ට අදාල සේවකයින් වෙත සුදුසුකම් තහවුරුව මත රැකියා පිරිනැමීම.
- මිනිස් බලය සැපයුම් වෙළඳ රක්ෂණ වාණිජ හෝ කර්මාන්ත වල පුද්ගලයන් ආයතන හා සංවිධාන වල පුද්ගලයන් ලෙස මෙන්ම එවැනි සේවා සැපයීම සදහා ක්‍රියාකාරීව සිටින ආයතන සමග අවබෝධතා ගිවිසුම් වලට එළැඹීම.
- විදෙස් රැකියා අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ශ්‍රමික පිරිස්වල හැකියාවන් ඉහල නැංවීමට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම නිපුණතාවය ඇති කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් කළමණාකරණය කිරීම

# දෙවන පරිච්ඡේදය

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීම, ඔවුන්ගේ සේවා සුරක්ෂිතතාවය සලසා දීම හා රට තුළ කාර්මික සාමය ස්ථාපනය සහ විදේශීය රැකියා වෙළඳපළ වෙත නිපුණ ශ්‍රමිකයින් යොමු කිරීම යන ක්ෂේත්‍රයන් යටතේ ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරමින් පවතී.

මෙරට ශ්‍රම බලකාය මිලියන 8.45ක් වන අතර ඉන් මිලියන 8.01ක් සේවා නියුක්තව සිටී. එම පිරිසෙන් රජයේ සේවකයන්, තමන්ගේ ව්‍යාපාරයක නිරත වන්නන් හා පවුලේ ව්‍යාපාරවලට දායකත්වය දක්වන්නන් හැරුණු කොට පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුක්ත මිලියන 3.56ක සේවා නියුක්තිකයන්ගේ වෘත්තිය අයිතිවාසිකම්, වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණය තහවුරු කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමෙන් රට තුළ කාර්මික සාමය පවත්වා ගැනීම හා එතුලින් මෙරට සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීමේ වගකීම මෙම අමාත්‍යාංශය සතුවේ.

එමෙන්ම, රැකියා සඳහා සංක්‍රමණය වීමෙන් ප්‍රතිලාභ ලබන ලෝකයේ බොහෝ රටවල් අතරින් ශ්‍රී ලංකාවද ප්‍රමුඛ ස්ථානයක සිටී. මෙරට සමස්ත විදේශ විනිමය ඉපැයීමවලින්, විදේශ රැකියාවලින් ලැබෙන ප්‍රේෂණ වැඩි දායකත්වයක් දක්වයි. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා රුපියල් බිලියන 1,950.8ක විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් මෙරටට ලැබී ඇති අතර පුද්ගලයින් 294,314ක දෙනෙකුගෙන් පිරිමින් 162,467 ක් සහ කාන්තාවන් 131,847ක් විදේශ රැකියා සඳහා පිටත්වීමට ලියාපදිංචි වී ඇත. මෙම තත්වය තුළ ශ්‍රී ලංකා ආර්ථිකයට සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ දායකත්වය පිළිගනිමින් විගමනික ශ්‍රමික ප්‍රේෂණ උපරිම තත්වයකට ගෙන ඒමටත් නුපුහුණු ශ්‍රමිකයන් වෙනුවට පුහුණු ශ්‍රමිකයින් විදේශගත කිරීමත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා රජය වැඩසටහන් රැසක් ආරම්භ කර ඇත.

අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන විසින් ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කළ ක්‍රියාකාරකම්හි 2023 වර්ෂයේ ලබා ඇති ප්‍රගතිය පිළිබඳ සාරාංශයක් මෙම පරිච්ඡේදයේ අඩංගු වේ.

## 2.1 අමාත්‍යංශය ළඟා කර ගත් ප්‍රගතිය

ශ්‍රී ලංකාව තුළ ආයෝජන හිතකාමී පරිසරයක් ඇති කිරීම උදෙසා මෙන්ම රටෙහි අනාගත අභිවෘද්ධිය අත්පත් කර ගැනීමට හැකි වන පරිදි පිළිගත් ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික තත්වයන්ට සහ කම්කරු ප්‍රඥප්ති හා ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් නෛතික ප්‍රතිපාදන සම්පාදනය කර දීම අමාත්‍යාංශය සතු කාලීන වගකීමකි. එහි දී පවත්නා අණ පනත්, නීති රීති වර්තමාන හා අනාගත වැඩ ලෝකයට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම මෙන්ම වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ද මෙම අමාත්‍යාංශය බැඳී සිටියි.

එමෙන්ම, විදේශ රැකියා විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම තුළින් විදේශ රැකියා අවස්ථා බහුල කර මෙරටට විදේශ විනිමය ගලා ඒම් වර්ධනය තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ වගකීම ද මෙම අමාත්‍යාංශයට ඇත. ඒ සඳහා පුහුණු ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා යොමු කිරීමටත් ඔවුන් සඳහා පුහුණුවීමේ අවස්ථා සුලබ කිරීමටත් විධිමත් පරිදි ආරක්ෂාකාරී ලෙස විදේශ ගතවීම් සඳහා අවශ්‍ය මඟ පෙන්වීම, පහසුකම් සැලසීම ද සිදු කරනු ලබයි. එමෙන්ම, සංක්‍රමණික සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල යහපැවැත්ම, ආරක්ෂාව සහ සුබසාධනය ඉහළ නැංවීම වෙනුවෙන් කටයුතු කිරීමේ වගකීම ද මෙම අමාත්‍යාංශය සතු වේ.

රට තුළ පවත්නා ආර්ථික අර්බුදකාරී අවස්ථාවේ දී වුවද කාර්මික සාමය පවත්වාගෙන යමින් කම්කරු ජනතාව වෙනුවෙන් විශේෂ ජයග්‍රහණ රැසක් අත්පත් කර දීමට සහ විදේශ රැකියා අවස්ථා සුලබ කිරීම තුළින් මෙරට විදේශ ප්‍රේෂණ ඉහළ නැංවීමට දායකවීමට අමාත්‍යාංශයට හැකි විය.

- **කම්කරු හා විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නෛතික හා ප්‍රතිපත්තිමය රාමුව ශක්තිමත් කිරීම**

**සේවකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ අරමුණින් කම්කරු නීති වඩාත් ශක්තිමත් කිරීම**
කම්කරු දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද 1923 කාලයේ සිට පනවන ලද ආඥා පනත් හා පසුකාලීනව පනවන ලද පනත් 50ක් පමණ ශ්‍රී ලංකාව තුළ කම්කරු සුභසාධනය, හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා වර්තමානයේ දී ක්‍රියාත්මක වෙමින් පවතී. ශ්‍රී ලාංකීය ශ්‍රම බලකාය මුහුණ දෙන වර්තමාන හා අනාගත කාලීන අභියෝග ජයගැනීම සඳහා සුදුසු වන ආකාරයට පවත්නා කම්කරු නීති සංශෝධනය කිරීමට සහ අළුතින් නීති සකස් කිරීමට අමාත්‍යාංශය විසින් පියවරයන් ගෙන තිබේ. වර්තමාන කම්කරු නීතියෙහි පවත්නා සංකීර්ණතා සහ ප්‍රායෝගික භාවිතයේ දී මතුවන ගැටළු හඳුනාගෙන සේව්‍ය - සේවක හා රාජ්‍ය යන ත්‍රෛපාර්ශවය වෙතම නීතියේ ආවරණය සැලසෙන පරිදි කම්කරු නීති සංශෝධනය හා නව නීති පැනවීම කෙරෙහි අමාත්‍යාංශයේ අවධානය යොමු වී ඇත.

**වර්තමානයට ගැලපෙන ප්‍රතිපාදන සහිතව නව සේවා නියුක්ති පනතක් සකස් කිරීම**
කම්කරු දෙපාර්තමේන්තුව විසින් දැනට බලාත්මක කරනු ලබන අණපනත් වර්තමාන සමාජ ආර්ථික වෙනස්කම් හා ඒ හා බැඳුනු වැඩ ලෝකයේ වෙනස්කම් ආමන්ත්‍රණය සඳහා යෝග්‍ය නොවේ. සේවක ප්‍රජාවගේ අයිතිවාසිකම් තහවුරු කරමින් ව්‍යාපාරවල අඛණ්ඩ පැවැත්ම හා විදේශ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ පහසුකම් සලසන කම්කරු නීතියක අවශ්‍යතාවය ඉස්මතු වී තිබේ. එසේම, පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීම අවශ්‍ය වේ. මේ සඳහා වෘත්තීය සමිති, හාම්පුතුන් ඇතුළු විවිධ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා වාර 08ක් පවත්වා දැනට ක්‍රියාත්මක පනත් 13ක ප්‍රතිපාදන සංශෝධනය විය යුතු ආකාරය පිළිබඳ අදහස් ලබා ගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව පත් කළ කමිටුව විසින් කෙටුම්පත් කරන ලද නව සේවා නියුක්ති පනත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් ඇත.

**1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල පනත සංශෝධනය කිරීම**
සාප්පු හා කාර්යාල පනත සේවක සුභසාධනයට සහ වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීමේ අවශ්‍යතාවක් පවතින අතර පහත සඳහන් සංශෝධයන් සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

- දැනුම් ක්‍රියාවලිය බාහිරින් සපයා ගැනීමේ ආයතන (KPO), ව්‍යාපාර ක්‍රියාවලිය බාහිරින් සපයා ගැනීමේ ආයතන (BPO) සහ වෙනත් රටවල පිහිටි ව්‍යාපාර ආයතන හා එම සමාගම්වල ගිණුම්, පරිපාලන කටයුතු කරනු ලබන කාර්යාල වැනි ආයතනවල සේවයේ නියුතු කාන්තා සේවිකාවන්ට රාත්‍රී සේවයේ යෙදීමට අවස්ථාව ලබා දීම

- රාත්‍රී සේවයේ යොදවනු ලබන කාන්තාවන් වෙනුවෙන් ප්‍රවාහන පහසුකම්, ආරක්ෂාව හා සේවය කරන ස්ථානයට අදාළ පොදු පහසුකම් ලබා දීමට අදාළ නියෝග සෑදීමේ බලය ලබා දීම

- ඉටු කරන සමාන සේවයක් හෝ වැඩක් සඳහා ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සමාන වේතන ගෙවීම සඳහා සේවායෝජකයන්ට නියම කිරීම

පනත පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට නියමිතය අවසන්

**1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම**
සේවක සුභසාධනයට සහ වර්තමාන සමාජ ආර්ථික තත්ත්වයට ගැළපෙන පරිදි සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කළ යුතුය. සේවකයෙකු ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයක් යටතේ හෝ වර්තමාන වැඩ ලොව අවශ්‍යතා මත වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට පෙර විශ්‍රාම ගැනීමේදී සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීමට ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරනු ලැබේ.

- **විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නෛතික සහ ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම**

**රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම 2023-2027 යාවත්කාලීන කිරීම සහ විෂය පථය පුළුල් කිරීම**

සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් යාවත්කාලීන කරන ලද රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම 2023.09.04 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙරට ශ්‍රම සංක්‍රමණය සඳහා වූ ප්‍රවේශයේ සැලකිය යුතු ඉදිරි පියවරක් සනිටුහන් කරමින් 2023.10.25 දින සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් නිල වශයෙන් එළි දක්වන ලදී. 2024 වසරේ මුල් කාර්තුව තුල රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ මූලික පියවරක් ලෙස රැකියා සඳහා විගමනය පිළිබඳ ජාතික උපදේශක කාරක සභාව රැස් කර ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් මෙහෙයුම් කමිටු පිහිටු වීමට අපේක්ෂා කෙරේ.

**1985 අංක 21 දරන විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීම**

මෙම අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ගේ හා සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනතට අදාල යෝජිත සංශෝධනයන් හඳුනා ගෙන ඇති අතර යෝජිත සංශෝධන සහිත කෙටුම්පත රජයේ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. රජයේ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ සම්බන්ධයෙන් රැස්වීම් මාලාවක් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන් හා අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි. එහිදී ගන්නා ලද තිරණ රජයේ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත.

- **ජාත්‍යන්තර සහයෝගිතාව තුළින් විගමනික ශ්‍රමිකයන් සවිබල ගැන්වීම**

**ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් පවත්වාගෙන යාම**

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම්, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා උපයෝගී කර ගැනීමට අදාළ වගකීම මෙම අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබයි.

කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා අනෙකුත් බහුපාර්ශවීය නියෝජිත ආයතන උදෙසා සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ බැඳීම හා වගකීම් සපුරා ඇති බව සහතික කිරීම හා කම්කරු ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, ජාතික මට්ටමේ සමාජ සංවාද ඇති කිරීම සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහාය ලබා ගැනීමටද කටයුතු කරනු ලැබේ. මෙම ඉලක්කය සපුරාලීමට 2022 වසර තුළ පහත පියවර ගෙන ඇත.

1. **ශ්‍රම බලකාය බලගැන්වීම සහ ආරක්ෂා කිරීම**

   I. ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්ත ජාතික කම්කරු උපදේශක සභා (NLAC) රැස්වීමේදී පහසුකම් සපයන්නා ලෙසට ක්‍රියා කිරීම. 2022 වර්ෂය තුළ රැස්වීම් හතරක් පැවැත්වීම මගින් පහත ක්‍රියාමාර්ග සිදු කර ඇත.
      I. ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගීත්වය වැඩි කිරීම සඳහා සාප්පු හා කාර්යාල සේවක පනත සංශෝධනය කිරීම සඳහා තීරණය කරන ලදී.
      II. සේවක අර්ථසාධක අරමුදලේ 30% හිමිකම් ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන පරිපාලන ක්‍රියාවලිය ලිහිල් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී
      III. අයවැය සහන දීමනා දෙකක් ඇතුලත් කර අවම වැටුප රු.21,000.00 ක් දක්වා වැඩි කිරීමට යෝජනා විය
      IV. රු.1,000.00 දෛනික වැටුප් ගෙවීම සම්බන්ධ වතුකරයේ ගැටළු වෘත්තීය සමිති නායකයන් විසින් ඉදිරිපත් කළ අතර ඒ පිළිබඳව සාකච්ඡා කරන ලදී

II. දැනට පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ශ්‍රම වෙළඳපොළ තුළ ඇතිවී තිබෙන ගැටළු හදුනාගෙන ඒවාට විසදුම් සෙවීම සඳහා ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්තව කමිටුවක් පත්කර එයට අදාළ කටයුතු සංවිධානය කිරීම හා ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් සාකච්ඡා වාරයක් පැවැත්වීම හා එහිදී සමාජ ආරක්ෂණය සහ රැකියා විරහිත වූවන් සඳහා රක්ෂණ පහසුකම් සැපයීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල නියෝජනය වන පරිදි කමිටුවක් පිහිටුවීම සඳහා ගරු කම්කරු අමාත්‍යතුමා විසින් උපදෙස් දෙන ලදී.

III. කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත් ප්‍රතිපත්තීන් සංශෝධනය කිරීම හා නව පනත් ආරම්භ කිරීම පිළිබඳ කරුණු, ප්‍රවණතාවන්, කම්කරු නීති හා ප්‍රතිපත්තී සම්බන්ධයෙන් අමාත්‍යාංශ කමිටු රැස්වීම් පැවැත්වීම

අ. සාප්පු කාර්යාල සේවක පනත සංශෝධනය කිරීම සඳහා සාකච්ඡා 02ක් පැවැත්වීම

- දැනුම් ක්‍රියාවලිය බාහිරින් සපයා ගැනීමේ ආයතන (KPO), ව්‍යාපාර ක්‍රියාවලිය බාහිරින් සපයා ගැනීමේ ආයතන (BPO) සහ වෙනත් රටවල පිහිටි ව්‍යාපාර ආයතන සම ගිණුම් පරිපාලන කටයුතු කරනු ලබන කාර්යාල වැනි ආයතනවල සේවයේ නියුතු කාන්තා සේවිකාවන්ට රාත්‍රී සේවයේ යෙදීමට අවස්ථාව ලබා දීම
- රාත්‍රී සේවයේ යොදවනු ලබන කාන්තාවන් වෙනුවෙන් ප්‍රවාහන පහසුකම්, ආරක්ෂාව හා සේවය කරන ස්ථානයට අදාළ පොදු පහසුකම් ලබා දීමට අදාළ නියෝග සෑදීමේ බලය ලබා දීම
- ඉටු කරන සමාන සේවයක් හෝ වැඩක් සඳහා ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සමාන වේතන ගෙවීම සඳහා සේවා යෝජකයන්ට නියම කිරීම
- ජපානයේ එහිම් ප්‍රාන්තය හා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට අයත් විදේශ රැකියා අංශය අතර අත්සන් කිරීමට යෝජිත අවබෝධතා ගිවිසුමට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කිරීම

IV. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහයෝගීතාවය ඇතිව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති හා වැඩමුළුවලට අදාළව සියලු සම්බන්ධීකරණ කටයුතු කිරීම

V. වාර්ෂිකව යැවිය යුතු ශ්‍රම සංඛ්‍යාලේඛන පිළිබඳ ප්‍රශ්නාවලියට පිළිතුරු ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත සැපයීම

VI. සංගමයේ නිදහසට ඇති අයිතිය උල්ලංඝනය කිරීම සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රඥප්ති අංක 87 සමඟ ඵලදායී ලෙස අනුකූල වීම සහතික කිරීමට ශ්‍රී ලංකා රජය අසමත්වීම යන මැයෙන් වෘත්තීය සමිති මඟින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සඳහා අදාළ ආයතන වෙතින් තොරතුරු ලබා ගෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත වාර්තා දෙකක් ඉදිරිපත් කිරීම

VII. සාම්ප්‍රදායික වහල්භාවය, ණයගැති බව, බලහත්කාර ශ්‍රමය, ලිංගික වහල්භාවය, බාල විවාහ සහ වහල් විවාහ වැනි සමකාලීන වහල්භාවයේ හේතු සහ ප්‍රතිවිපාක පිළිබඳ වාර්තා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු ටොමෝයා ඔබකෝටා මහතාගේ ලක්දිව සංචාරයට අදාළව වාර්තා සැපයීම

VIII. ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංගමයේ වාර්ෂික තොරතුරු යාවත්කාලීන කිරීම

IX. විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් රජයේ අමාත්‍යාංශ වෙත කම්කරු ක්ෂේත්‍රයට අදාළවන නව ප්‍රවණතා පිළිබඳව වාර්තා සම්පාදනය කිරීම

X. තාක්ෂණික සහය ලබා දීම වෙනුවෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිලධාරීන් සඳහා වීසා ඉල්ලීම් ලිපි විදේශ අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම

XI. ජාත්‍යන්තර කම්කරු සම්මේලනයේ සම්මත කර ගන්නා ලද සම්මුතීන් හා නිර්දේශ පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම



**ඡායාරූපය 2.1** - ජාතික කම්කරු උපදේශන සභාව රැස්වීම

**අවබෝධතා ගිවිසුම් / එකඟතාః**

විදේශ රැකියා අංශයේ ප්‍රවර්ධනය, මානව හැකියාවන් වර්ධනය කිරීම, ජාත්‍යන්තර සමාජ ආරක්ෂක වැඩසටහන්, පුහුණු වැඩසටහන්, නීති කටයුතු සහ අන්‍යෝන්‍ය සබඳතා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය රටවල් සමඟ ගිවිසුම් ගණනාවකට එළඹ තිබේ. දැනට එවැනි අවබෝධතා ගිවිසුම් / එකඟතා දහනවයක් (19) සක්‍රීයව ක්‍රියාත්මක කෙරේ.

ඒ යටතේ නව අවබෝධතා ගිවිසුම්/එකඟතා පහත පරිදි වේ.

- ශ්‍රී ලංකා රජය හා ජපානයේ එහිමෙ ප්‍රාන්තය අතර කෘෂිකාර්මික හා අනෙකුත් ක්ෂේත්‍රයන්ට අදාල සහයෝගීතා ගිවිසුම 2023 ජුනි මස 07 දින අත්සන් කරන ලදී.
- නවසීලන්තය රජය විසින් අරමුදල් සපයන ජාත්‍යන්තර සංක්‍රමණ ප්‍රතිපත්ති සංවර්ධන මධ්‍යස්ථානය (ICMPD) විසින් කළමනාකරණය කරනු ලබන විගමනික සම්පත් මධ්‍යස්ථානයක් (MRC) පිහිටුවීම සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුම 2023.12.11 දින අත්සන් කරන ලදී.
- විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා පහත සඳහන් රටවල් සමඟ අවබෝධතා ගිවිසුම්/ එකඟතා අත්සන් කිරීමට අදාලව කෙටුම්පත් හුවමාරු කර ගෙන ඇත.
  - රුමේනියාව - රැකියා සහ මිනිස්බල ක්ෂේත්‍ර
  - ඉතාලිය - සංක්‍රමණය සහ සංචලන හවුල්කාරිත්වය
  - තුර්කිය - ශ්‍රී ලංකා රජය හා තුර්කි රජය අතර ශ්‍රම සංක්‍රමණය පිළිබඳ යෝජිත එකඟතාව



**ඡායාරූපය 2.2** - ජපාන රජය සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් තැබීම

- විදේශ රැකියා සම්බන්ධයෙන් ගමනාන්ත රටවල් සමඟ දැනට පවතින අවබෝධතා ගිවිසුම් / ද්වි පාර්ශවික එකඟතා සමාලෝචනය කිරීම
  පහත සඳහන් එකඟතා/ අවබෝධතා ගිවිසුම් සමාලෝචනය කිරීම සම්බන්ධ තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා අදාල රාජ්‍යයන් වෙත යොමු කර ද්විපාර්ශවීය ලෙස අදහස් හුවමාරු කර ගනිමින් පවතී.
  - සීෂෙල්ස් රාජ්‍යය - මිනිස්බල ක්ෂේත්‍රය

- කොරියානු ජනරජය - රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ ශ්‍රමිකයින් පිටත් කර යැවීම හා ලබා ගැනීම
- මැලේසියාව - ශ්‍රමිකයින් බඳවා ගැනීම, සේවා නියුක්ත කිරීම හා නැවත ගෙන්වා ගැනීම

**ඒකාබද්ධ කමිටු රැස්වීම් ;**

ශ්‍රී ලංකාව හා ඕමාන රාජ්‍යය අතර ශ්‍රම සහ පුහුණු ක්ෂේත්‍රයෙහි අවබෝධතා ගිවිසුම යටතේ ඒකාබද්ධ කමිටු රැස්වීම පැවැත්වීම සම්බන්ධව නාම යෝජනා ඕමාන පාර්ශවය වෙත යොමු කර ඇති අතර ඉදිරියේදී ඒකාබද්ධ කමිටු පැවැත්වීමට නියමිතය.

**ගෝලීය / කලාපීය සංසද ;**

- කොළඹ ක්‍රියාදාමය
  පිලිපීනය සභාපතිත්වය දරන පෙර විගමනය සහ බලගැන්වීම පිළිබඳ පස්වන (5) හා හයවන (6) වන තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් පිළිවෙලින් 2023-03.14,15 සහ 2023.08.16,17 දක්වා පිලිපීනයේදී හා තායිලන්තයේදී පැවැත්විණි.
  සංක්‍රමණික අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම ආසියාවේ සංක්‍රමණික සේවකයින් සඳහා අනාගත පිළියම් සෙවීමේ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම තුළින් ශ්‍රම සංක්‍රමණයේ ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම මෙහි අරමුණු විය. තවද 2023-2027 වර්ෂ සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීම ද සිදු විය.

  ශ්‍රී ලංකා රජයේ නායකත්වය යටතේ, ආසියානු රටවල් සඳහා විදේශ රැකියා සහ ගිවිසුම්ගත ශ්‍රමය පිළිබඳ කලාපීය උපදේශන ක්‍රියාවලිය; කොළඹ ක්‍රියාදාමය සිය තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් (TAWGs) දෙසැම්බර් 12 සිට 14 දක්වා පැවැත් වූ අතර, කොළඹ ක්‍රියාවලි සාමාජික රටවල් 11 ක නියෝජිතයින් සහ සිවිල් සමාජය මෙන්ම එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන ද එක් විය.

  මෙම අවස්ථාවට තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම් (TAWG) තුනක ඒකාබද්ධ රැස්වීමක් ඇතුළත් විය. එනම් කුසලතා සහ සුදුසුකම් හඳුනාගැනීම (S&Q), ලාභදායි, වේගවත් සහ ආරක්ෂිත ප්‍රේෂණ මාරු කිරීම, සහ සාධාරණ හා සදාචාරාත්මක බඳවා ගැනීමේ පිළිවෙත් (FERP), මෙන්ම නැවත ඒකාබද්ධ කිරීමේ මාර්ගෝපදේශ අත් පොත එළි දැක්වීම සිදු කරන ලදි.

- අබුඩාබි සංවාදය
  අබුඩාබි සංවාදයේ හත්වන (7) අමාත්‍ය මණ්ඩල රැස්වීම 2024 පෙබරවාරි මස 10 හා 14 වන දිනයන් හිදී අබුඩාබි හිදී පැවැත්වීමට නියමිතය.

- සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් විගමනය සඳහා ගෝලීය සම්මුතිය (GCM)
  පිලිපීන ජනරජයේ විගමනික සේවකයින්ගේ දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානය (IOM), ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සහ එක්සත් ජාතීන්ගේ ජාලයේ සහයෝගය ඇතිව ආසියා - ගල්ෆ් සහයෝගිතා කවුන්සිලයේ (GCC) ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සංවාදය තිරසර සංවර්ධන ඉලක්ක 10.7 සහ සුරක්ෂිත, ක්‍රමවත් හා විධිමත් විගමනය සඳහා ගෝලීය සම්මුතියේ 17 වන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා 2023 මැයි 30-31 දිනවල පිලිපීනයේ Taguig නගරයේදී පැවැත්විණි.

  කොළඹ ක්‍රියාවලිය සහ අබුඩාබි සංවාදය ඇතුළු දැනට පවතින කලාපීය උපදේශන ක්‍රියාවලීන් පිළිබඳව ශ්‍රම සංචලනය ගොඩනැගීමේ පොදු අවශ්‍යතා පිළිබඳ ගැටලු සාකච්ඡා කිරීමට මෙම සංවාදය තුල දී අවස්ථාව හිමි වී තිබිණි.

- ශ්‍රී ලාංකිකයින් සඳහා ආරක්ෂිත හා නිත්‍ය වූ ශ්‍රම සංක්‍රමණය - අදියර IV
  "ශ්‍රී ලාංකිකයින් සඳහා ආරක්ෂිත හා නිත්‍ය වූ ශ්‍රම සංක්‍රමණය" නැමැති ව්‍යාපෘතිය කම්කරු හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකාවේ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය හා එක්ව ස්විස් සංවර්ධන සහයෝගීතාවයේ මූල්‍ය ප්‍රදානය යටතේ

ක්‍රියාත්මක කරන අතර මේ වන විට එය හතරවන අදියරෙහි පසුවෙයි. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලාංකික විගමනික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල යහපැවැත්ම ශක්තිමත් කිරීමයි. මෙම ව්‍යාපෘතියේ ජාතික පාර්ශවකරුවන් වශයෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) හා අයි.ඊ.එස්.සී.ආයතනය (IESC) ක්‍රියාත්මක වන අතර දිස්ත්‍රික්ක මට්ටමේ පාර්ශවකරුවන් ලෙස අනුරාධපුරය දිස්ත්‍රික්කය තුළ SAFE ආයතනය, පුත්තලම දිස්ත්‍රික්කය තුළ VOICE ආයතනය, වවුනියාව දිස්ත්‍රික්කය තුළ FIRM ආයතනය, මහනුවර දිස්ත්‍රික්කය තුළ SAMADANA ආයතනය සහ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ CHRCD ආයතනය කටයුතු කරයි. 2024 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලි. 175 ක් වෙන් කර ඇත.

**විදේශ රැකියාවල නියුතුව සිට මෙරටට පැමිණි පුද්ගලයින් / ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සහ අදාළ ප්‍රජාවගේ ආර්ථිකය නඟා සිටුවීමේ ව්‍යාපෘතිය**

විගමනික ශ්‍රමිකයින් සඳහා වන ජාතික කොවිඩ් 19 ප්‍රතිචාර සැලැස්ම අනුව සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මැදිහත්වීමෙන් ජපන් රජයේ මූල්‍ය දායකත්වයෙන් 2023 වර්ෂයේ පොල් කටු අඟුරු හා පරිසර හිතකාමී මලු නිෂ්පාදනය සහ අලෙවිකරණ ව්‍යාපෘති 01 ක් හා මිරිස් ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් ව්‍යාපෘති 01ක් ක්‍රියාත්මක කරන ලදී. මේ වන විට මෙම ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්ක 09ක ව්‍යාපෘති 20 ක් අවසන් කොට ප්‍රජා අයිතියට පවරා දී ඇති අතර මේ සඳහා රු. 144,021,133.74 පිරිවැයක් දරා ඇත.

**ශ්‍රී ලංකාවේ විදේශ සහ දේශීය රැකියා වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතියක් (IGRS) ඇති කිරීම**

මෙම අමාත්‍යාංශය විසින් අදාල පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවයෙන් ජාත්‍යන්තර සංක්‍රමණ ආයතනයේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ විදේශ සහ දේශීය රැකියා වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතියක් (IGRS) ස්ථාපිත කරන ලදී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් විදේශ රැකියා ක්ෂේත්‍රය මුහුණ දෙන ප්‍රධාන අභියෝගවලට විසඳුම් සෙවීමට සහ තිරසාර ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු සාක්ෂාත් කර ගැනීමට සුවිශේෂී අවස්ථාවක් සැලසේ.

මෙහි පළමු පියවර ලෙස, මෙම අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ පිහිටි ජාත්‍යන්තර සංක්‍රමණ ආයතනය (IOM Sri Lanka) ඇතුළු අනෙකුත් අදාල ආයතනවල ප්‍රධානත්වයෙන් යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගික උපදෙස් සහ මාර්ගෝපදේශ සැපයීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් (PSC) පිහිටුවන ලදී. නිල වශයෙන් දියත් කිරීම 2023 ජූලි 15 වැනි දින සිදු කරන ලද අතර මේ වනවිට සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

**විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම**

විගමනික ශ්‍රමිකයින්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්, නැවත පැමිණි විගමනික ශ්‍රමිකයින් සහ විදේශ රැකියා ගත වීමට අපේක්ෂිත පිරිස් එක්රැස් කරමින් ඔවුන් සමාජය තුළ සවිබල ගැන්වීම හා ඔවුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප වැඩිදියුණු කිරීම හරහා ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස සමාජගත කිරීම අරමුණු කරගනිමින් විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම සංවර්ධන නිලධාරින්ගේ (විදේශ රැකියා) මැදිහත්වීම මත සිදු කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව මේ වනවිට දිවයින පුරා විගමනික ශ්‍රමික සංගම් 3662 ක ප්‍රමාණයක් පිහිටුවා ඇත. එසේම ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමේ විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම ද මේ වනවිට ආරම්භ කර ඇති අතර, ගම්පහ, මාතලේ, ගාල්ල, මාතර, හම්බන්තොට, ත්‍රිකුණාමලය, පුත්තලම, රත්නපුර සහ කෑගල්ල යන දිස්ත්‍රික්කයන්ට අදාලව දිස්ත්‍රික් විගමනික ශ්‍රමික සංගම් ද මේ වනවිට පිහිටුවා අවසන් කර ඇත.

### 2.1.1 කම්කරු ක්ෂේත්‍රය

**කම්කරු දෙපාර්තමේන්තුව**

- **කාර්මික සාමය සුරක්ෂිත කිරීම මඟින් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම**
  අන්තර්ජාතිකව තරඟකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම කම්කරු දෙපාර්තමේන්තුවෙහි දැක්ම වන හෙයින් කාර්මික සාමය පවත්වා ගැනීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික හා අත්‍යවශ්‍ය කාර්යය වේ.

  මූලික වශයෙන් සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවක් පවත්වාගෙන යාම, ඒකාබද්ධ ශ්‍රමික පරීක්ෂණ සිදු කිරීම, ව්‍යවස්ථාපිත හිමිකම් අහිමිවීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම, ශ්‍රමිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම යන ප්‍රධාන කාර්යයන් හතර යටතේ කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

- **සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම**
  පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන, සුනිසි වැඩ පරිසරයක් තහවුරු කිරීම සඳහා එම අංශයන්හි ආයතන වල සේව්‍ය සේවක දෙපාර්ශවයම කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් මෙන්ම රාජකාරී කටයුතු සිදු කිරීමේදී කම්කරු නීති පිළිබඳව දැනුවත්භාවක් ලැබිය යුතු අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්ද දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කොට පවත්වන ලදී.

**වගුව 2.1** 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

| වැඩසටහනෙහි ස්වභාවය | වැඩසටහනෙහි නම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| සමාජ කතිකාව ප්‍රවර්ධනය | මානව සම්පත් සංවර්ධන අංශය විසින් පැවැත්වූ සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන් | 367 | 25,975 |
| | දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල විසින් පැවැත්වූ සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන් | 193 | 9274 |
| | දිස්ත්‍රික් උපදේශන සභා වැඩසටහන් | 79 | 2245 |
| | කලාප සමාජ වේදිකා වැඩසටහන් (Zoom තාක්ෂණය මගින්) | 33 | Zoom තාක්ෂණය මගින් |
| වෘත්තීය සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය | වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳව පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන් | 147 | 4849 |
| වෘත්තීය සෞඛ්‍යය ප්‍රවර්ධනය | සේව්‍යයන් සහ සේවකයන් සඳහා වූ අධ්‍යාපනික හා පුහුණු වැඩසටහන් | 80 | 2439 |
| | සේව්‍යයන් සහ සේවකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | 349 | 36,394 |
| ස්ත්‍රීන් සහ තරුණ අයගේ සේවයේ නියුක්ත කරවීමේ අයිවාසිකම් ආරක්ෂා කිරීම සහ ළමා ශ්‍රමය පිටු දැකීම | පෞද්ගලික අංශයේ සේවිකාවන් සඳහා කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් | 28 | 840 |
| | ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ළමා ශ්‍රමයෙන් තොර කලාප පිහිටුවීම යටත් 2023 වර්ෂයේදී සිදු සිදු කරනු ලැබූ දැනුවත් කිරීමේ වැඩසටහන් | 10 | 1800 |
| **එකතුව** | | **1286** | **32,635** |

**දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් ඇති වූ සාධනීය වෙනස**

- සමාජ කතිකාව ප්‍රවර්ධනය උදෙසා ආයතන මට්ටමින් වැඩසටහන් පැවැත්වීම මගින් 2023 වර්ෂය තුළදී, නිෂ්පාදන ආයතන දෙකක ඇති වූ වැඩ වර්ජන සාකච්ඡා මගින් අවසන් කිරීමට හැකි විය. එමගින්, දළ වශයෙන් දේශීය ආර්ථිකයට අහිමි වීමට අවස්ථාව තිබූ මිනිස් දින 1325ක් නිෂ්පාදන ක්‍රියාවලියට නැවත දායක කරගැනීම තුළින් ජාතික ආර්ථික වර්ධනයට දායක කරවීමට හැකි වී ඇත. එසේම, තවත් ආයතන හයක ඇතිවූ එම ආයතනයන්හි නිෂ්පාදන හා සේවා සැපයුම් වලට දැඩි අහිතකර බලපෑමක් ඇති කරන ලද කාර්මික ආරවුල් නිරවුල් කර ගැනීමටද මෙමගින් හැකි වී ඇත. මෙම ආයතනයන්හි සේව්‍ය සේවක දෙපිරිස අතර කතිකාව තිරසාරව පවත්වාගෙන යාම සඳහා සමාජ කතිකා කව ද පිහිටුවන ලදී.

- සේවා ස්ථානයන්හි ඇතිවන මාරක අනතුරු සංඛ්‍යාව අඩු වීම. (2022 වර්ෂයේ සිදු වූ මාරක අනතුරු සංඛ්‍යාව 66ක් වූ අතර 2023 වර්ෂයේදී එය 64 දක්වා අඩු වී ඇත.)


- **පරීක්ෂණ සිදු කිරීම**
  සේවා යෝජකයන් විසින් සේවකයන් සේවයේ නියුක්ත කරවීමේ නීති නිසි පරිදි අනුගමනය කරනු ලැබේද යන්න පරීක්ෂාවට ලක් කර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සේව්‍ය සේවක දෙපාර්ශවය අතර ගැටළු ඇති වීම අවම කර සම්බන්ධතාවය වර්ධනය කිරීම උදෙසා 2023.01.01 සිට 2023.12.31 දක්වා සිදු කරන ලැබූ පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**වගුව 2.2** පරීක්ෂණ සිදු කිරීම්- 2023.01.01 සිට 2023.12.31 දක්වා ප්‍රගතිය


| පරීක්ෂණය | සංඛ්‍යාව |
|---|---|
| දිස්ත්‍රික් සහ උප කම්කරු කාර්යාලයන්හි කම්කරු නිලධාරීන් විසින් සිදු කල ශ්‍රමික පරීක්ෂණ සංඛ්‍යාව | 65,453 |
| ළමා ශ්‍රමය සහ කාන්තාවන් සේවයේ යෙදවීමට අදාලව සිදු කරනු ලැබූ පරීක්ෂණ සංඛ්‍යාව | 482 |
| සේවකයින්ගේ සුරක්ෂිතතාවයට අදාලව සිදු කරනු ලැබූ පරීක්ෂණ සංඛ්‍යාව | 3044 |
| සේවකයින්ගේ වෘත්තීය සෞඛ්‍යය සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ පරීක්ෂණ සංඛ්‍යාව | 2445 |
| **එකතුව** | **71,424** |

- **ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම**
  දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වෙත සහ දිස්ත්‍රික් හා උප කාර්යාල වෙත සේවකයන් හෝ වෘත්තීය සමිති විසින් සිදු කරනු ලැබූ ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංගනය වීම් පිළිබඳව සහ කාර්මික ආරාවුල් සම්බන්ධයෙන් ලැබූ පැමිණිලි විසඳීමට කටයුතු කරන ලදී. එසේම, සිදු කරනු ලැබූ පැමිණිලි විමර්ශනයක් හෝ ආයතන පරීක්ෂණයක් සම්බන්ධයෙන් සෑහීමට පත්නො වන අයකු විසින් විධිමත් පරීක්ෂණයක් සිදු කරවා ගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත සිදු කරනු ලබන ඉල්ලීම් අවශ්‍යතාවය පරිදි නැවත විමර්ශනය කිරීමද සිදු කරන ලදී.

**ප්‍රස්තාරය 2.1 -** 2019 වර්ෂයේ සිට 2023.09.30 දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම්




**ප්‍රස්තාරය 2.2 -** 2019 වර්ෂයේ සිට 2023.09.30 දක්වා කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා නිරවුල් කිරීම්




- **වැඩ වර්ජනවලිදී අදාළ මැදිහත්වීම් සිදු කිරීම**

  කාර්මික ආරවුලක් වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ වහාම දෙපාර්තමේන්තුව විසින් එම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කරනු ලබන අතර, වැඩ වර්ජනයක් ඇති වුවහොත් ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කර විසඳීමට කටයුතු කරනු ලැබේ. 2023.01.01 සිට 2023.12.31 දක්වා වාර්තා වූ වැඩ වර්ජන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**වගුව 2.3** 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

| ක්ෂේත්‍රය | වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව | සහභාගී වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව |
|---|---|---|---|
| වතු | 04 | 842 | 1797 |
| ඉදි කිරීම් | - | - | - |
| නිෂ්පාදන | 02 | 101 | 4662 |
| පතල් හා කැණීම් | - | - | - |
| නවාතැන් හා ආහාර සැපයුම් | - | - | - |
| අර්ධ රාජ්‍ය | - | - | - |
| වෙනත් සේවා | 01 | 70 | 70 |
| **එකතුව** | **07** | **1013** | **2329** |

- **සාමූහික ගිවිසුම් සඳහා සේව්‍ය - සේවක දෙපාර්ශවය පෙළඹවීම**
  සාමූහික ගිවිසුම් වලට එලඹීම මගින් සේවකයන් වෙත කම්කරු නීති රීති වලින් හිමිකර දී ඇති අයිතිවාසිකම් වලට වඩා වැඩි වරප්‍රසාද හිමි වනවා මෙන්ම සේවායෝජක පාර්ශවයන්ට සේවකයන් වෙතින් වඩා ඵලදායී සේවාවක් ලබා ගැනීම සඳහා අදාල කොන්දේසි වෙත එළඹීමට හැකියාව ලැබේ.

  සමාජ කතිකාව මගින් සේව්‍ය හා සේවක පාර්ශවයන් එවැනි ආකාරයේ සාමූහික ගිවිසුම් වෙත එළඹීම ප්‍රවර්ධනය කරනු ලැබේ. 2023.01.01 සිට 2023.12.31 දක්වා ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සාමූහික ගිවිසුම් 31ද ඇතුළුව 2023.12.31 දිනට ක්‍රියාත්මකව පවතින සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 225කි.

- **බේරුම්කරණ කටයුතු සිදු කිරීම**
  ප්‍රාදේශීය කාර්යාල මගින් හෝ ප්‍රධාන කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශය මගින් කටයුතු කළ ද නිරවුල් කළ නොහැකි වූ කාර්මික ආරාවුල්, අනිවාර්ය බේරුම්කරණය වෙත හෝ කාර්මික අධිකරණය වෙත යොමු කිරීම සිදු කරනු ලැබේ. 2023.01.01 සිට 2023.12.31 දක්වා කාල සීමාව තුළදී බේරුම්කරණය සඳහා යොමු කරනු ලැබූ ආරාවුල් 86 ද ඇතුලත්ව ආරාවුල් 263 ක් සම්බන්ධයෙන් 2023 වර්ෂය තුලදී කටයුතු කිරීමට නියමිතව තිබුණි. ඒ අතුරින් ආරාවුල් 158ක පරීක්ෂණ කටයුතු 2023 වර්ෂයේ දී අවසන් කර ප්‍රදාන 111ක් ලබා දී ඇති අතර ප්‍රදාන 47 ක් ඉදිරියේදී ලබා දීමට ඇත. ඒ අනුව, 2023.12.31 දින වන විට ආරාවුල් 91 ක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පැවතිණි.

- **වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම**
  සෑම වෘත්තීය සමිතියක්ම කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කිරීම වෘත්තීය සමිති ආඥා පනත යටතේ අනිවාර්ය වේ. ඒ අනුව, 2023.01.01 සිට 2023.12.31 දක්වා දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කරනු ලැබූ වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව 128 කි. 2023.12.31 දිනට වලංගු මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 2122 කි. 2023 වර්ෂය තුළදී වෘත්තීය සමිති 59 ක් අවලංගු කර ඇත.

- **ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම**
  පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ වැටුප් හා සේවා කොන්දේසි යාවත්කාලීන කිරීම සහ සුරක්ෂිත කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරයක් වේ. ඒ අනුව, 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා එම විෂය ක්ෂේත්‍රයට අදාලව පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

**වගුව 2.4** 2023 වර්ෂයේ ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

| කාරණය | ප්‍රගතිය | | | | |
|---|---|---|---|---|---|
| | 2023.01.01 දිනට ශේෂය | ඉල්ලීම් ලැබීම් | අනුමැතිය ලබා දීම් | ප්‍රතික්ෂේප කිරීම් | 2023.12.31 දිනට ශේෂය |
| දින 05 වැඩ සතිය සඳහා අනුමැතිය ලබා දීම | - | 387 | 364 | 6 | 17 |
| සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම් | 7 | 42 | 48 | 1 | 0 |
| පඩි පාලක සභා අඥාපනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම | 97 | 258 | 162 | 74 | 119 |
| අණ පනත් සම්බන්ධයෙන් සේව්‍ය හා සේවක පාර්ශව විසින් සිදු කරනු ලබන විමසීම් සඳහා පැහැදිලි කිරීම් හා අර්ථ නිරූපණ ලබා දීම | - | 68 | 68 (පිළිතුරු ලබා දීම) | - | - |

- **සේවකයාගේ වෘත්තීය සුරක්ෂිතතාවය සඳහා වූ සුනිසි වැඩ පරිසරය තහවුරු කිරීම**

  කර්මාන්තශාලා තුල සේවයෙහි යෙදෙන ශ්‍රමිකයන් හට භෞතිකමය වශයෙන් යම් ශාරීරික හානි සිදුවීම්, විදුලිය, තාපය, වායු පීඩනය, අධික ආලෝකය හා ශබ්දය මගින් ශාරීරික හානි හෝ මරණය පවා සිදුවීමේ අවදානමක් පවතී. එබැවින්, අනතුරු ඇති වීම අවම කිරීම දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ. ශ්‍රී ලංකාවේ කර්මාන්තශාලාවල සේවය කරන සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුභසාධනයට අදාල ප්‍රධානම නීතිමය ප්‍රතිපාදනයක් වනුයේ වර්ෂ 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත හා ඒ යටතේ පනවා ඇති රෙගුලාසින්ය.

  අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන වශයෙන් පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

**වගුව 2.5** 2023.01.01 සිට 2023.12.31දක්වා කාලය තුළ දී ඉටු කරනු ලැබූ ක්‍රියාකාරකම්

| ක්‍රියාකාරකම් | සංඛ්‍යාව |
|---|---|
| කර්මාන්තශාලා ආඥාපනතේ නව රෙගුලාසි යටතේ 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා ලියාපදිංචි කරන ලද කර්මාන්තශාලා | 1170 |
| පරීක්ෂා කර අනුමත කරන ලද ගොඩනැගිලි පිඹුරුපත් | 259 |
| බලයලත් නිලධාරීන් විසින් පරීක්ෂා කර ඉදිරිපත් කරනු ලැබූ අධිඅන්තරායදායී යන්ත්‍ර පරීක්ෂණ වාර්තා | 12,212 |
| පරීක්ෂාකරන ලද මුළු කර්මාන්ත ශාලා<br>බල ශක්ති භාවිතා කරන 2859<br>බල ශක්ති භාවිතා නොකරන 26<br>ඉදිකිරීම් වැඩබිම් 20<br>වෙනත් 139 | 3,044 |
| සේවකයාගේ සුරක්ෂිතතාවය ඉහල නැංවීම සඳහා විධිමත් සුරක්ෂිතතා කමිටු පිහිටුවීම | 435 |

- **සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම්**
  සේවා ස්ථානයන්හි සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සේවා ස්ථානවල සෞඛ්‍ය ගැටලු හෝ අනතුරු සිදුවීමට හැකි අවස්ථා තිබේද යන්න සම්බන්ධයෙන් විද්‍යාත්මක ක්‍රමවේදයන්යන් යටතේ සොයාබැලීම සහ එම අනතුරු වැළැක්වීම සඳහා පියවර ගැනීම හා වලක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලැබේ. ඒ අනුව 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

**වගුව 2.6** සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම්

| ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|
| පාරිසරික මිනුම් කටයුතු | 321 |
| ජෛව විද්‍යාත්මක පරීක්ෂණ | 1722 |
| වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් | 402 |
| මැදිහත් වීම් සිදු කර ගැටළුකාරී තත්ත්වයන් විසඳා වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය සුරක්ෂිත කිරීම | ආයතන - 10<br>සේවකයන් - 3437 |

එසේම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලා පිහිටි කොළඹ දිස්ත්‍රික්කයේ කාර්මික ජනපද 03 ක් තෝරා ගෙන එම කාර්මික ජනපද වල පිහිටි කර්මාන්තශාලා වල සේවකයන්ගේ වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් 2023 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී. ඒ සඳහා පහත සඳහන් කාර්මික ජනපද තුන තෝරා ගන්නා ලදී.

1. කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන පාදුක්ක, පානළුව කාර්මික ජනපදය - (කර්මාන්ත ශාලා 22)
2. නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන හෝමාගම, කටුවාන කාර්මික ජනපදය - (කර්මාන්ත ශාලා 63)
3. කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන රත්මලාන කර්මාන්තපුරය - (කර්මාන්ත ශාලා 22)

- **සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම**
  කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂාවන පරිදි කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මගින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම කම්කරු දෙපාර්තමේන්තුවේ එක් ප්‍රමුඛ වගකීමක් වේ.

  එසේම, සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය තුළින් ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමය තුරන් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යයක් ඉටු කිරීමට කටයුතු කිරීම මෙන්ම, වයස අවුරුදු 18 ට අඩු ළමුන් සඳහා වන කම්කරු නීති ක්‍රියාත්මක කිරීමත්, ස්ත්‍රීන් තරුණ අය සහ ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ නීති රීති කාලීනව සංශෝධනය කිරීම සඳහා නිර්දේශයන් ඉදිරිපත් කරමින් ඒවා ක්‍රියාත්මක කිරීමත් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

**වගුව 2.7** ස්ත්‍රී තරුණ සහ ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රගතිය

| කාරණය | ප්‍රගතිය/ සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2023.01.01 දිනට ශේෂය | පැමිණිලි ලැබීම් | විසඳීම් | 2023.12.31 දිනට ශේෂය |
| ළමා ශ්‍රමය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි වලට අදාලව පරීක්ෂණ සිදු කිරීම | 70 | 87 | 144 | 13 |

| | | | | |
|---|---|---|---|---|
| කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ පරීක්ෂණ | 11 | 7 | 14 | 4 |
| කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම | | | 456 (අනුමැතිය ලබා දීම) | |

ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ළමා ශ්‍රමයෙන් තොර කලාප පිහිටුවීමට අදාලව 2023 වර්ෂයේදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගනු ලැබූ දිස්ත්‍රික්ක 10 (ගාල්ල, ගම්පහ, පුත්තලම, මාතර, බදුල්ල, මොනරාගල, නුවරඑළිය, මහනුවර, කළුතර සහ ත්‍රිකුණාමලය) තුළ ළමා ශ්‍රමය සම්බන්ධයෙන් අවදානම් සහගත ප්‍රදේශයක් හඳුනාගනිමින් එම ප්‍රදේශයේ පාසලක් හෝ ළමා සමාජයක් තුළ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන මගින් අඩු ආදායම් ලාභී සහ ළමා ශ්‍රමය සඳහා අවදානමක් සහිත පවුල්වල සිසුන් 409 දෙනෙකු සඳහා පාසල් උපකරණ බෙදාදීම සිදු කරන ලදී.



**ඡායාරූපය 2.3** - ළමා ශ්‍රම විරෝධී වැඩසටහන



**ඡායාරූපය 2.4** - ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් වැඩලිය ප්‍රකාශනය එළිදැක්වීම

- **සේවකයන්ගේ සමාජ ආරක්ෂණය**

  ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදෙන සේවකයන් සඳහා සුරක්ෂිත විශ්‍රාම දිවියක් උරුම කරදීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දරනු ලැබේ. වරින් වර සංශෝධනය වූ මෙම පනත යටතේ දෙපාර්තමේන්තුව විසින් මේ වන විට ඉටුකරනු ලබන කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

  - සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා යෝජකයින් ලියාපදිංචිකිරීම
  - සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම
  - දායක මුදල් නොගෙවන සේවා දායකයන්ගෙන් දායක මුදල් අයකර ගැනීම
  - සාමාජිකයන් වෙත ප්‍රතිලාභ මුදල් ගෙවීම් සිදුකිරීම සඳහා ගෙවීම් නියෝග ලබාදීම
  - අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

- **සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම**

  2023 වර්ෂයේ දී සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීමට අදාලව තීරණ ලිපි 195,537 ක් යොමු කර ඇත.

- **දායක මුදල් ගෙවීම පැහැර හරින සේවායෝජකයන් වෙතින් දායක මුදල් අයකර ගැනීමට නිවේදන යැවීම**

  දායක මුදල් පැහැර හරින සේවායෝජකයන්ගෙන් එම මුදල් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම නිවේදන හා රතු නිවේදන නිකුත් කෙරෙන අතර ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මඟින් කටයුතු කර එම දායක මුදල් හා අධිභාර අයකර ගිණුම් ගත කිරීමට ක්‍රියා කරනු ලැබේ. ඒ අනුව 2023 වර්ෂය තුල දී පළමු සහ අවසන් නිවේදන නිකුත් කිරීම තුලින් අය කරගනු ලැබූ මුළු මුදල රුපියල් මිලියන 2015කි.

- **සේවක අර්ථසාධක අරමුදල ප්‍රවර්ධනය සඳහා සහ සේවාලාභීන් වෙත සේවා ලබා දීමේ කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග**

  - සේවකයන් සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි කිරීම සඳහා නව මෘදුකාංගයක් සකස් කරන ලදී. ඒ අනුව, මෙම නව මෘදුකාංගය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටි දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන්හි ස්ථාපිත කර සේවකයන් සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි කිරීමේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කරමින් පවතී. මෙම නව පද්ධතිය අනෙකුත් කම්කරු කාර්යාලයන්හිද ස්ථාපිත කර ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.

  - සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවා යෝජකයන් ලියාපදිංචි කිරීම, සේවකයන් සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි කිරීම, සාමාජිකයින්ගේ තොරතුරු පරීක්ෂා කිරීම (නම, සාමාජික අංකය ආදිය), ප්‍රතිලාභ ලබා ගැනීමේ අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම, ප්‍රතිලාභ ලබා ගැනීමට අයදුම්පත්‍ර භාරදුන් පසු එහි වර්තමාන තත්ත්වය පරීක්ෂා කිරීම, ආදී සේවක අර්ථසාධක අරමුදලට අදාල සේවාවන් විද්‍යුත් සේවාවන් වශයෙන් ලබා දීම සඳහා අවශ්‍ය මෘදුකාංග පද්ධති වැඩි දියුණු කිරීම් අවසන් අදියරේ පවතී.

  - ඩිජිටල් ආකෘතියක් හඳුන්වා දීම මගින් සේවක අර්ථසාධක අරමුදලේ 30% පූර්ව ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වන මූලික සුදුසුකම් මාර්ගගත ක්‍රම වේදයටඔස්සේ පරීක්ෂා කිරීම සඳහා ප්‍රතිලාභීන් වෙත පහසුකම් ලබා දෙන ලදී. 2023 වර්ෂයේ පළමු කාර්තුව තුළදී හඳුන්වා දෙනු ලැබූ මෙම ක්‍රමවේදය මගින් මේ දක්වා සාමාජිකයන් 2076 දෙනෙකුගේ මූලික සුදුසුකම් පරීක්ෂා කර ප්‍රතිලාභ ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි පියවර වෙත යොමු කර ඇත.

  - සේවක අර්ථසාධක අරමුදලට අදාළ සේවාවන් අවශ්‍යතාවය පරිදි ප්‍රාදේශිය කාර්යාල වෙත විමධ්‍යගත කිරීමටද කටයුතු කරන ලදී. ඒ අනුව, මන්නාරම, යටියන්තොට සහ වරකාපොළ යන උප කම්කරු කාර්යාලයන්හි සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම් ශාඛා ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

  - සාමාජිකයන් වෙත සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් නිවැරදි දැනුවත්භාවයක් නොමැතිවීම හේතුවෙන් උද්ගතවන ගැටළු අවම කිරීම සඳහා සහ සාමාජිකයන් මෙන්ම සේව්‍යයන්ද දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේද සහයෝගය සහිතව ජංගම සේවා වැඩසටහන් 04ක් පවත්වන ලදී. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයන් සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි කිරීම, සාමාජිකයා විසින් ලියාපදිංචි වී ඇති නමෙහි ඇති දෝෂ නිවැරදි කර ගැනීම, සේවක අර්ථසාධක අරමුදෙලේ සාමාජික ගිණුම් ශේෂ දැන ගැනීම ආදී පහසුකම් මෙම ජංගම සේවා වැඩසටහන් මගින් ලබා දෙන ලදී.

- **සේවකයන් සේවයේ යෙදවීමට අදාළ අයිතීන් ආරක්ෂා කර දීම සඳහා නෛතික රැකවරණය**
  සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවිය යුතු එම අණ පනත්හි ප්‍රතිපාදන දිවයින පුරා ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා එම නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේවක අයිතීන් සුරක්ෂිතකිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.


  ඒ අනුව, 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ අධිකරණ ක්‍රියාමාර්ග වලට අදාල ප්‍රගතිය පහත වගුව පරිදි වේ.

**වගුව 2.8** අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - 2023.01.01 සිට 2023.12.31 දක්වා

| අධිකරණය | 2023 වර්ෂය දක්වා ඉදිරියට ගෙන ආ ශේෂය | 2023 වර්ෂය දක්වා පවරනු ලැබූ නඩු සංඛ්‍යාව | 2023.12.31 දිනට අවසන් වූ නඩු |
|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 114 | 25 | 0 |
| අභියාචනාධිකරණය | 324 | 112 | 05 |

| | | | |
|---|---|---|---|
| මහාධිකරණය | 86 | 57 | 36 |
| වානිජ මහාධිකරණය | 217 | 10 | 04 |

**මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු - 2023.01.01 දින සිට 2023.09.30 දින දක්වා**




**ප්‍රස්තාරය 2.3** - මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු - 2023.01.01 දින සිට 2023.09.30 දින දක්වා

සටහන - ප්‍රාදේශීය කම්කරු කාර්යාලයන්හි විසින් ගනු ලැබූ අධිකරණ ක්‍රියා මාර්ග පිළිබඳ තොරතුරු ඉහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.

නව සමාජ ආර්ථික ප්‍රවණතාවයන්ට ගැලපෙන පරිදි සේව්‍ය හා සේවක ප්‍රජාවන්ගේ සම්බන්ධතාවය ප්‍රවර්ධනය වන ආකාරයේ වඩාත් නම්‍යශීලීවූ ද සරලවූ ද තනි කම්කරු නීතියක් හඳුන්වා දීම සඳහා වන නව සේවා නියුක්ති පනත හඳුන්වා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් අනතුරුව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් නීති කෙටුම්පත සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව වෙතින් මේ සඳහා අවශ්‍ය සහය ලබා දෙනු ලබන අතර 2023 වර්ෂය අවසන් වන විට කම්කරු දෙපාර්තමේන්තුව සමඟ නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා නීතිඥ සංගමය (Bar Association of Sri Lanka) යන පාර්ශව ඇතුලත් කමිටුවක් මගින් මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සාකච්ඡා සිදු කෙරෙමින් පැවතුණි.

එසේම, වත්මන් සමාජ ආර්ථික තත්ත්වයන්ට ගැලපෙන පරිදි නීති යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය මත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය සඳහා අදාල මූලික කටයුතු ද සිදු කරන ලදී.

- **කම්කරු දෙපාර්තමේන්තුවේ තොරතුරු සන්නිවේදන කටයුතු**

  - **ප්‍රකාශන කටයුතු**
    කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා පහත ප්‍රකාශන එළි දක්වන ලදී.
    - කතිකාව සඟරාව
    - කර්මාන්තමය සුරක්ෂිතාවය සම්බන්ධ අත්පොත්
    - කර්මාන්තමය සුරක්ෂිතාවය සම්බන්ධයෙන් මහජනතාව සහ සේව්‍ය සේවක දැනුවත් කිරීම සඳහා ප්‍රචාරක පුවරු සවි කිරීම
    - වැඩ කළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණය
    - කම්කරු සංඛ්‍යාති වාර්ෂික වාර්තාව 2022

  - **කම්කරු දෙපාර්තමේන්තුවේ නිල සමාජ මාධ්‍ය කටයුතු**
    සේවාලාභීන් සඳහා අවශ්‍ය අයදුම් පත්‍ර, ආකෘති පත්‍ර, උපදෙස් හා කම්කරු අණ පනත් මෙන්ම සේවායෝජකයන් විසින් අනුගමනය කළ යුතු පඩි පාලක සභා තීරණ ඇතුළු අවශ්‍ය ලේඛන බාගත කරගත හැකි වන පරිදි www.labourdept.gov.lk යන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි පළ කර ඇත.

  - **කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය**
    කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත්, පොත්පත් හා ප්‍රකාශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම පුස්තකාලය කම්කරු දෙපාර්තමේන්තුවේ විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙමගින් කම්කරු නිති ක්ෂේත්‍රයට අදාළ සියලුම අන පනත්, පොත් පත්, ප්‍රකාශන ආදිය පරිශීලනය සඳහා පහසුකම් සලසනු ලබයි. පුස්තකාලයේ පහසුකම් තව දුරටත් සංවර්ධනය කිරීමේ කටයුතු 2023 වර්ෂයේදී සිදු කරන ලදී.

- **ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම**
  - කම්කරු දෙපාර්තමේන්තුවට වසර 100 ක් සපිරීම නිමිත්තෙන් සිදු කරන ලද සැමරුම් වැඩසටහන
  - ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩසටහන 2023
  - ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින වැඩසටහන - 2023
  - දෙපාර්තමේන්තුවේ කාර්යයන් අධීක්ෂණය මගින් ඉලක්කයන් කරා මෙහෙයවීම

- **කම්කරු දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය**
  - කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම, අවශ්‍යතාවය පරිදි බඳවා ගැනීම් සිදු කිරීම, නිලධාරීන්ගේ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම්, කාර්ය සාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, නිලධාරීන් විශ්‍රාම ගැන්වීම, නිලධාරීන්ගේ නිවාඩු කටයුතු සහ කාර්ය මණ්ඩලයේ විනය කටයුතු යන දෛනික කාර්ය මණ්ඩල පරිපාලන කටයුතු සිදු කරන ලදී.
  - දේශීය පුහුණු වැඩසටහන් සඳහා 2023 වර්ෂය සඳහා රු 6,000,000.00 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. ඒ අතුරින් 2023.12.31 දිනට වියදම රු. 4,062,418 ක් වන අතර වියදම ප්‍රතිපාදනයන්හි ප්‍රතිශතයක් ලෙස 68% කි. මේ සම්බන්ධ තොරතුරු සයවන පරිච්ඡේදයේ දක්වා ඇත.

- **කම්කරු දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය**
  - දිවයින පුරා විසිරී සිටින සේවාලාභීන්ට වඩාත් ඵලදායී සේවයක් සලසා දීමේ අරමුණ පෙරදැරිව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි සහ දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාලයන් හි යටිතල පහසුකම් සංවර්ධනයට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.
  - ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාලයන් හි අවශ්‍යතාවය පරිදි සුළු අළුත්වැඩියා කටයුතු සිදු කරන ලද අතර මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ මහල්වල සහ කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ මහල්වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීමේ කටයුතු සිදු කරන ලදී.

**වගුව 2.9** කම්කරු දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය

| ව්‍යාපෘතිය | 2023.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|
| මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 8,9,10,11,12,13 සහ 14 මහල්වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීම | 100% |
| කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 3,4, 5 සහ 6 මහල්වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීම | ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී. |

## මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

- **වෘත්තීය මාර්ගෝපදේශනය, ශ්‍රම වෙළඳපළ තොරතුරු පවත්වා ගැනීම හා මහජන රැකියා සේවා කටයුතු** රටේ මානව සම්පත සංවර්ධනය සහ කළමනාකරණය සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

**වගුව 2.10** මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය

| | වැඩසටහන/ක්‍රියාකාරකම | 2023/01/01 දින සිට 2023/12/31 දක්වා ප්‍රගතිය | | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.මි) | |
| 1 | **ශ්‍රම වෙළඳපොලට වඩාත් ගැලපෙන රැකියා යෝග්‍ය කුසලතා වලින් යුත් මානව සම්පතක් බිහි කිරීම** | | | |
| | දිස්ත්‍රික් රැකියා පොළ පැවැත්වීම | 28 | 2.718 | 16,822 |
| | දිස්ත්‍රික් වෘත්තීය පොළ පැවැත්වීම | 35 | | 10,495 |
| | ප්‍රාදේශීය රැකියා පොළ පැවැත්වීම | 203 | | 33,775 |
| | ප්‍රවර්ධන වීඩියෝපට සැකසීම | 13 | 0.492 | |
| 2 | **ශ්‍රම වෙළඳපොල තොරතුරු පර්යේෂණ** | | | |
| | Case studies on Success Cases | 4 | 0.209 | |
| | Policy Sessions on LMI issues | 3 | 0.065 | |
| | Individual Study Reports 7 | 90% | 0.226 | |
| 3 | **වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීම** | | | |
| | 9 වසර සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීම | 1791 | 2.282 | 55,362 |
| | අ.පො.ස සාමාන්‍ය පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 2685 | | 72,049 |
| | අ.පො.ස උසස් පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1339 | | 38,259 |
| | වෘත්තීය මාර්ගෝපදේශ සතිය | 212 | 2.852 | 10,318 |
| | ප්‍රවර්ධන වීඩියෝපට සැකසීම | 8 | 0.793 | |
| 4 | **මහජන රැකියා සේවය** | | | |
| | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම | 98,739 | | 98,739 |
| | රැකියා ඇබෑර්තු ලියාපදිංචි කිරීම | 51,348 | | 51,348 |
| | රැකියා අපේක්ෂිතයන් රැකියා සඳහා යොමු කිරීම | 84,776 | | 84,776 |

| | | | | |
|---|---|---|---|---|
| | රැකියා අපේක්ෂිතයන් රැකියා ගත කිරීම | 14,015 | | 14,015 |
| | වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම | 65,198 | | 65,198 |
| | පුහුණුව සඳහා යොමු කිරීම | 26,093 | | 26,093 |
| | News papers to National PES Center And Vacancy Advertisement Dissamination | 100% | 0.037 | 4932 Newspapers Vacancies Distributed |
| | Enhancing the PES delivery system | 100% | 0.130 | |
| | **උතුරු පළාත් රැකියාගත කිරීමේ වැඩසටහන** | | | |
| | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම | 8829 | | |
| | රැකියා අපේක්ෂිතයන් රැකියාගත කිරීම | 1894 | | |
| | පුහුණුව සඳහා යොමු කිරීම | 3218 | | |
| | on the Job Training | 126 | | |
| | Directed to the RPL | 536 | | |
| **5** | **ක්‍රියාකාරී ශ්‍රම වෙළඳපොලක් සඳහා අභ්‍යන්තර කලමණාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම** | | | |
| | 1.Procorns (Department Website) | 100% | 0.772 | |
| | 2.Web Site Development | 70% | | |
| | 3. Awereness Programe | 100% | | |
| **6** | **නැගෙනහිර පළාත් ආබාධිත පුද්ගලයන් රැකියා ගත කිරීමේ වැඩසටහන** | | | |
| | ව්‍යාපාර ආයතන | | 9.764 | 160 |
| | ප්‍රතිලාභීන් 903 | | | 903 |
| | රැකියා පොළ සඳහා ප්‍රතිලාභීන් 196 | | | 196 |
| | රැකියාගත කිරීම් 44 | | | 44 |

- **වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු**

  රටේ මානව සම්පත්වල මුළු ශක්තිය කාර්යක්ෂම හා ඵලදායි ලෙස රටේ සංවර්ධනයට යොදාග නිමින්, දේශීය විදේශීය ශ්‍රම වෙළඳපොළට ගැලපෙන මානව සම්පතක් බිහිකිරීම අරමුණු කර ගනිමින් වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම සිදු කරනු ලබයි. මෙම වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සඳහා මනෝමිතික පරීක්ෂණ, අභියෝග්‍යතා පරීක්ෂණ, ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ, විවිධ නිරීක්ෂණාත්මක පරීක්ෂණ යන මෙවලම් භාවිතා කෙරේ. මෙම වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පුද්ගල, කණ්ඩායම් සහ සමූහ වශයෙන් ගෙන පුද්ගල උපදේශන හා මාර්ගෝපදේශය, මූලික දැනුවත් කිරීම්, වැඩමුළු, ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් සිදු කරනු ලැබේ.

**වගුව 2.11** 2023.12.31 දිනට රැකියාගත කිරීම් - මි. හා රැ.දෙපා.

| | දිස්ත්‍රික්කය | රැකියාගත කිරීම් | ස්වයං රැකියාලාභින්/ව්‍යවසායකයින් බිහි කිරීම |
|---|---|---|---|
| 1 | කොළඹ | 924 | 102 |
| 2 | ගම්පහ | 288 | 47 |
| 3 | කළුතර | 699 | 92 |
| 4 | මහනුවර | 986 | 185 |
| 5 | මාතලේ | 750 | 133 |

| | | | |
|---|---|---|---|
| 6 | නුවරඑළිය | 437 | 111 |
| 7 | ගාල්ල | 733 | 283 |
| 8 | මාතර | 950 | 508 |
| 9 | හම්බන්තොට | 660 | 140 |
| 10 | යාපනය | 953 | 464 |
| 11 | මන්නාරම | 425 | 200 |
| 12 | වවුනියාව | 263 | 113 |
| 13 | මුලතිව් | 3 | 17 |
| 14 | කිලිනොච්චිය | 250 | 85 |
| 15 | මඩකලපුව | 346 | 269 |
| 16 | අම්පාර | 315 | 663 |
| 17 | ත්‍රිකුණාමලය | 139 | 15 |
| 18 | කුරුණෑගල | 1,339 | 280 |
| 19 | පුත්තලම | 100 | 163 |
| 20 | අනුරාධපුරය | 536 | 33 |
| 21 | පොළොන්නරුව | 128 | 86 |
| 22 | බදුල්ල | 1,171 | 100 |
| 23 | මොණරාගල | 291 | 61 |
| 24 | රත්නපුර | 656 | 176 |
| 25 | කෑගල්ල | 673 | 139 |
| | **එකතුව** | **14,01** | **4,465** |

- **වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව සිදු කරන ලද වැඩසටහන් සඳහා ගණනය කළ මූල්‍යමය වටිනාකම් පැවරීම**

  දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන, ස්වයං රැකියා පෙළඹවීම වැඩසටහන, අවශ්‍යතා මත පුහුණු වැඩසටහන්, RPL වැඩසටහන පිළිබඳ දැනුවත්කිරීම, ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන, රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම, ව්‍යවසායකත්ව සංවර්ධන එක්දින වැඩසටහන, වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම යන වැඩසටහන් සඳහා ගණනය කළ මූල්‍ය වටිනාකම රු. 21,013,000.00 ක් වන අතර සහභාගී වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 105065 කි.

- **ආංශික ප්‍රගතිය**
- **ශ්‍රම වෙළඳපල සංවර්ධනය කිරීම සඳහා පහත දැක්වෙන වැඩසටහන් 2023 වර්ශය තුලදී සිදු කර ඇත.**
  - නිල් මානෙල් මල් ආශ්‍රිත නවෝත්පාදන වෙළඳපොළ විභවතාවය
  - ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස පොලිතින් හා ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය
  - අපනයන වෙළඳපොළ  සඳහා  තල් ආශ්‍රිත නිෂ්පාදන
  - අත්‍යන්ත්‍ර රෙදිපිළි ව්‍යාපාර මුල් කරගනිමින් ප්‍රවර්ධන ආකෘති සකස් කිරීම - 50%
  - ව්‍යාපාරික පොල් කටු අඟුරු නිෂ්පාදනය
  - පුවක් කොළපත් ආශ්‍රිත නිෂ්පාදන
  - බුලත් නිෂ්පාදනය පදනම් කර ගනිමින් ප්‍රවර්ධන ආකෘති සකස් කිරීම

- **බුද්ධි කලම්බන සැසි - Brain Storming Sessions**
  - ශ්‍රම වෙළඳ පොළ තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය
  - ආර්ථිකව ආයුර්වේද ඖෂධ නිෂ්පාදන මගින් රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන හැකියාව
  - ලංකික ජනගහනය වයස් ගත වීම

- **ඒක පුද්ගල පර්යේෂණ -** (Individual Research)
    - ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා බිඳවැටීම පිළිබඳ සමීක්ෂණය
    - ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා බිඳවැටීම පිළිබඳ සමීක්ෂණය.
    - ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම දායකත්වය සහ කාන්තාවන්ට රැකියා සඳහා යොමු වීමේදී පවතින ගැටලු
    - ආබාධිත ප්‍රජාවගේ රැකියා යෝග්‍යතාවය පිළිබඳ සමීක්ෂණය
    - නැවත පැමිණි විගමණික ශ්‍රමිකයින් ගේ අපේක්ෂාවන් පිළිබඳ සමීක්ෂණය
    - වෙනත් රටවල මහජන රැකියා සේවා සංසන්දනාත්මක අධ්‍යයනය
    - සාමාන්‍ය අධ්‍යාපනය වර්තමාන ප්‍රතිපත්ති, ගැටලු හා විසඳුම්

- **මානව සම්පත් කළමණාකරණය**
    - ශ්‍රී ලංකාව තුල අවිධිමත් අංශයේ සේවයේ නිරත ශ්‍රමිකයින් ගේ සේවා ගරුත්වය හා ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට අදාළව ක්‍රියාත්මක කරන "ගරු සරු" වැඩසටහනේ සමස්ථ සම්බන්ධීකරණය. 2023 වර්ෂය තුළ ත්‍රිරෝද රථ වෘත්තිකයන්, දේශීය ගෘහ සේවිකාවන්, විදුලි කාර්මික ශිල්පීන්,පෙරපාසල් ගුරුවරියන්, පෞද්ගලික බස් රියදුරු සහ කොන්දොස්තර වෘත්තිකයන්,ටයිල්,පෙදරේරු හා වඩුකාර්මික ශිල්පීන්ගේ සේවා ගරුත්වය හිමිකර දීමට අදාළව "ගරු සරු" වැඩසටහනේ මූලික අදියරයන් ආරම්භකර ඇත.

    - ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය සමඟ එක් එක් දිස්ත්‍රික් මට්ටමින් හෝටල් පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතී. නියමු ව්‍යාපෘතිය ලෙස ගාල්ල දිස්ත්‍රික්කයේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

    - විදේශ රැකියාගත වීමට අපේක්ෂාවෙන් සිටින රැකියා අපේක්ෂිතයින් වෙත RPL සහතික ලබා ගැනීමේ ඇති වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම හා ඒ සඳහා යොමු කරවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- **වෘත්තීය මාර්ගෝපදේශනය යටතේ සිදු කළ වැඩසටහන්**
    - නැණ ජය වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන
    - Skill Scan Clinic වැඩසටහන
    - වීඩියෝ පට සකස් කිරීම
    - උසස් පෙළ සිසුන් හා පාසල් හැර ගිය සිසුන් සදහා වැඩලෝකයට නිපුණනත්වයෙන් යුතුව පිවිසීම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමේ වැඩසටහන
    - උද්‍යාන අලංකරණ වැඩසටහන
    - ස්වයං රැකියා සදහා තාක්ෂණික පුහුණුව



**ඡායාරූපය 2.5** - ගරු සරු වැඩසටහන පිළිබඳ සාකච්ඡාව

- **මහජන රැකියා සේවා කටයුතු**

ශ්‍රී ලාංකීය ශ්‍රම බලකාය තුළ පුද්ගලික අංශයේ ඵලදායී රැකියා අවස්ථාවන් කාර්යක්ෂම ලෙස ලබාදීම අරමුණු කරගෙන දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන 25ක් ක්‍රියාත්මක කර ඇති අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

- සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි දිස්ත්‍රික් රැකියාපොළ වැඩසටහන් 28 සහ ප්‍රාදේශීය රැකියාපොළ වැඩසටහන් 203 පැවැත්වීමට කටයුතු කිරීම.
- වෘත්තීයපොළ වැඩසටහන් 50 පැවැත්වීමට කටයුතු කිරීම.
- මහජන රැකියා සේවා අංශයේ මූලිකත්වයෙන් 2023 මැයි මාසයේ සිට රැකියා සපයන ආයතන ලියාපදිංචි කර ගැනීම ආරම්භ කිරීම සහ ඒ අනුව පුද්ගලික ආයතන 62ක් ලියාපදිංචි කර ගැනීම සහ එම ආයතනවල පවත්නා පුරප්පාඩු ලබාගැනීම.
- දිස්ත්‍රික් Whatsapp සමූහ හරහා එම රැකියා පුරප්පාඩු ප්‍රචාරණය, එම සමූහ හරහාම Google පෝරම භාවිතයෙන් රැකියා ඉල්ලුම්පත්‍ර භාර ගැනීම සහ ඉල්ලුම් පත්‍ර අදාළ ලියාපදිංචි පුද්ගලික ආයතන වෙත යොමු කිරීම.
- දිස්ත්‍රික්කය තුළ රැකියා අපේක්ෂිතයින් පිළිබඳ සංඛ්‍යා ලේඛන රැස්කිරීමට හා විශ්ලේෂණය කිරීමට හැකිවන පරිදි දිස්ත්‍රික 25 හි Google පෝරම 25 ක් හරහා රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ මහජන රැකියා සේවා අංශය විසින් සති අන්ත පුවත්පත් වන සිළුමිණ, ලංකාදීප, Sunday Observer, වීරකේසරී (දමිළ), සහ තිනකරන් යන පුවත්පත් මිළදී ගෙන එම පුවත්පත්වල පළවන රැකියා ඇබෑර්තු දිස්ත්‍රික්ක මට්ටමින් පවතින දෙපාර්තමේන්තු Whatsapp සමූහය සහ රැකියා අපේක්ෂිත සමූහය වෙත යොමුකර, පවතින රැකියා පුරප්පාඩු පිළිබඳව රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම. 2023 වර්ෂයේ ඉහත සඳහන් පුවත්පත් වල පළ වූ මුළු රැකියා ඇබෑර්තු සංඛ්‍යාව 5159 කි.
- ජනාධිපති කාර්යාලය මඟින් යොමුකරන ලද රැකියා ඉල්ලීම් 620 ක් පුද්ගලික අංශයේ රැකියා අවස්ථා සඳහා යොමුකිරීමට අදාල දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වෙත යොමුකිරීමට කටයුතු කළ අතර, එහි ප්‍රගතිය ජනාධිපති කාර්යාලය වෙත ලබාදීමට කටයුතු කිරීම.
- අගමැති කාර්යාලය මගින් යොමුකරන ලද රැකියා ඉල්ලීම් 08ක් පුද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබාදීම සඳහා අදාල දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වෙත යොමුකිරීමට කටයුතු කළ අතර, එහි ප්‍රගතිය අගමැති කාර්යාලය වෙත ලබාදීමට කටයුතු කිරීම.
- බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් අප දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් බස්නාහිර පළාත් රැකියා අපේක්ෂිත පුද්ගලයින් දේශීය/විදේශීය රැකියා සඳහා යොමුකරවීමේ අරමුණ ඇතිව පුද්ගලික ආයතන, පුහුණු ආයතන සහභාගීත්වයෙන් විශේෂ රැකියාපොළ/වෘත්තීයපොළ වැඩසටහනක් 2023/06/06 වන දින බත්තරමුල්ල දියත පරිශ්‍රයේදී පැවැත්වීමට කටයුතු කිරීම.
- කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහයෝගයෙන් Glocal Fair 2023 විශේෂ ජංගම සේවා වැඩසටහන 2023/07/15 සහ 16 යන දිනයන්හි යාපනය දිස්ත්‍රික්කයේ මුට්‍රවේලී ක්‍රීඩාංගනයේදී පැවැත්වීම.
  දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන ලබාදෙන සේවාවන් සම්බන්ධයෙන් පාසැල් සිසුන්, පාසැල් හැරගිය සිසුන් සහ රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික්ක 13ක දිස්ත්‍රික් මාධ්‍ය ඒකක සමඟ සම්බන්ධ වී වීඩියෝපට 13ක් සකස් කිරීම

## ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

- **වඩා හොඳ කාර්මික සබඳතා සඳහා ත්‍රෛපාර්ශ්වීය හවුල්කරුවන් දැනුවත් කිරීම**
- **කම්කරු නීතිය, කාර්මික සබඳතා සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය (NILS) සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කම්කරු නීතිය හා කාර්මික සබඳතා, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය, සමාජ සංවාද හා කම්කරු සබඳතා සහ වැඩබිම් ඵලදායිතාව යන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ පාඨමාලා පවත්වනු ලබයි. එසේම එම පාඨමාලා භාෂා ත්‍රිත්වයෙන්ම ගුණාත්මක සේවාවක් ලෙස රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශයේ සේවාලාභීන් වෙත ලබා දීමට ආයතනය මේ වනවිට කටයුතු කරනු ලැබේ. ඩිප්ලෝමා හා කෙටිකාලීන පාඨමාලා, සහතික පත්‍ර, පුහුණු සහ වැඩමුළු වශයෙන් මෙම පාඨමාලා පැවැත්වේ.

2023 වසරෙහි ඩිප්ලෝමා පාඨමාලා 09ක් ද කෙටිකාලීන පාඨමාලා 47ක් හා සහතිකපත්‍ර පාඨමාලා 18 ක් සාර්ථකව පවත්වා ඇත. මෙම පාඨමාලා මඟින් රුපියල් මිලියන 17.03ක ආදායමක් උපයා ඇත. මේ සඳහා අයදුම්කරුවන් 1,137ක ප්‍රමාණයක් පමණ සහභාගී වී ඇත.

- **වෘත්තිමය සංවර්ධනය අරමුණු කරගත් පාඨමාලා හා විදේශ සබඳතා සහිත පාඨමාලා**
  කොළඹ හා කුරුණෑගල ආවරණය වන පරිදි විදේශ රැකියා නියෝජිත ආයතන වල කාර්යමණ්ඩලය ඉලක්ක කර ගනිමින් සාමාන්‍ය කළමනාකරණය හා කම්කරු සංක්‍රමණය පිළිබඳ වෘත්තිය සහතිකපත්‍ර පාඨමාලාවන් 04ක් ද, සෞඛ්‍ය ආරක්ෂණ කළමනාකරණය නමින් සහතිකපත්‍ර පාඨමාලාවක්ද සාර්ථකව පැවැත් වූ අතර ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය හා රාජ්‍ය නිර්මාණ නිතීගත සංස්ථාව හා ඒකාබද්ධව බර යන්ත්‍රෝපකරණ පාඨමාලාවක් ද 2023 වසර තුළ ආරම්භ කර ඇත.
  නුවරඑළිය ප්‍රදේශයේ වැවිලි සමාගම් වල කාර්ය මණ්ඩලය ඉලක්ක කර ගනිමින් කම්කරු සබඳතා හා කම්කරු නීති පිළිබඳව වැඩසටහනක්ද, වැවිලි සමාගම්වල වෘත්තිය සමිති නියෝජිතයින් ඉලක්ක කර ගනිමින් වැඩසටහනක් හා සමාජ සංවාද හා කම්කරු සබඳතා නමින් ඩිප්ලෝමා පාඨමාලාවක් ද සාර්ථකව පවත්වන ලදී.

- **සුනිසි මෙහෙවර ව්‍යාපෘතිය**
  සුනිසි මෙහෙවර වැඩසටහන වෙනුවෙන් අප ආයතනය විසින් ඉදිරිපත් කළ පහත සඳහන් ව්‍යාපෘති යෝජනාවන්ට මෙම වසර තුළ ක්‍රියාත්මක කිරීම සඳහා රු.2,090,000.00ක ප්‍රතිපාදන ආයතනය වෙත වෙන් කර තිබුණි.




**ඡායාරූපය 2.6** - ඩිප්ලෝමා සම්මාන ප්‍රදානෝත්සවය

ඒ අනුව, ව්‍යවසාය සංවර්ධන කටයුතුවල නිරතවන රාජ්‍ය නිලධාරීන්ට කාර්මික සබඳතා, කම්කර නීතිය සහ මානව සම්පත් කළමනාකරණ පිළිබඳ පුහුණුවක් ලබා දීම සඳහා උසස් සහතිකපත්‍ර පාඨමාලාවක් පැවැත්වීම වෙනුවෙන් රු.1,100,000.00 ක වැය බරක් දරා ඇති අතර සේව්‍ය සේවක සබඳතා සවිමත් කිරීම වෙනුවෙන් තේ හා රබර් කර්මාන්ත ශාලා සහ වතු සමාගම තුළ යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් රු.961,490.00ක වැය බරක් දරමින් වැඩසටහන් 09ක් පවත්වා ඇත.

- **විභාග කටයුතු**
  රාජ්‍ය අංශයේ සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි මෙන්ම පෞද්ගලික අංශයේ ආයතනයන්හි ඉල්ලීම් මත විභාග පැවැත්වීම, ආයතනයේ පවත්වන ඩිප්ලෝමා පාඨමාලාවන් හා සහතික පත්‍ර පාඨමාලාවන්ට අදාළ විභාගයන් ද පවත්වන අතර මෙම විභාගවල රහස්‍යභාවය ආරක්ෂා කර ගනිමින් වෘත්තීමය භාවයකින් යුක්තව පැවැත්වීමටත්, සේවාලාභීන්ට කඩිනම් සේවයක් ලබා දීමත් සිදු කෙරේ.

2023 වසරෙහි රට තුළ ඇති වූ ආර්ථික පසුබෑම් තත්වය හමුවේ වුවද විභාග 49ක් පවත්වා ඇති අතර බාහිර ආයතන වෙනුවෙන් කරන ලද විභාග මඟින් රුපියල් මිලියන 7.4ක ආදායමක් උපයා ඇත. මේ සඳහා අයදුම්කරුවන් 1245ක ප්‍රමාණයක් පමණ සහභාගී වී ඇත.

### ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

- **වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම**

සේවා ස්ථානවල සිදුවන වෘත්තීය අනතුරු අවම කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය (NIOSH) වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් පුහුණුව සඳහා ඩිප්ලෝමා පාඨමාලාවන්, සහතික පත්‍ර පාඨමාලාව මෙන්ම වෘත්තීය සුරක්ෂිතතාවය හා ආරක්ෂාව සම්බන්ධයෙන් විවිධ පාඨමාලාවන් පවත්වනු ලබයි.

මීට අමතරව කර්මාන්ත ශාලාවන්හී සේවයේ නිරතවී සිටින සේවක සේවිකාවන් සඳහා තමන් වැඩකරන පරිසරය සුදුසු මට්ටමක තිබෙනවාද යන්න පරීක්ෂාකර බැලීම සඳහා පාරිසරික සමීක්ෂණ 206 ක්ද සේවයේ නිරතවන වෘත්තිකයන්ගේ සෞඛ්‍යය තත්ත්වය නිසියාකාරව පවතිනවාද යන්න විමසා බැලීම උදෙසා වෛද්‍ය පරීක්ෂණ1050 ක් ද 2023 වර්ෂය තුලදී සිදු කර ඇත. 2023 වර්ෂයට අවදානම් ඇගයීමේ සමීක්ෂණ මසකට එක බැගින් 12ක් සිදුකර ඇත. මීට අමතරව Onsite Training 24ක ප්‍රමාණයක් 2023 වර්ෂයේදී සිදු කර ඇත.




**ඡායාරූපය 2.7** - ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය

### ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ විශේෂ වැඩසටහන්

**වගුව 2.12** සිදු කරන ලද විශේෂ වැඩසටහන්

| | පාඨමාලාව | පැවැත් වූ පාඨමාලා ගණන | සහභාගී වූ සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) |
|---|---|---|---|---|
| 01 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 3 | 90 | 10.08 |
| 02 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 5 | 139 | 7.16 |
| 03 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ පදනම් පාඨමාලාව | 1 | 14 | 0.23 |
| 04 | විධායක ශ්‍රේණි නිලධාරීන් සඳහා වන පාඨමාලාවන් | 3 | 64 | 1.92 |


| | | | | |
|---|---|---|---|---|
| 05 | Surado කැම්පස් ආයතනය විසින් පවත්වනු ලබන care givers පාඨමාලාව අදාළ වෘත්තීය සුරක්ෂිතතා හා ආරක්ෂාව පිළිබඳව විෂය පථය ආවරණය කිරීම. | 1 | 643 | 4.39 |
| 06 | ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ හා safe foundation ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයන් සඳහා care givers පාඨමාලාවක් පැවැත්වීම. | 1 | 100 | 0.4 |

## කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය


### වෘත්තීය අනතුරු සඳහා වන්දි ගෙවීම

සේවා නියුක්තියේදී තුවාල ලබන, රැකියාවේ ස්වභාවය හේතුවෙන් වැළඳෙන රෝගවලට ගොදුරු වන සේවකයන්ට සහ සේවා ස්ථානවල අනතුරු හේතුවෙන් මිය යන ශ්‍රමිකයින්ගේ යැපෙන්නන්ට කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය මඟින් වන්දි ගෙවීමට කටයුතු කරයි. වාර්තා වූ අනතුරු ප්‍රමාණයන් සම්බන්ධ තොරතුරු සහ වන්දි ගෙවා ඇති සංඛ්‍යා පහත පරිදි වේ.

**2023 වර්ෂය තුළ වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරු ප්‍රමාණය**




**ප්‍රස්තාරය 2.4 -** වාර්තා වූ මාරක අනතුරු ප්‍රමාණය




**ප්‍රස්තාරය 2.5 -** වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරු ප්‍රමාණය

## 2023 වර්ෂය තුළ වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරුවල ස්වභාවය


**වගුව 2.13** වාර්තා වූ මාරක සහ මාරක නොවන අනතුරුවල ස්වභාවය

| **අනතුරෙහි ස්වභාවය** | **මාරක අනතුරුවල ස්වභාවය** | **මාරක නොවන අනතුරුවල ස්වභාවය** |
|---|---|---|
| උස් ස්ථානයකින් ඇදවැටීමක් | 09 | 05 |
| විදුලිසැර | 12 | 05 |
| ගිනි / රසායනික ද්‍රව්‍ය / අපද්‍රව්‍ය | 08 | 06 |
| කම්හල් යන්ත්‍ර සූත්‍ර සහ වෙනත් යන්ත්‍ර | 06 | 27 |
| රිය අනතුරු | 43 | 24 |
| සතුන්ගෙන් | 08 | 09 |
| අස්ථි බිඳීම/ ලිස්සායාම/ හෝ වැටීම | 11 | 160 |
| වෙනත් ද්‍රව්‍ය පුද්ගලයා මතට පතිතවීම | 05 | 05 |
| ජල | 02 | - |
| වෙනත් | 58 | 31 |
| **එකතුව** | **162** | **272** |

## 2023.01.01-2023.12.31 දක්වා වාර්තා වූ මාරක නොවන අනතුරුවල හානියේ ස්වභාවය

**වගුව 2.14** වාර්තා වූ මාරක නොවන අනතුරුවල හානියේ ස්වභාවය

| **හානිය** | **අනතුරු ප්‍රමාණය** |
|---|---|
| තාවකාලික සුළු තුවාල | 62 |
| පිළිස්සීම් | 06 |
| ඇඟිලි අහිමිවීම් | 51 |
| අස්ථි බිඳීම් | 26 |
| අත/අත්ලේ කොටස් ඉවත්කිරීම් | 30 |
| කොන්ද/සුෂුම්නාවට හානි | 20 |
| පා ඇඟිලි/පාද අහිමිවීම් | 23 |
| ඇසට හානිවීම | 18 |
| වෙනත් | 36 |
| එකතුව | 272 |




**ප්‍රස්තාරය 2.6 -** සංචාරක අධිකරණ ප්‍රදේශ අනුව වාර්තා වූ අනතුරු ප්‍රමාණය

## වන්දි ගෙවීමේ කටයුතුවල ප්‍රගතිය

**වගුව 2.15** වන්දි ගෙවීමේ කටයුතුවල ප්‍රගතිය

| ක්‍රියාකාරකම | භෞතික | | මූල්‍ය (රු. මිලි.) | |
|---|---|---|---|---|
| | අපේක්ෂිත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | අපේක්ෂිත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව |
| අවසන් කළ මාරක හා මාරක නොවන නඩු ගොනු ගණන | 300 | 385 | 120 | 183.1 |
| ගිවිසුම් | 80 | 61 | 7 | 9.1 |
| ආරම්භ කළ බාල වයස්කාර ගිණුම් | 100 | 129 | 20 | 49.7 |
| නිදහස් කළ බාල වයස්කාර ගිණුම් | 150 | 184 | 20.2 | 31.8 |

## ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

- **රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම**
  ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි වඩාත් කාර්යක්ෂම හා ගුණාත්මක සේවා සැපයීමක් සඳහා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. සේවාලාභින් ආයතන පරිශ්‍රය තුළ රැඳී සිටීමේ කාලය අවම කිරීම සඳහා සුදුසු ක්‍රමවේද සැකසීමත්, ඒ තුළින් ආයතනික කාර්යක්ෂමතාවය සහ සඵලතාවය ඉහළ නැංවීමත් සහ සතුටුදායක හා කාර්යක්ෂම පාරිභෝගික සේවා ක්‍රියාවලි වර්ධනය කිරීම සඳහා වර්තමානයේ භාවිතා වන පාරිභෝගික සේවා ක්‍රියාවලි විශ්ලේෂණය කිරීම, පාරිභෝගික හා සේවක තෘප්තිය පිළිබඳ සංගණනයක් සිදුකිරීම, ඉහළ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා සිදුකිරීම හා ක්‍රියාවලි සංශෝධන ඇතුළත් වාර්තාවක් ඉහළ කළමනාකාරීත්වය වෙත යොමුකිරීම තුළින් අදාළ වැඩිදියුණු කිරීම් සිදුකරනු ලැබේ. ආයතනය විසින් 2023 වර්ෂය තුළ පහත දැක්වෙන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඵලදායිතා සංකල්ප තුලින් සවිබල ගැන්වීම**
  2023 වසර තුලදී සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි එක් ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාශයකින් එක් ව්‍යවසායකයෙකු බැගින් තෝරාගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරමින් පවතී. පහ එස් සංකල්පය, කයිසන් හා නාස්තීන් අවම කිරීම යන ඵලදායිතා සංකල්ප මෙම ව්‍යවසායක ආයතන වෙත හඳුන්වා දී ඇති අතර, මේ තුලින් එම ආයතනයන්හි ආදායම් උත්පාදනය, නාස්තීන් හා වියදම් අවම කිරීම, රැකියා උත්පාදනය, විවිධාංගිකරණය පාදක කරගත් භාණ්ඩ නිෂ්පාදනය යන දෑ වර්ධනය කිරීමට අපේක්ෂිත වේ.

- **රාජ්‍ය අංශයේ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම**
  රාජ්‍ය අංශයේ ආයතන වල වැඩිදියුණු විය යුතු ක්‍රියාවලි හඳුනාගෙන, එයට පිලියම් යෙදීම තුලින් මහජනතාව වෙත ප්‍රශස්ත සේවාවක් ලබාදීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක වනු ඇත. වර්තමානයේදී සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය කරමින් දිවයින පුරා මෙම වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතී. සුදුසු ක්‍රියාවලි හඳුනාගැනීම, දත්ත එකතු කිරීම හා මැනීම, දත්ත විශ්ලේෂණය, වැඩිදියුණු කිරීම හා සම්මතකරණය යන පියවරයන්ගෙන් සමන්විත SMAIS ක්‍රමවේදයට අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ වනවිට ක්‍රියාවලි 200කට ආසන්න සංඛ්‍යාවක් තෝරාගෙන වැඩිදියුණු කිරීම් සිදුකරමින් පවතින අතර, 2024 වසර තුලදී ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙත අනුයුක්ත එක් ඵලදායිතා සංවර්ධන නිලධාරියෙකු විසින් නව ක්‍රියාවලි 2ක් තෝරාගෙන වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වනවිට සකසමින් පවතී.

- **ඵලදායිතා ප්‍රමුඛ සැලැස්මක් (Master Plan on Productivity) සැකසීම**
  ආසියානු ඵලදායිතා සංවිධානයේ මැදිහත්වීම මත කොරියානු සංවර්ධන ආයතනය විසින් (KDI) ශ්‍රී ලංකාව සඳහා ඵලදායිතා ප්‍රමුඛ සැලැස්මක් (Master Plan on Productivity) සැකසීමට එකඟතාවය පලකර ඇත. මේ සඳහා මාර්ගගත ක්‍රමය මගින් සාකච්ඡා වට දෙකක් පවත්වා ඇති අතර, ශ්‍රී ලංකා ආර්ථිකයට ධනාත්මක බලපෑම් ඇතිකරන ආහාර සැකසීම (Food Processing), ධීවර කර්මාන්තය, (Fisheries), සංචාරක කර්මාන්තය (Tourism), සහ ඇඟළුම් කර්මාන්තය (Apparel Sector) යන ක්ෂේත්‍ර මූලික කර ගනිමින් මෙම සැලැස්ම සැකසෙනු ඇත. මේ පිළිබඳව අදාල පාර්ශව දැනුවත් කිරීමේ කටයුතු ඉදිරියේදී සිදුකෙරෙන අතර, අදාල පාර්ශවකරුවන් සමග ඉදිරි කටයුතු සාකච්ඡා කිරීම සඳහා ආසියානු ඵලදායිතා සංවිධානය හා කොරියානු සංවර්ධන ආයතනයට අයත් නියෝජිත කණ්ඩායමක් මාර්තු මස 4 වන සතිය තුලදී දිවයිනට පැමිණීමට නියමිතය.

- **ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ආසියානු ඵලදායිතා සංවිධානයේ සහතික ලත් ආයතනයක් බවට පත්කිරීම (NPS Certification Body Program)**
  ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය වෙත විවිධ ආයතන වෙතින් පුහුණු වැඩසටහන්, ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්, උපදේශන සේවා වැඩසටහන්, විගණන වැඩසටහන් ආදිය පැවැත්වීම සඳහා වාර්ෂිකව ලැබෙන ඉල්ලීම් කටයුතු වඩාත් ඵලදායීව ඉටුකිරීම සඳහා ආසියානු ඵලදායිතා සංවිධානයේ සහතික ලත් ආයතනයක් බවට පත්කිරීමට අවශ්‍ය කටයුතු සකස් කිරීම 2023 වසර තුලදී සිදුකරන ලදී. තෝරාගත් කණ්ඩායමක් සඳහා ආසියානු ඵලදායිතා සංවිධානයේ සම්පත් දායකත්වය යටතේ න්‍යයාත්මක හා ප්‍රායෝගික දේශන ඇතුලත් වැඩසටහන් ක්‍රියාත්මක වන අතර, මෙහි පළමු වැඩසටහන 2023 වසරේ පෙබරවාරි මස 20 වන දින ආරම්භ කරන ලදී. මෙම තෝරාගත් කණ්ඩායම ආසියානු ඵලදායිතා සංවිධානයේ සහතික ලත් ඵලදායිතා විශේෂඥයින් ලෙස ඉදිරියේදී කටයුතු කරනු ඇත.

**ශ්‍රම වාසනා අරමුදල**

- **ශ්‍රමිකයින්ගේ සුභසාධනය**
  ශ්‍රම වාසනා අරමුදල මඟින් කම්කරු ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා සුබසාධන වැඩසටහන් පවත්වනු ලැබේ. මේ යටතේ ශ්‍රම වාසනා අරමුදල මඟින් අක්ෂි කඳවුරු, වෛද්‍ය කඳවුරු, මියගිය සේවකයින්ගේ පවුල්වල පාසල් දරුවන්ට ශිෂ්‍යත්ව, පාසල් උපකරණ, ජීවනෝපාය ආධාර සඳහා තාක්ෂණික අධ්‍යාපනය සහ අනෙකුත් සුබසාධන වැඩසටහන් දිවයින පුරා පවත්වනු ලැබේ.

වර්ෂයේ ශ්‍රම වාසනා අරමුදල මඟින් සිදුකරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

- **දැනුවත් කිරීමේ වැඩසටහන්**
  කම්කරු නීති අණපනත් පිළිබඳව සේවක සේවිකාවන් මෙන්ම ආයතන හිමිකරුවන්ට පැන නගින ගැටළුකාරී තත්වයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් රටේ විවිධ ප්‍රදේශ තුල වැඩසටහන් 24ක් පවත්වා ඇත.


- **අධ්‍යාපනික ආධාර වැඩසටහන්**
  කම්කරු පවුල් නඟා සිටුවීම අරමුණු කර අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දු දරුවන් වෙත අධ්‍යාපන ආධාර ලබා දීමේ වැඩසටහන් 08ක්විවිධ ප්‍රදේශවලදී සිදු කරන ලදී. මෙහිදී දු දරුවන් 3245කට අධික ප්‍රමාණයක් ප්‍රතිලාභ ලැබූ අතර ඔවුන් වෙනුවෙන් රුපියල් මිලියන 23.44 පමණ පාසල් උපකරණ ලබා දෙන ලදී.

- **මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන**
  ශ්‍රී ලංකාව තුළ කර්මාන්තශාලා වල සිදුවන අනතුරු වලින් මියගිය හෝ පූර්ණ බෙලහීන තත්වයට පත් කම්කරු ජනතාවගේ අද්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.
  මියගිය හෝ පූර්ණ ආබාධිත තත්වයට පත් වන සේවක සේවිකාවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් (පෙර පාසල් අද්‍යාපනයේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා එනම් වයස අවු. 3-25 දක්වා) දරුවන් මේ සඳහා සුදුසුකම් ලබන අතර, මෙම දරුවන් සඳහා රු.50,000 ක ස්ථාවර තැන්පතුවක් හා අධ්‍යාපන උපකරණ ලබා දේ.මෙහිදි 2023 වර්ෂය තුල ශිෂ්‍යත්වලාභින් 90 දෙනෙකු සඳහා රු.මි. 5.73ක ප්‍රතිලාභ ලබා දී ඇත.

- **නීති ආධාර ලබාදීමේ වැඩසටහන**
  පෞද්ගලික අංශයේ සේවකයන් අසාධාරණ ලෙස සේවයෙන් ඉවත් කර ඇති අවස්ථා වලදී පූර්ව දැනුම්දීමකින් තොරව ආයතන වසා දමන අවස්ථාවකදී සහ කම්කරු වන්දි කොමසාරිස් ඉදිරියේ පැමිණිල්ලක් ගොනුකර ඇති අවස්ථාවකදී සේවකයන්ට සහන ලබාදීම වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මේ යටතේ 46 දෙනෙකු සඳහා නීති ආධාරද, තිදෙනෙකු සඳහා නීති ආධාර අභියාචනා හා ප්‍රතිශෝධනද, තිදෙනෙකු සඳහා බේරුම්කරණ කටයුතු සඳහා නීති ආධාරද ලබා දී ඇත.


- **වෛද්‍ය ආධාර ලබාදීමේ වැඩසටහන**
  සේවයේ යෙදී සිටියදී උද්ගත වූ වෘත්තීය රෝගයකින් / කාර්මික රෝගයකින් පෙලෙන සේවා නියුක්තයන් 11 දෙනෙකු සඳහා වෛද්‍ය ආධාර සහන සැලසීම වෙනුවෙන් රු. 620,000.00 වැය කර ඇත.

**ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය**




**ප්‍රස්තාරය 2.7 -** ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය

**ලොතරැයි ආදායම**




**ප්‍රස්තාරය 2.8 -** ලොතරැයි ආදායම - ශ්‍ර.වා.අ.

## 2.1.2 විදේශ රැකියා ක්ෂේත්‍රය


- **විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ආරක්ෂා කිරීම, සුභසාධනය හා සවිබල ගැන්වීම**

**පවුල් පසුබිම් වාර්තා නිකුත් කිරීම ;**

විගමනික කාන්තාවන්ගේ බාල වයස්කාර දරුවන්ට ආරක්ෂාව සැලසීම අරමුණු කර ගනිමින් "රැකියා සඳහා විදේශගත වීමට බලාපොරොත්තු වන කාන්තාවන්ගේ බාල වයස්කාර දරුවන්ගේ රැකවරණ වැඩපිළිවෙල පිළිබඳ වාර්තා ලබාගැනීම" යටතේ අංක 02/2023 හා 2023.03.31 දාතමින් නව චක්‍රලේඛයක් නිකුත් කර ඇත. 2023.04.18 දිනැතිව නිකුත් කරන ලද අංක 02/2023 (1) චක්‍රලේඛය මඟින් එයට සංශෝධන ඇතුළත් කිරීම සිදු කර ඇත. ඒ අනුව 2023 වර්ෂයේ සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) විසින් පවුල් පසුබිම් වාර්තා 82,461 ක් නිර්දේශ කර ඇත.

**'ශ්‍රමික සුරැකුම' වැඩසටහන ක්‍රියාවට නැංවීම ;**


ලියාපදිංචි විගමනික ශ්‍රමික පවුල්වල ආර්ථික තත්ත්වය නඟා සිටුවීම අරමුණු කරගෙන "පවුල් සංවර්ධන සැලසුම්" සහ විගමනික පවුල්වල සමාජයීය අවදානම් සහගත දරුවන් ඉලක්ක කර ගනිමින් "රැකවරණ සැලසුම්" සකස් කර ක්‍රියාත්මක කිරීම සිදු වේ. මේ යටතේ 2023 වර්ෂයේ ලියාපදිංචි වූ විගමනික ශ්‍රමික පවුල් සංඛ්‍යාව 43,605 කි.




**ප්‍රස්තාරය 2.9 -** ශ්‍රමික සුරැකුම යටතේ ලියාපදිංචිය

ශ්‍රමික සුරැකුම වැඩසටහන යටතේ ලියාපදිංචි විගමනික පවුල් ඉලක්ක කර ගනිමින් 2023 වර්ෂයේ පවුල් සංවර්ධන සැලසුම් 4,747 ක් සහ රැකවරණ සැලසුම් 812ක් සකස් කර ඇත.

මෙයට අමතරව විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ක්‍රියාත්මක විගමනික පවුල්වල දරුවන් සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබාදීම, පාසල් උපකරණ ලබාදීම, නැවත පැමිණි ශ්‍රමිකයින් සඳහා ස්වයං රැකියා ණය ලබාදීම, ආබාධිත පුද්ගලයින් සඳහා ස්වයං රැකියා සහ නිවාස ණය ලබාදීම, වෘත්තීය පුහුණු වැඩසටහන් වෙත යොමු කිරීම හා වෛද්‍ය සායන පැවැත්වීම, යනාදි වැඩසටහන් වෙත යොමු කිරීම සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරයි.




**ප්‍රස්තාරය 2.10 -** සංවර්ධන නිලධාරීන් විසින් සකස් කරන ලද පවුල් සංවර්ධන සහ රැකවරණ සැලසුම්

- **දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

  අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් විසින් විගමනික ප්‍රජාව ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන අතර 2023 වර්ෂයේ දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් 9,371 ක් පවත්වා ඇත.

  සුරක්ෂිත සංක්‍රමණය, නැවත සමාජගත කිරීම, ස්වයං රැකියා කුසලතා සංවර්ධනය සහ වෘත්තීය මාර්ගෝපදේශ, ළමා ආරක්ෂාව, මත්ද්‍රව්‍ය නිවාරණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය වැලැක්වීම සම්බන්ධ දැනුවත් බව ලබාදීම, මිනිස් වෙළඳාමේ ගොදුරක් නොවීම පිළිබඳ දැනුවත් කිරීම එම ක්ෂේත්‍ර වේ.

- **පුහුණුකරුවන් පුහුණු කිරීමේ ඒකකයේ ප්‍රගතිය**

  පුහුණුකරුවන් පුහුණුකිරීමේ ඒකකයේ ධාරිතා සංවර්ධනය සඳහා ස්විස් සංවර්ධන සහයෝගීතාවයේ මූල්‍ය ප්‍රදාන යටතේ හෙල්විටාස් ශ්‍රී ලංකා ආයතනයේ මෙහෙයවීමෙන් සිංහල හා දමිළ මාධ්‍යයෙන් පහත සඳහන් මාතෘකා යටතේ සකස් කරන ලද මාර්ගෝපදේශන 5ක් පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

  01. මනෝ සමාජීය සහාය හා ප්‍රථමාධාර
  02. දුක්ගැනවිලි කළමනාකරණය
  03. මහජන සම්බන්ධතා හා පාරිභෝගික සත්කාරය
  04. සංවර්ධන සැලසුම් සකස් කිරීම
  05. රැකවරණ සැලසුම් සකස් කිරීම

එමෙන්ම යාවත්කාලින කරන ලද  පුහුණු මොඩියුලය පිළිබඳව සිංහල හා දමිළ මාධ්‍යයෙන් පුහුණු වැඩසටහන් දෙකක් සිදු කරන ලදි. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහයෙන් දත්ත විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩසටහනක් පුහුණුකරුවන් පුහුණුකිරීමේ ඒකකයේ තෝරාගත් නිලධාරීන් සඳහා ලබා දෙන ලදි.

සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ අනුග්‍රහයෙන් හෙල්විටාස් ශ්‍රී ලංකා ආයතනයේ පහසුකම් සැලසීම මඟින් නැවත සමාජගතකරණය පිළිබඳව පුහුණුකරුවන් පුහුණුකිරීමේ ඒකකය සඳහා සිංහල හා දමිළ මාධ්‍යයෙන් පුහුණු වැඩසටහන්  ලබා දෙන ලදි.

මෙම පුහුණුකරුවන් පුහුණු කිරීමේ ඒකකයේ නිලධාරීන්ගේ සම්පත්දායකත්වයෙන් සුරක්ෂිත සංක්‍රමණය, මනෝ සමාජීය සහාය, ළමා ආරක්ෂාව හා රැකවරණය, තැනැත්තන් වෙළඳාම හා මිනිස් ජාවාරම, සංවර්ධන සැලසුම් සකස් කිරීම, ළමා රැකවරණ සැලසුම් සකස් කිරීම, විගමනික ශ්‍රමිකයින් නැවත සමාජගතකරණය යන මාතෘකා ඔස්සේ දිවයින පුරා සිටින විදේශ රැකියා සංවර්ධන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා මෙන්ම ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා 2023.12.31 වන විට පුහුණු වැඩසටහන් 637 ක්  සිදුකර ඇත.

- **විදේශ රැකියා නිමකර මෙරටට පැමිණි පුද්ගලයින් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම:**
  මෙම වැඩසටහන යටතේ ස්වයං රැකියාවක හෝ වෙනත් ආදායම් උත්පාදන කටයුතුවලට යොමුවීමට අපේක්ෂිත පුද්ගලයින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් හඳුනා ගැනීම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරී (විදේශ රැකියා) විසින් සිදු කරන ලද අතර, ප්‍රතිලාභීන් 1,026 ක ගේ තොරතුරු මෙම අමාත්‍යාංශයට ලැබී ඇත. එම තොරතුරු වලට අනුව උපකරණවල අවශ්‍යතාව පවතින ප්‍රතිලාභීන් 274 ක ගේ තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත, එම ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ස්වයං රැකියා සඳහා උපකරණ ලබාදීමේ වැඩසටහනට සම්බන්ධ කර ගැනීම සඳහා යොමු කරන ලදී.

- **විගමනික ශ්‍රමික පවුල්වල පාසල් අධ්‍යාපනය අවසන් කර ඇති දරුවන් සඳහා කාර්මික හෝ වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා සහාය දැක්වීම**
  විගමනික ශ්‍රමික පවුල්වල පාසල් අධ්‍යාපනය අවසන් කර, දේශීය/ විදේශීය රැකියාවකට යොමු වීමේ අපේක්ෂාවෙන් කාර්මික හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට බලාපොරොත්තු වන හා ඒ සඳහා ආර්ථික අපහසුතා පවතින දරුවන්ට සහාය දැක්වීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දත්ත හා තොරතුරු එක් රැස් කරන ලදී.

  ඒ අනුව මේ දක්වා දිස්ත්‍රික්ක 10 කට (ගම්පහ, යාපනය, කිලිනොච්චිය, මඩකලපුව, කුරුණෑගල, පුත්තලම, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල සහ කෑගල්ල යන) අදාලව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 119 කින්  දරුවන් 956 කට අදාලව තොරතුරු ලැබී ඇති අතර, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින වෘත්තීය පුහුණු ආයතන වෙත එම දරුවන් ද සම්බන්ධ කර ගන්නා මෙන් දන්වා එම තොරතුරු ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කර ඇත.

- **සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය සඳහා වන ප්‍රගති සමාලෝචන හා විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම්**
  විගමනික ප්‍රජාව වෙනුවෙන් සහ විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා මෙම අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් විසින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ දී සිදුකරනු ලබන කාර්යභාරය අධීක්ෂණය සහ ප්‍රගතිය සමාලෝචනය වෙනුවෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමාගේ මඟ පෙන්වීම මත ගරු විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහ අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පවත්වන විශේෂ ප්‍රගති සමාලෝචන රැ ස්වීම් මධ්‍යම,  සබරගමුව, උතුරු මැද, නැගෙනහිර, උතුර සහ දකුණ යන පළාත්වල පවත්වන ලදී.

  දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගතිය අධීක්ෂණය සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම් 13ක් විදේශ රැකියා අංශය විසින් පවත්වා ඇති අතර

දිස්ත්‍රික් සංවර්ධන නිලධාරී විසින් කාර්තුමය වශයෙන් දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 56 ක් පවත්වා ඇත.

- **විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත් සභාවල සහයෝගය ලබා ගැනීම**
  විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා පළාත් මට්ටමින් සහයෝගය ලබාගැනීමට ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් 2023.01.30 දින අමාත්‍යාංශ පරිශ්‍රයේ දී පළාත් ආණ්ඩුකාරවරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් රැස්වීමක් පවත්වන ලදී. මෙහිදී එක් එක් පළාත් සභාව සතු රැකියා පුහුණු විභවතාවයන් හඳුනා ගැනීමට හැකි වූ අතර ඒ තුළින් විදේශ රැකියා ප්‍රවර්ධනයෙහි වැඩි ඵලදායිතාවයක් අත් කර ගැනීමට හැකි විය.

  මෙම සාකච්ඡාවට සමගාමීව හෝටල් හා ආගන්තුක සත්කාර සේවය, වෘත්තීය පුහුණු සහ කෘෂිකර්මය යන ක්ෂේත්‍ර 3 ට අදාලව ගරු විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා පවත්වන ලද අතර මෙම ක්ෂේත්‍ර 3 ඔස්සේ විදේශ රැකියා ප්‍රවර්ධනය සිදු කළ හැකි බවත් ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව වැඩි දුරටත් සාකච්ඡා කරන ලදී. ඒ අනුව ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) මට්ටම් 05 සහ 06 සමත් කෘෂිකර්ම ඩිප්ලෝමාධාරීන් ජපන් විදේශ රැකියා සඳහා යොමු කිරීමත් සාත්තු සේවය සඳහා වැඩි ඉල්ලුමක් පවතින බැවින් ඒ සඳහා සුදුසුකම්ලත් පිරිසක් බිහිකර ගැනීම සඳහා සුදුසු පුහුණු වැඩසටහන් හා NVQ සහතික ලබාගැනීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලදි.

  - මධ්‍යම පළාත් සභාව විසින් ලබා දී ඇති NVQ සහතිකලත් තරුණ තරුණියන් 31 දෙනෙකු සඳහා බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන සහභාගීත්වයෙන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර විදේශ රැකියා සඳහා තෝරා ගන්නා ලදී.

  - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෘත්තීය හා පුහුණු මධ්‍යස්ථානය මඟින් ලබා දුන් 'කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාව' සහ 'ජාතික ඩිප්ලෝමාව' සමත් 1147 ක් වූ ඩිප්ලෝමා ධාරීන්ගේ නාමලේඛනය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කරන ලදී. මෙම ලැයිස්තුව අනුව වරින් වර සම්මුඛ පරීක්ෂණ පවත්වා ඉදිරි කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

  - මතුවන අවශ්‍යතාවය අනුව ආගන්තුක සත්කාර සේවා ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමිකයින් පුහුණු කිරීම සඳහා බදුල්ල සහ ගාල්ල පුහුණු මධ්‍යස්ථානවල ඉඩ පහසුකම් ලබාදීම සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය හා ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට නියමිතය.

  - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි (TVEC) පුහුණු මධ්‍යස්ථානවල පුහුණුව ලත් පුහුණුලාභීන්ගේ යාවත්කාලීන තොරතුරු ලබාගැනීම සඳහා කාර්යාංශයේ තොරතුරු තාක්ෂණ අංශය අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටියි. මෙමඟින් බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා වෘත්තීය පුහුණුවලත් පුහුණුලාභීන්ගේ යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමට හැකි වේ.

- **රැකියා පොළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

- **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වලට අදාළ ප්‍රගතිය**


විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආරක්ෂා කිරීම හා සවි බලගැන්වීම සඳහා විදේශ රැකියා ක්‍රියාවලියේ අදියර තුනේදීම එනම්; පූර්ව විගමන අවධිය (තීරණ ගැනීම, පෙර විගමනික පුහුණුව ලැබීම සහ පිටත්ව යාම ඇතුළුව), සේවයේ යෙදෙන අවධිය (රැකියාවල නියුතු සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආවරණයවන පරිදි) සහ ආපසු පැමිණීමේ හා නැවත සමාජගතවීමේ අවධිය (සමාජගත කිරීම, පිළිගැනීම සහ අගය කිරීම සැලකිල්ල යන කරුණු ඇතුලත්ව) යන අදියරවල

දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය කාර්යභාරය ඉටු කරයි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය මෙහෙයුම් ක්‍රියාවලිය තුළින් මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

- **විදේශ රැකියා ක්ෂේත්‍රයේ පාලනය හා නියාමනයः**

**වගුව 2.16** විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම්, විදේශ රැකියා ඇණවුම් අනුමත කිරීම් සහ විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම

| විස්තරය | | සංඛ්‍යාව |
|---|---|---|
| විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම | නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව | 144 |
| | අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව (වාර්ෂික අලුත් කිරීම්) | 961 |
| ශ්‍රී ලාංකිකයින් බඳවා ගන්නා විදේශයන්හි පිහිටි රැකියා නියෝජිත ආයතන සහ සමාගම් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම අලුත්කිරීම | ලියාපදිංචිකල විදේශීය රැකියා නියෝජිත ආයතන/ සමාගම් සංඛ්‍යාව (ගමනාන්ත රටවල) | 1,123 |
| | ලියාපදිංචිය අලුත්කල විදේශීය රැකියා නියෝජිත ආයතන/ සමාගම් සංඛ්‍යාව (ගමනාන්ත රටවල) | 844 |
| විදේශ රැකියා නියෝජිත ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන විදේශ රැකියා ඇණවුම් සහ දැන්වීම් සඳහා අනුමැතිය ලබාදීම | අනුමත කරන ලද රැකියා ඇණවුම් සංඛ්‍යාව | 4,260 |
| | අනුමත කරන ලද විදේශ රැකියා දැන්වීම් සංඛ්‍යාව | 1,341 |
| විදේශ රැකියා සඳහා ලියාපංදිංචි කිරීම් | බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන මගින් විදේශ රැකියා ඇබෑර්තු සඳහා ශ්‍රී ලාංකිකයින් බඳවා ගෙන විදේශගත කිරීම සඳහා ලබාදුන් අනුමැති සංඛ්‍යාව | 146,622 |
| | පුද්ගලික මාර්ගයෙන් විදේශ රැකියා සඳහා පිටත්ව යෑමට ලියාපදිංචි වූ විගමනික ශ්‍රමිකයින් සංඛ්‍යාව | 92,851 |
| | පුද්ගලික මාර්ගයෙන් විදේශ රැකියා සඳහා ලියාපදිංචිය අලුත්කල විගමනික ශ්‍රමිකයින් සංඛ්‍යාව | 48,803 |
| | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා දකුණු කොරියාව, ජපානය හා ඊශ්‍රායලය යන රටවල් සඳහා ලියාපදිංචි වූ විගමනික ශ්‍රමිකයින් සංඛ්‍යාව | 7,015 |
| | විදේශයන්හි පිහිටි දූත මණ්ඩල කාර්යාල හරහා ලියාපදිංචි වු විගමනික ශ්‍රමිකයින් සංඛ්‍යාව | 2,797 |
| | විදේශයන්හි පිහිටි දූත මණ්ඩල කාර්යාල හරහා ලියාපදිංචිය අලුත්කල විගමනික ශ්‍රමිකයින් සංඛ්‍යාව | 4,609 |



**ඡායාරූපය 2.8** - කොරියානු රැකියා ඇණවුම් පිළිබඳ සාකච්ඡාව

**වගුව 2.17** විදේශ රැකියා සඳහා බඳවා ගැනීම් සම්බන්ධව බලපත්‍රලාභී නියෝජිත ආයතන/ බලපත්‍රලාභී නොවන වෙනත් පාර්ශවවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| සිදුකළ පැමිණිලි පරීක්ෂණ සංඛ්‍යාව | 1,336 |
| විසඳන ලද පැමිණිලි පරීක්ෂණ සංඛ්‍යාව | 921 |
| නීති විරෝධී බඳවා ගැනීම් සම්බන්ධව සාර්ථකව සිදුකරන ලද වැටලීම් සංඛ්‍යාව | 25 |
| නීතිය උල්ලංඝනය කරන ලද බලපත්‍රලාභී/ බලපත්‍රලාභී නොවන පාර්ශවයන්ට එරෙහිව අධිකරණයේ ගොනුකල නඩු සංඛ්‍යාව | 137 |
| නීතිය උල්ලංඝනය කරන ලද බලපත්‍රලාභී/ බලපත්‍රලාභී නොවන පාර්ශවයන්ට එරෙහිව අධිකරණයේ/ කම්කරු විනිශ්චය සභාවේ පැවරූ නඩු සඳහා පෙනී සිටි වාර සංඛ්‍යාව | 4,121 |

**වගුව 2.18** විගමනික ශ්‍රමිකයින් වෙතින් හෝ ඔවුන් වෙනුවෙන් ලැබෙන පැමිණිලි විසඳීම සහ මිනිස් වෙළඳාමට එරෙහි ක්‍රියාකාරකම් - ශ්‍රී.ලං.වි.සේ.නි.කා

| විස්තරය | | 2023 වර්ෂය |
|---|---|---|
| විගමනික ශ්‍රමිකයින් වෙතින් හෝ ඔවුන් වෙනුවෙන් ලැබෙන පැමිණිලි විසඳීම | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 13,381 |
| | විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව | 9,786 |
| ව්‍යාපාර ගැටලු නිරාකරණය කිරීමට අදාළව ලැබුණු පැමිණිලි විසඳීම | ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව | 2,145 |
| | විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව | 547 |
| මිනිස් වෙළෙඳාමට අදාළ පැමිණිලි විසඳීම. | කාර්යාංශයේ මිනිස් වෙළඳාමට එරෙහි ඒකකය වෙත ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 71 |
| | මිනිස් වෙළඳාමට අදාළව ලැබුණු පැමිණිලි වලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කළ පැමිණිලි සංඛ්‍යාව | 61 |

**වගුව 2.19** විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක සුබසාධන වැඩසටහන් - ශ්‍රී.ලං.වි.සේ.නි.කා

| විස්තරය | | සංඛ්‍යාව | වටිනාකම (රු.මිලි.) |
|---|---|---|---|
| විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් කාර්යාංශය විසින් රක්ෂණ වාරික ගෙවීම | ගෙවන ලද රක්ෂණ වාරික සංඛ්‍යාව | 194,247 | 428.25 |
| විගමනික ශ්‍රමිකයින් සඳහා රක්ෂණ වන්දි ගෙවීම් (ගෙන්වා ගැනීම්, වෛද්‍ය වියදම්, මරණ වන්දි සඳහා වන වියදම් ඇතුළත්ව) | ගෙවන ලද රක්ෂණ වන්දි සංඛ්‍යාව | 782 | 129.35 |
| මැදපෙරදිග කලාපයේ ගෘහස්ථ අංශයේ රැකියා වල නියුතු කාන්තා ශ්‍රමිකයින් සඳහා සේවායෝජක විසින් රක්ෂණ වාරික මුදල් ගෙවනු ලබන රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. | විදේශ සේවායෝජක රක්ෂණාවරණය මගින් ආවරණය ලබා ඇති සේවක සංඛ්‍යාව | 44,156 | |
| | රක්ෂණ හිමිකම් සඳහා ඉල්ලුම් කළ සේවක සංඛ්‍යාව | 38 | |
| | ගෙවන ලද රක්ෂණ හිමිකම් සංඛ්‍යාව | 17 | 7.03 |
| විදේශ රැකියාවේ යෙදී සිටියදී විවිධ අපහසුතා හේතුවෙන් මෙරටට පැමිණි විගමනික ශ්‍රමිකයින් හා විදේශ රැකියාවේ යෙදී සිටින ශ්‍රමිකයින්ගේ පැමිණීලි හා දුක්ගැනවිලි සම්බන්ධයෙන් කාර්යාංශය වෙත පැමිණෙන ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙත සුහසාධන පහසුකම් සැලසීම | පුද්ගලයින් සංඛ්‍යාව | 6,991 | 9.861 |
| විවිධ අපහසුතාවයන්ට පත් වූ විගමනික ශ්‍රමිකයින් එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල වල මැදිහත්වීම මත නැවත මෙරටට ගෙන්වා ගැනීම | ප්‍රතිලාභ ලැබූ විගමනික ශ්‍රමිකයින් සංඛ්‍යාව<br>• සේවක සුබසාධක අරමුදල මගින්<br>• රක්ෂණාවරණය මගින්<br>• වෙනත් මූලාශ්‍ර මගින් | 17<br>98<br>1,507 | 4.35 |
| සේවක සුබසාධක අරමුදල යටතේ වෙනත් සුබසාධන සහන සැලසීම. (විදේශ රැකියාවේ යෙදී සිටියදී විවිධ අපහසුතාවයන්ට පත්වූ විගමනික ශ්‍රමිකයින් වෙත එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා අවශ්‍ය සුහසාධන පහසුකම් සැලසීම, කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශ රැකියා සඳහා යොමුවී ලියාපදිංචිය ඉකුත්වූ විගමනික ශ්‍රමිකයින් වෙත අවශ්‍ය සුහසාධන පහසුකම් සැලසීම) | ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව | 1,414 | 142.375 |

| | | | |
|---|---|---|---|
| ස්වයං රැකියා ආරම්භ කිරීමට / වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රමිකයින් වෙත අවශ්‍ය උපකරණ / ද්‍රව්‍ය ලබා දීම | ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව | 115 | 5.701 |
| විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්හට වෛද්‍ය ප්‍රතිකාර සඳහා මූල්‍ය දායකත්වය ලබා දීම | ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව | 22 | 1.217 |
| විගමනික ශ්‍රමිකයින්ගේ දූ දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම | ප්‍රතිලාභ ලැබූ දූදරුවන් සංඛ්‍යාව | 1,416 | 13.588 |
| විගමනික ශ්‍රමිකයින්ගේ අවශ්‍යතා ඇති දූ දරුවන් සඳහා අවශ්‍ය මූල්‍ය සහය ලබා දීම | ප්‍රතිලාභ ලැබූ දූදරුවන් සංඛ්‍යාව | 3 | 0.675 |
| විගමනික ශ්‍රමිකයින්ගේ දූදරුවන් වෙත ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම | ප්‍රතිලාභ ලැබූ සිසුන් සංඛ්‍යාව | 2,064 | 53.92 |
| විගමනික ශ්‍රමිකයින් සඳහා මනුසවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. | විශ්‍රාම වැටුප් දායකත්වය ලබා ගැනීම සඳහා අයදුම්කර ඇති විගමනික ශ්‍රමිකයින් ගණන | 18,757 | |
| | විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා ඇති විගමනික ශ්‍රමිකයින් ගණන | 61 | |
| පළමු වරට විදේශ රැකියා සඳහා පිටත්ව යන ගෘහස්ථ පාලක සහායිකාවන්ගේ පවුල් සඳහා වියළි සලාක ප්‍රදානයක් ලබා දීම. | ප්‍රතිලාභ ලැබූ විගමනික ශ්‍රමිකයින් සංඛ්‍යාව | 52 | 0.52 |
| අවස්ථා 06කට වඩා වැඩි වාර සංඛ්‍යාවක් කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවල නියුතු විගමනික ශ්‍රමිකයින් ඇගයීම. | ප්‍රතිලාභ ලැබූ විගමනික ශ්‍රමිකයින් සංඛ්‍යාව | 97 | 0.77 |



**ඡායාරූපය 2.9** - විගමනික ශ්‍රමිකයින් සඳහා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**වගුව 2.20** පවත්වන ලද පුහුණු වැඩසටහන් - ශ්‍රී.ලං.වි.සේ.නි.කා

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| ගෘහස්ථ අංශයේ ගෘහපාලක සහායක පුහුණුව - මැද පෙරදිග (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම III) | 307 | 7,373 |
| ගෘහස්ථ අංශයේ ගෘහපාලක සහායක- නැගෙනහිර ආසියාතික සහ යුරෝපා රටවල් සඳහා (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම III) | 43 | 1,030 |
| සාත්තු සේවක පුහුණුව (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම III) | 74 | 2,609 |
| පළපුරුදු ගෘහස්ථ ගෘහ පාලන සහකාරවරියන් සඳහා ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන | 46 | 693 |
| ගෘහස්ථ නොවන රැකියා සඳහා පිටත්ව යන ශ්‍රමිකයින් සඳහා වූ පුහුණුව | 2,028 | 57,201 |
| පෙර විගමනික පුහුණුව - දකුණු කොරියාව | 88 | 3,643 |
| පෙර විගමනික පුහුණු පාඨමාලාව - ජපන් තාක්ෂණික සේවාස්ථ පුහුණු පාඨමාලාව (TITP) | 15 | 115 |
| විශේෂ භාෂා පුහුණුව (ජපන්) | 30 | 616 |
| විශේෂ භාෂා පුහුණුව (ඉංග්‍රීසි) | 27 | 902 |

- **රැකියා බැංකුව හරහා රැකියා අපේක්ෂකයින් ලියාපදිංචි කිරීම**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් පවත්වාගෙන යනු ලබන අන්තර්ජාලගත රැකියා බැංකුවෙහි ලියාපදිංචිවීම සඳහා විදේශ රැකියා බලාපොරොත්තු වන පුද්ගලයින් වෙත පහසුකම් සලසා ඇත. විදේශ රැකියා අපේක්ෂිකයින්ට කාර්යාංශයේ වෙබ් අඩවිය හරහා පුද්ගලිකවම ලියාපදිංචි විය හැකි අතර, ප්‍රධාන කාර්යාලය සහ පළාත් කාර්යාල මගින් ද ලියාපදිංචි විය හැක. තම අයදුම්පත රැකියා බැංකුවට යොමු කල දින සිට උපරිම වසර 2 ක කාලයක් සඳහා එය වලංගු වේ. මෙම රැකියා බැංකුව හරහා විදේශ රැකියා යෝජකයින්හට හා බලපත්‍රලාභී රැකියා නියෝජිත ආයතනවලට විදේශ රැකියා අපේක්ෂකයින් සොයා ගැනීමට පහසුකම් සැලසේ.

**වගුව 2.21** රැකියා බැංකුව හරහා රැකියා අපේක්ෂකයින් ලියාපදිංචි කිරීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කා

| විස්තරය | 2023 වර්ෂය |
|---|---|
| ලියාපදිංචි වූ රැකියා අපේක්ෂකයින් සංඛ්‍යාව | 35,825 |
| ලියාපදිංචි වූ රැකියා අපේක්ෂකයින් අතුරින් රැකියා සඳහා විදේශගත වූ ප්‍රමාණය | 7,739 |

**වගුව 2.22** ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශ රැකියා සඳහා බඳවා ගැනීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කා

| රට | විස්තරය | 2023 වර්ෂය |
|---|---|---|
| දකුණු කොරියාව | සාමාන්‍ය බලපත්‍ර ක්‍රමය යටතේ විදේශ ගතවූ පුද්ගලයින් සංඛ්‍යාව | 3,704 |
| | නැවත තම පෙර සේවා ස්ථානය වෙතම විදේශ ගතවූ පුද්ගලයින් සංඛ්‍යාව | 1,421 |
| | විශේෂ බලපත්‍ර ක්‍රමය යටතේ විදේශ ගතවූ පුද්ගලයින් සංඛ්‍යාව | 1,205 |
| ජපානය | තාක්ෂණික අභ්‍යාසලාභී පුහුණුපාඨමාලාව (TITP) යටතේ රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයින් සංඛ්‍යාව | 90 |
| ඊශ්‍රායලය | සාත්තු සේවක රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයින් සංඛ්‍යාව | 595 |

**වගුව 2.23** විදේශ රැකියා අවස්ථා සහ සුරක්ෂිත ශ්‍රම සංක්‍රමණය පිළිබඳව විදේශ රැකියා අපේක්ෂකයින් සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් / ජංගම සේවා පැවැත්වීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කා

| විස්තරය | 2023 වර්ෂය |
|---|---|
| පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 364 |
| සහභාගි වූ සංඛ්‍යාව | 19,244 |

**වගුව 2.24** විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමෙන් හා දිස්ත්‍රික් මට්ටමෙන් රැකියා පොළ වැඩසටහන් පැවැත්වීම - ශ්‍රී.ලං.වි.සේ.නි.කා

| විස්තරය | 2023 වර්ෂය |
|---|---|
| පැවැත්වූ රැකියා පොළ වැඩසටහන් සංඛ්‍යාව | 72 |
| සහභාගිවූ රැකියා අපේක්ෂකයින් සංඛ්‍යාව | 24,721 |
| සහභාගිවූ බලපත්‍රලාභී රැකියා නියෝජිත ආයතන සංඛ්‍යාව | 335 |

- **සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම**

ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ වැඩසටහන ක්‍රියාවට නැංවීම යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය සඳහා 2012.11.06 දින ISO 9001:2008 තත්ත්ව සහතිකය ලබා ගන්නා ලදි.

ඊට සමගාමීව ගුවන් තොටුපල හා සහන පියස (කටුනායක), පළාත් කාර්යාල 09 ක්, දිස්ත්‍රික්ක කාර්යාල 07ක් හා පුහුණු මධ්‍යස්ථාන 02ක් වෙත 2012.11.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි ISO 9001:2008 තත්ත්ව සහතිකය ලබා ගන්නා ලදී.

මෙම තත්ත්ව කළමනාකරණ සහතිකය, ප්‍රධාන කාර්යාලය සහ අනෙකුත් කාර්යාල වෙත 2018.04.26 වන දින සිට ISO 9001:2015 ලෙස ප්‍රමිතිය වෙනස් කර ගැනීමට කටයුතු කර ඇති අතර, මෙම ප්‍රමිති සහතිකය 2024.04.25 දින දක්වා වලංගුව පවතී.

- **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්**

  - ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමාගේ උපදෙස් අනුව ඊබීය අමාත්‍යාංශය විසින් සංවිධානය කළ "GLOCAL - 2023" වැඩසටහන යාපනය මුට්‍රවේලි ක්‍රීඩාංගනයේදී 2023 ජූලි 15 හා 16 දෙදින පවත්වන ලදී. එම වැඩසටහන සාර්ථක කරගැනීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය සක්‍රීය දායකත්වය ලබා දෙමින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

  - ඒ යටතේ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන වල සහභාගිත්වයෙන් උතුරු පළාත මූලික කරගනිමින් විදේශ රැකියා පොළ පැවැත්වීම, කාර්යාංශයේ ලියාපදිංචි උතුරු පළාතේ පදිංචි විගමනික ශ්‍රමිකයින්ගේ දූදරුවන් වෙත අධ්‍යාපනික ශිෂ්‍යත්ව හා පාසල් උපකරණ ප්‍රදානය කිරීම, උතුරු පළාතේ දූදරුවන්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් ඔප් නැංවීම සඳහා තරඟ පැවැත්වීම, නීත්‍යානුකූල හා සුරක්ෂිත රැකියා විගමනය පිළිබඳ විදේශ රැකියා අපේක්ෂකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී නැවත මෙරටට පැමිණි විගමනික ශ්‍රමිකයින් හට ස්වයං රැකියා ආරම්භ කිරීමට/ වැඩි දියුණු කිරීමට මූල්‍යමය ආධාර ලබාදීම සිදු කරන ලදි.

  - පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභා නිර්දේශය පරිදි, තැනැත්තන් වෙළෙඳාමට එරෙහි ජාතික කාර්යසාධක බලකායේ (NAHTTF) මූලිකත්වයෙන් කටුනායක බණ්ඩාරනායක

ජාත්‍යන්තර ගුවන්තොටුපල තුළ ආරක්ෂිත සංක්‍රමණ ප්‍රවර්ධන ඒකකයක් (Safe Migration Promotion Unit - SMPU) පිහිටුවීමට හා ඊට අවශ්‍ය භෞතික සම්පත් සපයා ගැනීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අනුග්‍රහය ලබා දෙන ලදී.

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ක්‍රියාත්මක කරන තාක්ෂණික සේවාස්ථ පුහුණු වැඩසටහන (TITP- IM Japan) යටතේ විදේශගත කරනු ලබන සීමාවාසික පුහුණුලාභීන් නියමිත පුහුණු කාලසීමාව අවසන් කර ශ්‍රී ලංකාවට පැමිණීමේදී ඔවුන් සේවය කළ ජපාන සමාගම විසින් එක් අයෙකුට වසරකට ජපන් යෙන් ලක්ෂ 2 බැගින් දීමනාවක් පිරිනමනු ලැබේ. මෙම සීමාවාසික පුහුණුව වසර 3ක් හෝ 5කි. ඒ අනුව, 2023.01.01 සිට 2023.12.31දක්වා පුහුණුලාභීන් හතලිස් හයදෙනෙකු (46) වෙනුවෙන් රු. 73,510,252.18ක මුදලක් ප්‍රදානය කර ඇත.

- ගෘහස්ත අංශයේ විදේශ රැකියා සඳහා පළමුවරට පිටත්වන කාන්තාවන්ගේ පවුලේ සාමාජිකයන් වෙත වියළි ආහාර ලබාගැනිමට රු 10,000.00 බැගින් වටිනා වවුචර්පත් ලබාදීමේ වැඩසටහන 2023.11.24 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේදී පවත්වන ලදී.

- ශ්‍රී ලංකා මහ බැංකුව හා එකාබද්ධව බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා මනුසවි විගමනික ශ්‍රමික බහුකාර්ය ණය යෝජනා ක්‍රමය 2023.12.04 දින ආරම්භ කරන ලදී.

- දෙසැම්බර් 18 දිනට යෙදී ඇති ජාත්‍යන්තර සංක්‍රමණික දිනය නිමිති කරගෙන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සංවිධානය කළ "විදෙස් ශ්‍රමික හරසර" විශේෂ වැඩසටහනට සමගාමීව පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

    - ඊශ්‍රායලයේ කෘෂිකාර්මික රැකියා සඳහා පිටත්වූ පළමු 30 දෙනා වෙනුවෙන් ගුවන් ටිකට්පත් හා ලේඛන පිරිනැමීම.

    - ජපානයේ පැවැත්වූ ජාත්‍යන්තර ජූඩෝ තරගාවලියක් සඳහා සුදුසුකම් ලබා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වූ වැලිමඩ, අඹගස්දෝව රාජකීය විද්‍යාලයේ ඉගෙනුම ලබන විදෙස් ශ්‍රමිකයෙකුගේ දියණියක වන චමෝදි විහංගි ශිෂ්‍යාව වෙනුවෙන් ඒ සඳහා සහභාගිවීමට අවශ්‍ය කරන ගුවන් ටිකට්පත සඳහා රුපියල් ලක්ෂ 4.5ක මුදලක් ලබාදීම.

    - මෙරට වැඩිම පිරිසක් විදෙස් රැකියා සඳහා පිටවී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඌරගස්මංහන්දිය ඩෙන්සිල් කොබ්බෑකඩුව විද්‍යාලයට රුපියල් මිලියනයක් වටිනා තූර්ය වාදක උපකරණ කට්ටලයක් පිරිනැමීම.

- **මූල්‍ය දායකත්වයන් ලබා දීම**

    - කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමාගේ මැදිහත්වීම මත ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය විසින් මහා භාණ්ඩාගාරය වෙත රුපියල් බිලියන 07ක මුදලක් ලබාදෙන ලදී.

    - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මහරගම අපේක්ෂා රෝහලට අවශ්‍ය ඖෂධ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 100ක මුදලක් පරිත්‍යාග කරන ලදී.

- **බලපත්‍රලාභි විදේශ රැකියා නියෝජිත ආයතනවල ප්‍රමිතිය ඉහළ නැංවීම**

බලපත්‍රලාභි විදේශ රැකියා නියෝජිත ආයතනයක යම් ක්‍රියාවක් හේතුවෙන් විගමනික ශ්‍රමිකයෙකුට හෝ විදේශ රැකියා අපේක්ෂකයෙකුට යම් මූල්‍ය අලාභයක් සිදුවූ බවට තහවුරු වන අවස්ථාවකදී, අදාළ බලපත්‍රලාභියා වෙතින් අයකර, එම අලාභය අගතියට පත්වූ පාර්ශවයට ගෙවීම සඳහා පැවති ක්‍රමවේදය සංශෝධනය කරන ලදී.

- කාර්යාංශය වෙත ඉදිරිපත් වන පැමිණිලි වල ස්වභාවය පිළිබඳව සලකා ලබා දිය යුතු බැංකු ඇපකරයේ වටිනාකම 2023 වර්ෂයේ ජනවාරි 01 දින සිට රු. ලක්ෂ 30 දක්වාත්, 2024 වර්ෂයේ ජනවාරි 01 දින සිට රු. ලක්ෂ 50 දක්වාත් වැඩිකිරීමට කටයුතු කර ඇත.

- විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලක ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග අඩි 1,000ක් හෝ ඊට වැඩි විය යුතු බවට නියම කර ඇත.

- බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා කොළඹ විශ්වවිද්‍යාලය සමඟ එක්ව ජාත්‍යන්තර සංක්‍රමණ අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාවක් හඳුන්වාදීම.

- ජාතික කම්කරු අධ්‍යයන ආයතනය සමඟ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවල සේවකයින් සඳහා ශ්‍රම සංක්‍රමණය සහ කාර්යාල කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් ක්‍රියාත්මක කිරීම.

- 2022 වර්ෂය තුළ විගමනික රැකියා ක්ෂේත්‍රයට අදාළව විදේශ රැකියාගත කිරීම්, පැමිණිලි, චෝදනා ඇතුළු සියලු කරුණු සලකා බලා, සාධනීය කාර්යභාරයක් ඉටුකළ රැකියා නියෝජිත ආයතන ඇගැයීම පිණිස 2023.03.14 කොළඹ බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 'Golden Award 2022' සම්මාන ප්‍රදානෝත්සවය පවත්වන ලදී.

- **අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම**

**වගුව 2.25** අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම් - ශ්‍රී.ලං.වි.සේ.නි.කා

| ගිවිසුම /කාරණය | ගිවිසුම් ගත වූ/අත්සන් කළ දිනය |
|---|---|
| SSW වැඩසටහන හරහා ජපානයට පුහුණු ශ්‍රමිකයින් පිටත් කර යැවීම සඳහා වන ද්විපාර්ශවීය අවබෝධතා ගිවිසුම,(ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ජපානයේ General Incorporated Foundation IM Japan ආයතනය සමඟ) | 2023.02.17 |
| ජපානයේ එහිමෙ ප්‍රාන්තයේ (EHIME PREFECTURE) කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තාක්ෂණික සීමාවාසික පුහුණුලාභීන් ලෙස ශ්‍රී ලාංකිකයින් යොමුකිරීමට අදාල සහයෝගිතා ගිවිසුම | 2023.06.07 |
| කොරියානු නැව් ඉදිකිරීම් රැකියා සඳහා පුහුණු ශ්‍රමිකයින් යොමු කිරීම ඉලක්ක කරගනිමින් පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ගංගාරාම විහාරස්ථානයට අනුබද්ධිත ශ්‍රී ජිනරතන අධ්‍යාපන ආයතනය සහ කොරියානු ක්ලූලයිෆ් ආයතන අතර අවබෝධතා ගිවිසුම | 2023.06.10 |
| විශේෂ නිපුණතා සහිත ශ්‍රී ලාංකික තරුණයින්ට SSW (Specified Skilled Workers) කාණ්ඩය යටතේ ජපානයේ රැකියා අවස්ථා ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ජපානයේ IM Japan ආයතනය සමඟ එළඹි ගිවිසුම | 2023.10.11 |



**ඡායාරූපය 2.10**
කොරියානු තානාපතිනිය සමග හමුව



**ඡායාරූපය 2.11**
සෞදි අරාබි මහකොමසාරිස් සමඟ හමුව

- **පුහුණු පාඨමාලා ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම**
  NVQ IV වන මට්ටම හෝ ඉන් ඉහළ පුහුණුව ලබා විදේශ රැකියා සඳහා යොමු වන විගමනික ශ්‍රමිකයින්ගේ වෘත්තීය පුහුණු පාඨමාලා ගාස්තුව, රු. 100,000.00ක උපරිමයක් දක්වා කාර්යාංශය විසින් ප්‍රතිපූර්ණය කිරීම.
- **මාර්ගගත ගෙවීම් පහසුකම (Online Payment Gateway) ක්‍රියාත්මක කිරීම**
  කාර්යාංශය මගින් ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් සහ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන වෙත ලබා දෙන සේවාවන් වඩාත් පහසුවෙන් සහ කාර්යක්ෂමව ඉටු කිරීමට මාර්ගගත ක්‍රමය ඔස්සේ ගෙවීම් කටයුතු කිරීම සඳහා මහජන බැංකුව හා එක්ව 2023.03.24 දින සිට මාර්ගගත ගෙවීම් පහසුකම (Online Payment Gateway) ක්‍රියාත්මක කර ඇත.

- **ප්‍රත්‍යානුකලන ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම**
  විදේශ රැකියාවල නිරතව සිට ශ්‍රී ලංකාවට පැමිණි විගමනික ශ්‍රමිකයින්, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආරම්භ කිරීමට දිරිගැන්වීම සහ මඟපෙන්වීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන බැංකු ආයතන, රාජ්‍ය ව්‍යවසායක සංවර්ධන ආයතන ඇතුළු ආයතන 23කගේ හා දේශීය රැකියා ලබා දීම සඳහා ආයතන 04කගේ හා සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයේ සහභාගීත්වයෙන් 2023.12.09 වන දින ගාල්ල විද්‍යාලෝක විද්‍යාලයේදී ප්‍රත්‍යානුකලන ජංගම සේවා වැඩසටහනක් පවත්වන ලදී.

## ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම

- **ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල ප්‍රගතිය**
  - 2023 වර්ෂය තුල ශ්‍රමිකයින් 659 ක ප්‍රමාණයක් විදේශ රැකියා සඳහා යොමු කර ඇත.
  - විවිධ වූ රැකියා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වීමෙන් විදේශගතවීමට අපේක්ෂිත පුහුණු ශ්‍රමිකයින් පන්දහසකට ආසන්න ප්‍රමාණයක් ලියාපදිංචි කිරීම.
  - E7 කාණ්ඩය යටතේ කොරියානු රාජ්‍ය සඳහා වෑද්දුම් ශිල්පීන් 221ක් මෙරටින් ප්‍රථම වරට විදේශ ගත කරන ලදී.
  - රුසියානු රාජ්‍ය සඳහා ජුකීමැෂින් ඔපරේටර් වරියන් 59 දෙනෙකු විදේශගතකරවන ලදී.
  - සර්බියාව සඳහා ජුකීමැෂින් ඔපරේටර් වරියන් 14 දෙනෙකු විදේශගත කරන ලදී.
  - මෝල්දෝවා රාජ්‍යය සඳහා ජුකීමැෂින් ක්‍රියාකරවන්නියන් 17 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් විදේශගත කරන ලදී.
  - ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගමේ නිල වෙබ් අඩවිය නවීන අංගෝපාංග සහිතව උත්රේෂණය කිරීම (web site upgrade).
  - ජෝර්දානය සඳහා කෘෂිකාර්මික කම්කරුවන් වශයෙන් 46 දෙනෙකු පිටත්කිරීම.

- **සුනිසි මෙහෙවර වැඩසටහන**
  සංවර්ධනය කරා යන මාර්ගයට ශ්‍රී ලංකාව අවතීර්ණ වීමට නම් යහපත් රැකියා ප්‍රවර්ධනය කළ යුතු වේ. මෙමඟින් නිදහස, සාධාරණත්වය, ආරක්ෂාව හා මානව ගරුත්වය යන තත්ත්වයන් තුළ ඵලදායී වැඩ ලබා ගැනීමට කාන්තාවන්ට හා පිරිමින්ට සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය. එසේම

රැකියා නිර්මාණය කිරීම පමණක් අපේක්ෂා නොකරන අතර එම නිර්මාණය කෙරෙන රැකියා පිළිගත හැකි තත්ත්වයේ ඒවා විය යුතු වීම විශේෂත්වයකි. සුනිසි මෙහෙවර වැඩසටහන ප්‍රධාන ස්ථම්භයන් හතරක් තුළ ක්‍රියාත්මක වේ. එනම්, රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායීතාව, වැඩබිමෙහි හිමිකම, සමාජ ආරක්ෂණය සහ සමාජ කතිකාවත. මෙම ප්‍රධාන ස්ථම්භ 4ට අමතරව ඵලදායිතා ප්‍රවර්ධනය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීම යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සෑම අංශයක්ම සම්බන්ධීකරණය කරනු ලැබේ.

සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. 14,173,345.00 ක ප්‍රතිපාදන 2023 වර්ෂයේදී වෙන් කරන ලද අතර එයට අදාල මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

**වගුව 2.26** සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය - 2023

| **ව්‍යාපෘතිය සිදු කරනු ලැබූ අංශය** | **වෙන් කළ ප්‍රතිපාදනය (රු.)** | **2023.12.31 දිනට වියදම (රු.)** | **වියදම් ප්‍රතිශතය** |
|---|---|---|---|
| **කම්කරු දෙපාර්තමේන්තුව** | | | |
| මානව සම්පත් සංවර්ධන අංශය | 5,809,500.00 | 3,420,274.25 | 59% |
| කාන්තා හා ළමා කටයුතු අංශය | 3,723,845.00 | 2,994,967.42 | 80.4% |
| කර්මාන්තමය සුරක්ෂිතතා අංශය | 1,930,000.00 | 1,708,000.00 | 88.5% |
| සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය | 620,000.00 | 620,000.00 | 100% |
| **ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය** | 2,090,000.00 | 2,061,490.00 | 98.6% |
| **එකතුව** | **14,173,345.00** | **10,804,731.67** | **76.23%** |

- **සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන කටයුතු**

- **අමාත්‍යාංශ කාර්යාලය**

  - මෙම අමාත්‍යාංශය විසින් වාර්ෂිකව කම්කරු ක්ෂේත්‍රයේ විවිධ කාලෝචිත තේමාවන් පාදක කර ගනිමින් පර්යේෂණ ජර්නලයක් ප්‍රකාශයට පත් කරයි. ඒ අනුව, 2023 වර්ෂයේ "Protecting and Comforting Workers" යන තේමාව පදනම් කර ගනිමින් පර්යේෂණාත්මක ලිපි කැඳවීම සිදු කර අවසන් අතර ඒවා කම්කරු විෂය පිළිබඳ හසළ දැනුමැති විද්වත් කමිටුවක් විසින් ඇගයීම් සිදු කර ඇති අතර අනතුරුව ඊ ජර්නලයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.



**ඡායාරූපය 2.12**
යාපනය දිස්ත්‍රික්කයේ පැවැත්වූ ජංගම සේවා වැඩසටහන

- කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන තුළින් මහජනතාව වෙත ලබා දෙන සේවාවන් ජනතාවට වඩාත් සමීප කරවීම සඳහා "GLOCAL FAIR - 2023" ජංගම සේවා වැඩසටහන යාපනයේ මුට්‍රවේලි ක්‍රීඩාංගණයයේදී 2023 ජූලි 15 සහ 16 දෙදින තුළ පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා 13,800ක මහජන සහභාගීත්වයක් සහිතව සාර්ථකව පවත්වන ලදි.

- සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ සියලු සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද අතර ඊහි ප්‍රගතිය වගු අංක 2.27 යටතේ දක්වා ඇත.

- ශ්‍රී ලංකා සේවක සඟරාව ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ සියලු කටයුතු සිදු කිරීම. වර්තමානයේ දී අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ශ්‍රී ලංකා සේවක සඟරාවේ සමාලෝචිත කාලයට අදාළව කාණ්ඩ අංක 72හි II කලාපය හා 73හි I කලාපය ප්‍රකාශයට පත් කරන ලදී.

- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ පාර්ශව වෙත යොමු කිරීම. ශූන්‍ය පාදක අයවැය සංවර්ධන වැඩසටහන යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සෑම මසකම ප්‍රගතිය ඇගයීම මගින් ඉලක්ක වෙත ළඟාවීම අධීක්ෂණය හා දිරිගැන්වීම

- ජාතික අයවැය චක්‍රලේඛ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම
- අමාත්‍යාංශය විසින් 2023 වර්ෂයේදී අත්කරගත් ප්‍රගතිය ඇතුලත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම

- අමාත්‍යාංශයේ 2024 වර්ෂයට අදාළ අයවැය ප්‍රතිපාදන අනුමත කර ගැනීම සඳහා පවත්වනු ලබන පාර්ලිමේන්තුවේ අයවැය කාරක සභා විවාදයට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රගති වාර්තාව සකස් කිරීම.

- **පාලන සහ ආයතන කටයුතු**

    - 2023 ජනවාරි මස සිට දෙසැම්බර් 31 දක්වා මෙම අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 41ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර ඉන් 39ක් සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ ලැබී ඇත.

    - ජූලි වර්ජකයින්ට සහන සැලසීම යටතේ වයස අවු. 65 සම්පූර්ණ වන ජූලි වර්ජකයින් 45ක් වෙනුවෙන් එක් වරක් පමණක් ගෙවන සහන දීමනාව, ගෙවීම් කටයුතු සඳහා අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇත

    - මහජන පැමිණිලි 480ක් සමාලෝචිත කාලය තුළ ලැබී ඇති අතර සියල්ල ඉදිරි පියවර ගැනීම සඳහා අදාළ අංශ වෙත යොමු කර ඇත. එම අංශවලින් පිළිතුරු වාර්තා 45ක් ලැබී ඇත

    - තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලීම් 20ක් ලැබී ඇති අතර සියලුම ඉල්ලීම් සම්බන්ධයෙන් තොරතුරු ලබා දී ඇත.

    - විවිධ ආයතන මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා අමාත්‍යාංශ නිලධාරීන් 255ක් සමාලෝචිත කාලය තුළ සහභාගි කරවා ඇත. පෞද්ගලික ලිපි ගොනු කළමණාකරණය, ව්‍යාපෘති වාර්තා සැකසීම, බැහැරගත නායකත්ව හා පෞරුෂ සංවර්ධන වැඩමුළු සහ

පශ්චාත් උපාධි පාඨමාලා වැනි පාඨමාලාවන් සඳහා මෙම නිලධාරීන් යොමු කරවා ඇති අතර මේ සම්බන්ධ තොරතුරු සය වන පරිච්ඡේදයේ දක්වා ඇත.

- අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශයෙහි සේවයේ නියුක්ත සංවර්ධන නිලධරයන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම පුහුණු වැඩසටහන්, වත්මන් විදේශ රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම, පවුල් පසුබිම් වාර්තා නව චක්‍රලේඛය පිළිබඳ දැනුවත් කිරීම හා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් වශයෙන් පවත්වා ඇත.

මීට අමතරව, සමාලෝචිත කාල සීමාව තුළ පහත ආයතනික කාර්යයන් සිදු කරන ලදී

**වගුව 2.27** ආයතන කටයුතුවල ප්‍රගතිය

| අ. අං. | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු | 20 |
| 02 | මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ වාර්තා | 03 |
| 03 | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | 12 |
| 04 | පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | 16 |
| 05 | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ | 23 |

- **අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය**

2023 අයවැයෙන් අමාත්‍යාංශයට සහ අනුබද්ධ ආයතනවලට වෙන් කර ඇති මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව කාර්යක්ෂම, ඵලදායී සහ ආර්ථික පරිපාලනය සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

**වගුව 2.28** භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝජනය කිරීම


| | ආයතනය | වියදම (රු.) '000 | |
|---|---|---|---|
| | | **පුනරාවර්තන** | **ප්‍රාග්ධන** |
| 1 | අමාත්‍යාංශ කාර්යාලය | | |
| | කම්කරු අංශය | 245,312 | 16,804 |
| | විදේශ රැකියා අංශය | 686,491 | 296,926 |
| 2 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | - | - |
| 3 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය | - | - |
| 4 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 39,674 | 7,723 |
| 5 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 522,570 | 36,579 |
| | **එකතුව** | **1,494,047** | **358,032** |
| 6 | කම්කරු දෙපාර්තමේන්තුව | 2,535,084, | 131,303 |
| 7 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 533,384 | 34,107 |
| | **මුළු එකතුව** | **2,027,431** | **523,442** |

- **අභ්‍යන්තර විගණන කටයුතු**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා

සෞඛ්‍ය ආයතනය, ශ්‍රම වාසනා අරමුදල, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය හා ශ්‍රී ලංකා විදේශ රැකියා පෞද්ගලික සමාගම යන ආයතනයන්හි අදාළ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමේ වගකීම හා අවශ්‍යතාවය අනුව විශේෂ පරීක්ෂණ ද අභ්‍යන්තර විගණන විෂයට අදාළ විෂය පථය වේ.

- **ඉටු කරන ලද කාර්යභාරය**




| | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය | කම්කරු දෙපාර්තමේන්තුව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | මිනිස්බල රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම |
|---|---|---|---|---|---|---|---|---|---|
| පැවැත් වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ගණන | 3 | 4 | 3 | 4 | 3 | 3 | 4 | 4 | 3 |
| සිදුකළ විගණන පරීක්ෂණ ගණන | 1 | 20 | 1 | 1 | 1 | 2 | 13 | 2 | 1 |

**ප්‍රස්තාරය 2.11 -** විගණන කළමනාකරණ කමිටු රැස්වීම් සහ සිදුකළ විගණන පරීක්ෂණ

සටහන්:

i. සියළුම ආයතනවල අදාළ තොරතුරු ඇතුළත් කර කාර්තු 04 සඳහා කාර්තු වාර්තාව නිකුත් කරනු ලැබේ
ii. වර්ෂය ආරම්භයේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සියලුම ආයතන වෙතින් තොරතුරු කැඳවීමෙන් මූලික වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ
iii. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහා සෑම ආයතනයකම අදාළ රැස්වීම් සාකච්ඡා සටහන් හා රැස්වීම අවසානයේ ඒ ඒ ආයතනය සඳහා රැස්වීම් වාර්තා සකස් කර ඉදිරිපත් කරනු ලබයි

## 2.2 . ඉදිරි දැක්ම

වර්තමාන ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික තත්වයන්ට අනුකූල වන අයුරින් සහ ශ්‍රී ලංකාව තුළ ආයෝජන හිතකාමී වාතාවරණයක් ඇති කිරීම උදෙසා නෛතික ප්‍රතිපාදන ඇති කිරීම අමාත්‍යාංශය සතු කාලීන වගකීමකි. එහි දී පවතින අණ පනත්, නීති රීති වර්තමාන වැඩ ලෝකයට ගැලපෙන අයුරින් සංශෝධනය කරන අතරම වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ද මෙම අමාත්‍යාංශය බැඳී සිටියි. එසේම, විදේශ රැකියා වෙළඳපළ සඳහා නව තාක්ෂණික දැනුම සහ කුසලතාවයන් සහිත නිපුණතා පූර්ණ ශ්‍රමිකයන් යොමු කිරීම ප්‍රධාන අරමුණ කොට ගෙන සාම්ප්‍රදායික විදෙස් ශ්‍රම වෙළඳපළ ඇති රටවලට අමතරව, නව ශ්‍රම වෙළඳපළ වෙත ශ්‍රමිකයන් යැවීම හා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ග්‍රහණය කර නොගත් රටවල් සඳහා ශ්‍රමිකයන් යොමු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. ඒ සඳහා අමාත්‍යාංශය විසින් ඉදිරි සැලසුම් සහ ක්‍රියාකාරකම් සකස් කිරීමේ දී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කර ඇත.

- අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු
- 2022/07/22 දිනැති අංක 2289/43 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් හා කර්තව්‍යයන්
- අමාත්‍යාංශයට අදාළ තිරසාර සංවර්ධන අරමුණු
- කම්කරු හා විදේශ රැකියා ක්ෂේත්‍රයන්ට අදාළව ශ්‍රී ලංකාව එකඟ වී ඇති ජාත්‍යන්තර සම්මුතීන් හා එකඟතාවල ඇතුලත් කරුණු

### 2.2.1. කම්කරු ක්ෂේත්‍රය

**කම්කරු ක්ෂේත්‍රයට අදාළ නීතිමය රාමුව ශක්තිමත් කිරීම**

යල්පැන ගිය කම්කරු නීති වර්තමාන වැඩලෝකයට ගැලපෙන ආකාරයට සහ පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීම සඳහා කිරීමේ දැඩි අවශ්‍යතාවයක් මතුව ඇති බව හඳුනාගෙන ඇත.

ඒ අනුව,

**i. වර්තමාන සමාජ ආර්ථික පරිසරයට ගැලපෙන ප්‍රතිපාදන සහිතව නව සේවා නියුක්ති පනතක් සකස් කිරීම**

කම්කරු අණපනත් සංශෝධනය කිරීමේ කටයුතු මේ වන විටත් අරඹා ඇති අතර වර්තමාන වැඩ ලෝකයට ගැලපෙන ආකාරයට සරල කම්කරු නීතියක් සකස් කිරීම සඳහා වෘත්තීය සමිති, හාම්පුතුන් සහ විවිධ පාර්ශවකරුවන් සමග සාකච්ඡා වාර ගණනාවක් පවත්වා එම අදහස් මත සේවා නියුක්ති පනත් කෙටුම්පතක් සකස් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. ඒ අනුව, පනත් අතර පවතින විෂමතා ඉවත්කරන අතරම නම්‍යශීලී සේවා කොන්දේසි ආදිය ඇතුලත් කර දළ කෙටුම්පතක් සකස්කර ඇත. එහි දී දැනුම් ක්‍රියාවලිය බාහිරින් සපයා ගැනීමේ (KPO) ආයතන, ව්‍යාපාර ක්‍රියාවලිය බාහිරින් සපයා ගැනීමේ (BPO) ආයතන සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ව්‍යාපාර (ICT Enabling Services) ආවරණය වන පරිදි හා එම ආයතනවල කාන්තා සේවිකාවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ප්‍රතිපාදන ඇති කිරීම තුළින් සහ කාන්තා සේවා නියුක්තිය වැඩි කිරීමට ද අපේක්ෂිතය. ඒ අනුව, මෙම කාර්යය සඳහා පත්කළ විශේෂ කමිටුව විසින් පනත් කෙටුම්පත සකස් කරමින් පවතී.

ආයෝජන දිරි ගැන්වීම සඳහා වඩාත් හිතකර වූ පරිසරයක් නිර්මාණය කිරීමේ රජයේ ප්‍රතිපත්තිය අනුව, දශක ගණනාවක් පැරණි සහ සංකීර්ණ වූ කම්කරු නීති වෙනුවට සරල වූ ද සේව්‍ය සහ සේවක සම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වන්නා වූ ද නව කම්කරු නීතිය හඳුන්වා දීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව 2023 වර්ෂයේදී මූලික කටයුතු ආරම්භ කරන ලද අතර එහි ඉදිරි කාර්යයන් සිදු කිරීමට නියමිතය.

### ii. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පනත සංශෝධනය

ශ්‍රී ලංකාවේ වෘත්තීය ආරක්ෂණ සංස්කෘතියක් ඇති කර සුරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න හා වෘත්තීය අනතුරු අවම වන වැඩ පරිසරයක් ඇති කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන පනත සංශෝධනයට අපේක්ෂා කෙරේ.

- ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය කළමනාකරණ පද්ධතිය ජාතික ප්‍රමිතියක් ලෙස පුද්ගලික අංශයේ ආයතන තුළ ක්‍රියාත්මක කිරීම
- අදාළ කාර්යයන් ඉටු කිරීම හා නියාමනය කිරීම මඟින් වෘත්තීය සෞඛ්‍ය පිළිබඳ ප්‍රමිතීන් අත්කරලීමට හැකිවන පරිදි සුරක්ෂිතතා නිලධාරීන් පුහුණු කිරීම හා බලගැන්වීම
- සුරක්ෂිතතා නිලධාරීන්ගේ අවම සුදුසුකම් නිර්ණය කිරීම
- පුද්ගල ආරක්ෂණ උපකරණ සපයන ආයතන නියාමනය කරමින් ප්‍රමිතීන් ස්ථාපනය හා නියාමනය
- ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වය සඳහා වන මධ්‍යස්ථානයක් (Center for Excellence) ලෙස සංවර්ධනය කිරීම

එමඟින් සෞඛ්‍ය ආරක්ෂිත වැඩ පරිසරයක් තුළ සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් ඇති කිරීමට අවශ්‍ය මානව සම්පත ගොඩ නැගීම මෙන්ම ආදායම් ලබන මාර්ගයන් උත්පාදනය කිරීමටද අපේක්ෂිතය.

### iii. ශ්‍රම වාසනා අරමුදල් පනත සංශෝධනය

සිදු කරනු ලබන සුභසාධන කාර්යයන් තව දුරටත් පුළුල් කිරීම සඳහා සේවා නියුක්තිකයා යන අර්ථ නිරූපණය තුළට දෛනික වැටුප් ලබන සේවකයින් ඇතුලත් වන සේ ශ්‍රම වාසනා අරමුදල් පනත සංශෝධනය කිරීමට නියමිතය.

### iv. ශ්‍රමිකයන් සඳහා නව සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම

වර්තමානයේදී සෞඛ්‍ය හා වෘත්තිය ආරක්ෂණ ප්‍රතිලාභ, මාතෘ ප්‍රතිලාභ, සේවා වියුක්ති ප්‍රතිලාභ, සේවක වන්දි ප්‍රතිලාභ සේවායෝජකයා විසින් දැරිය යුතු වේ. එම ප්‍රතිලාභ සේවායෝජකයාට අමතර බරක් නොවන පරිදි ලබා දීම සඳහා මෙන්ම සමාජ ආරක්ෂණය සහ රැකියා විරහිත වූවන් සඳහා රක්ෂණ පහසුකම් සැපයීම සඳහා නව ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතු අතර මේ වන විට ඒ සම්බන්ධ අධ්‍යයනයක් ආරම්භ කර ඇත.

### v. ශ්‍රී ලංකාවේ සමස්ත ශ්‍රම බලකාය (රාජ්‍ය සේවයේ නියුතු වූවන් හැර) සම්බන්ධයෙන් ඩිජිටල්කරණය කළ ජාතික ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කිරීම

නම්‍යශීලී ක්‍රියාපටිපාටි, ඩිජිටල් හා ස්වයංක්‍රීය විසඳුම් හරහා සේව්‍ය සේවක දෙපක්ෂයටම පහසුවෙන් ප්‍රවේශ විය හැකි මෙන්ම, අඩු වැයකින් විනිවිදභාවයෙන් යුතුව අවශ්‍ය සේවාවන් සැපයීම අරමුණු කරගෙන ජාතික ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ඇති කිරීමට අපේක්ෂිතය. මෙමඟින් කම්කරු දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙනු ලබන සේවාවන් ඩිජිටල්කරණය කරන අතරම හඳුන්වාදෙන ඒකාබද්ධ වේදිකාවක් (Unified platform) හරහා මෙම අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සියලු ආයතන හරහා සේවාවන් හා සම්බන්ධ වන විවිධ සේවාවන් සපයන අමාත්‍යාංශ / රාජ්‍ය ආයතන සමඟ නිසි සම්බන්ධීකරණයක් ඇති කිරීමට අපේක්ෂිතය. එහිදී සේවාලාභීන් සඳහා අනන්‍ය වූ හඳුනාගැනීමේ අංගයක් යටතේ විද්‍යුත් වැටුප් ගෙවීම, සේවා වියුක්තිකයන් සඳහා රක්ෂණ ක්‍රම, මාතෘ ප්‍රතිලාභ වන්දි ප්‍රදානයන් හා රැකියා වියුක්තිය ආදී සියලු තොරතුරු රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- ශ්‍රී ලංකාවේ සියලු දිස්ත්‍රික්ක 2025 වර්ෂය වන විට 'ළමා ශ්‍රමයෙන් තොර කලාප' ලෙස තහවුරු කිරීම සඳහා අදාල කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට අපේක්ෂිතය. ඒ අනුව, 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති නිදහස් වෙළඳ කලාප, කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ඇති කාර්මික ජනපද, ප්‍රාදේශීය වැවිලි සමාගම් යටතේ ඇති වතු ආදී විධිමත් ක්ෂේත්‍රයන් ළමා ශ්‍රමයෙන් තොර කලාප බවට වන ප්‍රතිඥාව

ලබා ගැනීම සඳහා වන ක්‍රමවේදයක් සකස් කිරීමට අපේක්ෂිතය. එසේම, විශේෂයෙන්ම ධීවර ක්ෂේත්‍රය ආශ්‍රිත ළමා ශ්‍රමය ශූන්‍ය කිරීමේ අරමුණ පෙරදැරිව එම ක්ෂේත්‍රය ආශ්‍රිතව විශේෂ පරීක්ෂණ සහ වැටලීම් මාලාවක්ද සිදු කිරීමටද සැලසුම් කර ඇත.

- කම්කරු දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් මට්ටමින් සේවක අර්ථසාධක අරමුදල යටතේ නව සාමාජිකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා නව මෘදුකාංග පද්ධතියක් භාවිතා කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වල නව මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමටත් නිලධාරීන් පුහුණු කිරීමෙන් අනතුරුව නව සාමාජික ලියාපදිංචි කටයුතු ආරම්භ කිරීමටත් සැලසුම් කර ඇත. මෙම නව මෘදුකාංග පද්ධතිය භාවිතය මගින් රැකියාවට බැඳුනු අවස්ථාවේදීම සේවකයාට අදාල දිස්ත්‍රික් හෝ උප කම්කරු කාර්යාලය වෙත පැමිණ ඇඟිලි සලකුණු ලබා දී සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචි වීමට අවස්ථාව සැලසේ. එමගින් ආරම්භක අවස්ථාවේදීම සේවකයා පිළිබඳ නිවැරදි දත්ත, මෘදුකාංග පද්ධතියට ඇතුලත් කර ගත හැකි වීම මගින් සේවකයා වෙත සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබා දෙනු ලබන අවස්ථාවලදී ඇතිවන ගැටලු අවම කර ගනිමින් කාර්යක්ෂම සේවාවක් සේවාලාභීන් වෙත ලබා දීමට අවස්ථාව සැලසේ.

- කොළඹ, කළුතර සහ ගම්පහ යන දිස්ත්‍රික්කයන්හි පිහිටි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආශ්‍රිතව සිදු වන අනතුරු සහ ලෙඩ රෝග අවම කිරීමේ අරමුණින් එම දිස්ත්‍රික්ක තුනෙහි පිහිටි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සම්බන්ධයෙන් මූලික සංගණනයක් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කර එම කර්මාන්තවල වැඩ පරිසර තත්ත්වයන් පිළිබඳ මිනුම් ලබා ගැනීමෙන් අනතුරුව එම කර්මාන්තවල වෘත්තීයමය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය වර්ධනයට අවශ්‍ය නිර්දේශ ලබා දීම සහ නිරන්තර පසු විපරම් කිරීමට අපේක්ෂිතය.

- දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය තුලින් මාර්ගගත සේවා පහසුකම් ලබා දීමේ කටයුතු කඩිනම් කිරීමත්, දේශීය විශ්ව විද්‍යාලවල සහය සහිතව කම්කරු ක්ෂේත්‍රයට අදාල යෝග්‍ය පර්යේෂණ මාතෘකා යටතේ පර්යේෂණ නිබන්ධන සකස් කිරීමත් කම්කරු දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලසුම් අතර වේ.

මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ ඉදිරි ඉලක්ක අතර අධ්‍යාපන අමාත්‍යාංශය හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව 2024 වර්ෂයේදී දිවයින පුරා සියළුම රජයේ පාසල් වල 9 වසර සිසුන් ආවරණය වන පරිදි කාණ්ඩ විෂයන් තෝරා ගැනීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශය ලබා දීම, අනාගත ශ්‍රම වෙළඳපොළ අරමුණු කරමින් නිපුණතාවයෙන් හෙබි ශ්‍රමිකයන් බිහි කිරීම උදෙසා පාසල් සිසුන් හා රැකියා අපේක්ෂිතයන් දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපොළ ප්‍රවණතා පිළිබඳව අඛණ්ඩව දැනුවත් කිරීම් මාලාවක් ක්‍රියාත්මක කිරීම සහ 2024 වර්ෂය තුළදී අවම වශයෙන් 30000 ක සුහුරු ශ්‍රමිකයන් පිරිසක් දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපොළ වෙත යොමු කිරීම ප්‍රමුඛ වේ.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ඉදිරි සැලසුම් වශයෙන් ආදායම් ඉපයීම ඉලක්ක කර ගත් පහත සඳහන් නව උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

- බාහිර ආයතන සමඟ නව සබඳතා වැඩි දියුණු කිරීම.
- සමීක්ෂණයක් මඟින් ඉලක්කගත වෙළෙඳපළ තවදුරටත් හඳුනා ගැනීම.
- පංති කාමර වැඩසටහන් වල ගුණාත්මකභාවය තවදුරටත් ඉහළ නැංවීම.
- නව වැඩසටහන් හඳුන්වාදීම.
- කම්කරු නීති හා කාර්මික සබඳතා ඩිප්ලෝමා පාඨමාලාව NVQ Level V යටතේ ආරම්භ කිරීම.
- විශේෂ වැඩමුළු (Workshop) පැවැත්වීමට අවශ්‍ය පසුබිම සකසා ගැනීම.
- පිට පළාත් වෙත පුහුණු පාඨමාලා රැගෙන යාම.
- Online තාක්ෂණය ඔස්සේ පවත්වනු ලබන වැඩසටහන් වැඩි කිරීම.
- අලෙවිකරණ උපායමාර්ග ප්‍රවර්ධනය කිරීම.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය මගින් 2024 වර්ෂය සඳහා සැලසුම් කර ඇති වැඩසටහන් අතර පහත දැක්වෙන වැඩසටහන් වැදගත් වේ.

- වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තරුණ වෘත්තිකයන් සඳහා ආරක්ෂාව සහ යාන්ත්‍රික ඉංජිනේරු වෘත්තිකයන් ලෙස කොරියාවේ විදේශ උපාධි අවස්ථා විවෘත කිරීම.
- ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය විසින් කර්මාන්ත සඳහා ලබා දෙන පාරිසරික මෙහෙයුම් හා අධීක්ෂණ සේවා පුළුල් කිරීම.
- විගමණික සේවකයින් සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව හඳුන්වා දීම.
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ කර්මාන්තකරුවන් සඳහා පුහුණු අවස්ථා පුළුල් කිරීම.
- කාර්මික සේවකයින් සඳහා දෘෂ්ඨී පරීක්ෂා කිරීමේ වැඩසටහනක් හඳුන්වා දීම.

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් තම ඉදිරි සැලසුම් ලෙස පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඵලදායිතා සංකල්ප තුලින් සවිබල ගැන්වීම :**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ නායකත්වය මත ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරෙන අතර, වර්තමානයේදී දිවයින පුරා මෙම වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතී. තෝරා ගත් ඵලදායිතා සංකල්ප ව්‍යවසායක ආයතන වෙත හඳුන්වා දී ඇති අතර, මේ තුලින් එම ආයතනයන්හි ආදායම් උත්පාදනය, නාස්තීන් හා වියදම් අවම කිරීම, රැකියා උත්පාදනය, විවිධාංගිකරණය පාදක කරගත් භාණ්ඩ නිෂ්පාදනය යන දෑ වර්ධනය කිරීමට අපේක්ෂිත වේ.

**රාජ්‍ය අංශයේ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම :**
රාජ්‍ය අංශයේ ආයතන වල වැඩිදියුණු විය යුතු ක්‍රියාවලි හඳුනාගෙන, එයට පිලියම් යෙදීම තුලින් මහජනතාව වෙත ප්‍රශස්ත සේවාවක් ලබාදීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක වනු ඇත. කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ නායකත්වය මත ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරෙන අතර, වර්තමානයේදී සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය කරමින් දිවයින පුරා මෙම වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතී. සුදුසු ක්‍රියාවලි හඳුනාග ැනීම, දත්ත එකතු කිරීම හා මැනීම, දත්ත විශ්ලේෂණය, වැඩිදියුණු කිරීම හා සම්මතකරණය යන පියවරයන්ගෙන් සමන්විත SMAIS ක්‍රමවේදයට අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ වනවිට ක්‍රියාවලි 200කට ආසන්න සංඛ්‍යාවක් තෝරාගෙන වැඩිදියුණු කිරීම් සිදුකරමින් පවතින අතර, 2024 වසර තුලදී ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙත අනුයුක්ත එක් ඵලදායිතා සංවර්ධන නිලධාරියෙකු විසින් නව ක්‍රියාවලි 2ක් තෝරාගෙන වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වනවිට සකසමින් පවතී.

පාරදෘශ්‍ය සහ කාර්යක්ෂම ක්‍රියාවලි තුලින් රාජ්‍ය ආයතන පිළිබඳ මහජන විශ්වාසනීයත්වය වර්ධනය කිරීම, මානව හා භෞතික සම්පත් භාවිතය ඉහල නැංවීම හා ප්‍රශස්ත කිරීම, රාජ්‍ය අංශය තුළ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් හා නවෝත්පාදන සංස්කෘතියක් පෝෂණය කිරීම සහ ජාතික සංවර්ධනය සඳහා ශක්තිමත් රාජ්‍ය අංශයක් බිහිකිරීම යන අරමුණු පෙරදැරිව මෙම වැඩසටහන රාජ්‍ය අංශයේ ආයතන තුල ක්‍රියාත්මක වනු ඇත.

**ඵලදායිතා ප්‍රමුඛ සැලැස්මක් (Master Plan on Productivity) සැකසීම:**
ආසියානු ඵලදායිතා සංවිධානයේ මැදිහත්වීම මත කොරියානු සංවර්ධන ආයතනය විසින් (KDI) ශ්‍රී ලංකාව සඳහා ඵලදායිතා ප්‍රමුඛ සැලැස්මක් (Master Plan on Productivity) සැකසීමට එකඟතාවය පලකර ඇත. මේ සඳහා මාර්ගගත ක්‍රමය මගින් සාකච්ඡා වට දෙකක් පවත්වා ඇති අතර, ශ්‍රී ලංකා ආර්ථිකයට ධනාත්මක බලපෑම් ඇතිකරන ආහාර සැකසීම (Food Processing), ධීවර කර්මාන්තය, (Fisheries), සංචාරක කර්මාන්තය (Tourism), සහ ඇඟළුම් කර්මාන්තය (Apparel Sector) යන ක්ෂේත්‍ර මූලික කර ගනිමින් මෙම සැලැස්ම සැකසෙනු ඇත. මේ පිළිබඳව අදාල පාර්ශව දැනුවත් කිරීමේ කටයුතු ඉදිරියේදී සිදුකෙරෙන අතර, අදාල පාර්ශවකරුවන් සමග ඉදිරි කටයුතු සාකච්ඡා කිරීම සඳහා ආසියානු ඵලදායිතා සංවිධානය හා කොරියානු සංවර්ධන ආයතනයට අයත් නියෝජිත කණ්ඩායමක් මාර්තු මස 4 වන සතිය තුලදී දිවයිනට පැමිණීමට නියමිතය.

**ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ආසියානු ඵලදායිතා සංවිධානයේ සහතික ලත් ආයතනයක් බවට පත්කිරීම (NPS Certification Body Program)፡**

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය වෙත විවිධ ආයතන වෙතින් පුහුණු වැඩසටහන්, ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්, උපදේශන සේවා වැඩසටහන්, විගණන වැඩසටහන් ආදිය පැවැත්වීම සඳහා වාර්ෂිකව ලැබෙන ඉල්ලීම් පිළිබඳ කටයුතු වඩාත් ඵලදායිව ඉටුකිරීම සඳහා ආසියානු ඵලදායිතා සංවිධානයේ සහතික ලත් ආයතනයක් බවට පත්කිරීමට අවශ්‍ය කටයුතු සකස් කිරීම 2023 වසර තුළදී සිදුකරන ලදී. තෝරාගත් කණ්ඩායමක් සඳහා ආසියානු ඵලදායිතා සංවිධානයේ සම්පත් දායකත්වය යටතේ න්‍යායාත්මක හා ප්‍රායෝගික දේශන ඇතුලත් වැඩසටහන් ක්‍රියාත්මක වන අතර, මෙහි පළමු වැඩසටහන 2023 වසරේ පෙබරවාරි මස 20 වන දින ආරම්භ කරන ලදී. මෙම තෝරාගත් කණ්ඩායම ආසියානු ඵලදායිතා සංවිධානයේ සහතික ලත් ඵලදායිතා විශේෂඥයින් ලෙස ඉදිරියේදී කටයුතු කරනු ඇත.

## 2.2.2. විදේශ රැකියා ක්ෂේත්‍රය

විදේශ රැකියා ක්ෂේත්‍රයේ වර්තමාන ප්‍රවණතාවයන්ට අනුකූල වන පරිදි මෙරට නීතිමය හා ප්‍රතිපත්තිමය රාමුව සකස් කළ යුතු වේ. ඒ සඳහා වන මූලික ප්‍රතිපත්තිමය තීරණ මේ වන විට ගෙන ඇති අතර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී.

රැකියා සඳහා විගමණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව පළාත් සහ දිස්ත්‍රික් මට්ටම් ඉලක්ක කර ගනිමින් පුළුල් දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා පැවැත්වීමට සැලසුම් කර ඇත.

විගමණික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කරමින් ආරක්ෂිත, ක්‍රමවත් සහ විධිමත් සංක්‍රමණ ක්‍රියාවලීන් සඳහා පහසුකම් සැලසීමට තවදුරටත් බලාපොරොත්තු වේ.

තවද, අතරමැදියන් නියාමනය කිරීම සහ සංක්‍රමණික සේවකයින් සවිබල ගැන්වීම අරමුණු කර ගෙන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ  පනතට සංශෝධනය කරමින් පවතී.

නීතිමය ප්‍රතිසංස්කරණවලට අමතරව, විගමණික ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයිතීන් සහ යහපැවැත්ම සුරක්ෂිත කෙරෙන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට, ඵලදායී විදේශ රැකියා සඳහා හිතකර පරිසරයක් ඇති කිරීමට තව දුරටත් අවශ්‍ය පියවර ගැනීමට නියමිතය

### i. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය

විදේශ රැකියා ක්ෂේත්‍රයේ වර්ධනය, ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ වෙනස්වීම්වලට අනුගත වන පරිදි විදේශ රැකියා ක්ෂේත්‍රය විධිමත් කිරීම, පවතින නෛතික රාමුව ශක්තිමත් කිරීම, ජාත්‍යන්තර බැඳීම්වලට අනුගත වීම සඳහා සහ දේශීය වශයෙන් නීති ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

### ii. විගමනික ශ්‍රමිකයින් එතෙර රැකියාවෙන් උපයන මුදල් නීත්‍යානුකුල මාර්ග ඔස්සේ මෙරටට ප්‍රේෂණය කිරීම දිරි ගැන්වීම

- **විදේශ ප්‍රේෂණ මත පදනම්ව බහුවිධ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම**
  විගමනික ශ්‍රමිකයන් විසින් එවන ලද ප්‍රේෂණ ප්‍රමාණය මත පදනම්ව රු. මි. 2 දක්වා උපරිමයකට යටත්ව සහනදායී පොළී අනුපාතිකයක් යටතේ ණය ලබා ගැනීමේ පහසුකම සලසා දීමට අපේක්ෂිතය. මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හා මෙරට බැංකු පද්ධතියේ සම්බන්ධීකරණයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

- **විදේශ ප්‍රේෂණ මත පදනම්ව අතිරේක තීරු බදු දීමනාවක් ලබා දීම**
  විගමනික ශ්‍රමිකයන්, නැවත මෙරටට පැමිණෙන අවස්ථාවන්හි දී ගුවන් තොටුපළ තීරු බදු රහිත සාප්පු සංකීර්ණයේදී මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා විදේශගත වී සිටින කාල සීමාව

පදනම් කරගෙන දැනට දෙනු ලබන තීරු බදු දීමනාවට අමතරව ඔවුන් එවන විදේශ විනිමය ප්‍රේෂණ ප්‍රමාණය මත පදනම්ව අතිරේක තීරු බදු දීමනාවක් ලබා දීම. මේ සඳහා චක්‍රලේඛ ප්‍රතිපාදන ඇති කර ඇති අතර පුළුල් දැනුවත් කිරීමක් සිදු කළ යුතු වේ.

### iii. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඩිජිටල්කරණය කිරීම

ශ්‍රී ලංකා රජයට ශූන්‍ය පිරිවැයක් යටතේ යටතේ ශ්‍රී ලංකා ඒකාබද්ධ විදේශ ස්ථානගත කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර එහිදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මුහුණ දෙන පහත සඳහන් අභියෝගයන් ආමන්ත්‍රණය කිරීමට අපේක්ෂිතය.

- විගමනික ශ්‍රමිකයන් සූරා කෑම සහ අපයෝජනය කිරීම
- මිනිස් ජාවාරම
- නීති විරෝධී බඳවා ගැනීමේ පිළිවෙත්
- බඳවා ගැනීමේ නියෝජිතයන් හා නියෝජිතායතන නිරීක්ෂණය සඳහා නිසි ක්‍රමවේදයක් නොමැතිකම
- අනුමත ක්‍රියාවලියේ ප්‍රමාදයන්
- නීති විරෝධී ප්‍රේෂණ ගැටලු
- විගමණික ශ්‍රමිකයන් සේවා යෝජකයන්, අනෙකුත් පාර්ශවකරුවන්ගේ සමස්ත ක්‍රියාවලිය සහ ගමන නිරීක්ෂණය කිරීම සඳහා තනි මාර්ගගත වේදිකාවක් නොමැතිකම

මේ තුළින් විගමනික ශ්‍රමිකයෙකුගේ හා සියලුම පාර්ශවකරුවන් හෝ සමස්ත ක්‍රියාවලීන් සහ සම්පූර්ණ ගමන කළමනාකරණය හා නියාමනය සඳහා ඩිජිටල් වේදිකාවක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

### iv. ශ්‍රමික ප්‍රේෂණ වැඩි වශයෙන් රට තුළට ගෙන්වා ගැනීම

මේ සඳහා විදේශ රැකියා සඳහා නව රටවල් / ගමනාන්ත සොයා යාමක් සිදු විය යුතු අතර දියුණු රටවල්වල හෙද සේවය සහ වැඩිහිටි සත්කාර සේවය සඳහා වැඩි ප්‍රවණතාවක් ඇති වී තිබේන අතර ඒ අනුව නව රටවල් හා නව ක්ෂේත්‍ර හඳුනා ගැනීමට කටයුතු කිරීම.

2024 වසර තුළ ගමනාන්ත රටවල් 04ක් සමඟ නව අවබෝධතා ගිවිසුම් 04ක් (අළුත් කිරීම් ද ඇතුළුව) අත්සන් කිරීමට යෝජිතය.

රැකියා සඳහා සංක්‍රමණය වන ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂාව සහ සුභසාධනය සඳහා අමාත්‍යාංශය විසින් දැනට ක්‍රියාත්මක කරමින් පවතින පවුල් සංවර්ධන සැලසුම් හා රැකවරණ සැලසුම් යනාදි වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කරමින් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ එලදායි සහ සුරක්ෂිත සංක්‍රමණය පිළිබඳව ප්‍රාදේශීය මට්ටමේදී  දැනුවත් කිරීමේ කටයුතු පුළුල් කිරීම රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා මෙම ප්‍රතිපත්තියට අදාළ වන රැකියා සඳහා විගමනය පිළිබඳ ජාතික උපදේශක කමිටුවේ කමිටු රැස්වීම් පැවැත්වීම හා දිස්ත්‍රික් කමිටු පිහිටු වීම.

මෙම අමාත්‍යාංශය මඟින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනියුක්තව සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) ගේ හැකියා වර්ධනය කිරීම තුළින් ක්ෂේත්‍ර මට්ටමින් විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා යොදවා ගැනීම ශක්තිමත් කිරීම.

අදාළ අනෙකුත් අමාත්‍යාංශ හා ආයතනවල සහයෝගය ලබා ගනිමින් නැවත පැමිණෙන විගමනික ශ්‍රමිකයන් දේශිය ශ්‍රම වෙළඳපලට ඒකාබද්ධ කිරීම සඳහා දැනට පවතින ක්‍රමවේදය ශක්තිමත් කිරීම.

ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම  මඟින් මෙම අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ  මනා සම්බන්ධීකරණයෙන්, රැකියා නිම කර නැවත පැමිණෙන පිරිස් වෙනුවෙන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමෙන් ඒකාබද්ධ යාන්ත්‍රණයක් ඇති කිරීම.

ශ්‍රම විගමනිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සමාජය තුළ සවිබල ගැන්වීම හා ඔවුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප වැඩිදියුණු කිරීම හරහා ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස සමාජගත කිරීම, විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම මඟින් අරමුණු කොට ඇත. මෙහි ආරම්භය වශයෙන් ජාතික මට්ටමේ විගමනික ශ්‍රමික සංගම් සම්මේලනයක් පැවැත්වීම.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සැලසුම් ගත වැඩසටහන් අතර පහත වැඩසටහන් වැදගත් වේ.**

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය එක්ව විගමනික සේවකයින්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුමකට එළඹීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) සහ බලපත්‍රලාභී බැංකු සමඟ විගමනික සේවකයින් සඳහා නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විගමනික සේවකයින්ගේ දූදරුවන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීමේ නියමු ව්‍යාපෘතියක් කරන්දෙණිය සහ කුරුණෑගල ප්‍රදේශයන්හි ආරම්භ කිරීම.
- ලෝක කම්කරු සංවිධානය හා එක්ව ආරක්ෂිත ශ්‍රම සංක්‍රමණ, ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාරක (National Project Coordinator" Safe Labour Migration) සමග සම්බන්ධ වෙමින් විදෙස් ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සඳහා හදිසි මුදා ගැනීමේ ප්‍රතිචාර සැලැස්මක්.(Emergency Evacuation Response Plan)ක්‍රියාත්මක කිරීම.
- රුමේනියාවේ හා ජපානයේ ස්ථාපිත ශ්‍රී ලංකා තානාපති කාර්යාල වල රැකියා හා සුබසාධන අංශ ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය ඉදිරියේදී විදේශ රැකියා සඳහා බඳවාගැනීම් සිදු කිරීම වෙනුවෙන් පහතින් සඳහන් කර ඇති රැකියා ඇණවුම් ප්‍රමාණයන් මෙම ආයතනය වෙත ලැබී ඇති අතර ඒ සඳහා අයදුම්පත් කැඳවමින් සුදුසුකම් සම්පූර්ණ කරන ලද පිරිස් අදාල රැකියා සඳහා විදේශ ගත කිරීම අභියෝගය හා ඉදිරි ඉලක්කය වේ.

**වගුව 2.29** රැකියා ඇණවුම් ප්‍රමාණය (ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය)

| රට | රැකියා කාණ්ඩය | ප්‍රමාණය |
|---|---|---|
| රුසියාව | ප්‍රුකී මැෂින් ක්‍රියාකරු | 50 |
| රුසියාව | කෘෂිකාර්මික සේවක | 50 |
| රුසියාව | කුකුලු ගොවිපල සේවක | 50 |
| සිංගප්පූරුව | සෞඛ්‍යය සේවා සහායක | 30 |
| මෝල්දෝවා | ප්‍රුකී මැෂින් ක්‍රියාකරු | 30 |
| රුමේනියා | පොදු සේවා සහායක | 65 |
| රුමේනියා | වෑද්දුම්කරු,විදුලි කාර්මික, Pizza නිෂ්පාදක | 95 |
| ඊශ්‍රායලය | පෙදරේරු / වඩුකාර්මික / බාබෙන්ඩර් | 510 |
| **එකතුව** | | **880** |



**ආර් පී ඒ විමලවීර**
ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය